# 2015

# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# ANNUAL REPORT

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

இலங்கை அரச மருந்தகக் கூட்டுத்தாபனம்

STATE PHARMACEUTICALS CORPORATION OF SRI LANKA

# වාර්ෂික වාර්තාව - 2015

# අන්තර්ගතය


- අපගේ දර්ශනය, මෙහෙවර, පරමාර්ථ සහ අපගේ පාඨය 01
- ප්‍රතිඵල සාරාංශය 02
- අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික තොරතුරු 03 - 04
- කළමනාකාර මණ්ඩලය 05 - 07
- සභාපතිතුමාගේ ප්‍රකාශය 08
- කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ ප්‍රකාශය 09 - 11
- අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 12 - 13
- විගණන කමිටු වාර්තාව 14
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 15
- ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 16
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 17
- ඔසුසල ආදායම් ප්‍රකාශනය 18 - 20
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 21
- ගිණුම්කරණ ප්‍රතිපත්ති 22 - 27
- ගිණුම් සඳහා සටහන් 28 - 51
- විගණකාධිපතිගේ වාර්තාව 52 - 64
- විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධව සභාපතිතුමාගේ අදහස් දැක්වීම 65 - 74
- මානව සම්පත් විශ්ලේෂණය 75
- ආදායම් වාර්තාව සම්බන්ධ වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 76
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සම්බන්ධ වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 77
- විකුණුම් ජාලය 78

## අපගේ දර්ශනය

නීරෝගී ජාතියක් ගොඩනැංවීමේ ප්‍රධාන සහකරු බවට පත්වීම

## අපගේ මෙහෙවර

උසස් තත්ත්වය සහතික කල ආරක්ෂාකාරී හා ප්‍රතිඵලදායක ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සාධාරණ මිලට සපයා ජනතාවට සේවා සපයන ප්‍රධාන ආයතනය බවට පත්වෙමින් ඖෂධීය නාමයෙන් යුතු ඖෂධ භාවිතය ප්‍රවර්ධනය කිරීම

## අපගේ පරමාර්ථ

ජනතා සේවයට ප්‍රමුඛතාවය

ගුණාත්මක බව හා ආරක්ෂාව

අසමසම අවංක භාවය

විශ්වාසදායක හවුල්කරු සහ ක්‍රියාකාරී සාමාජිකයෙකු වීම

විශිෂ්ඨ කාර්යසාධනය සඳහා බැඳීම

අවශ්‍යතා හඳුනාගැනීම

## අපගේ පාඨය

**ඔබේ සුවසෙත අපේ පැතුමයි**

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## ප්‍රතිඵල සාරාංශය

| විස්තරය | 2015<br>Rs: ' 000 ' | 2014<br>Rs: ' 000 ' | විචලනය<br>(%) | 2013<br>Rs: ' 000 ' |
|---|---|---|---|---|
| රාජ්‍ය ඖෂධ සංස්ථාවේ විකුණුම් | 5,286,876 | 4,865,151 | 8.7 | 4,320,300 |
| රාජ්‍ය බෙහෙත් ගබඩාවට කල සැපයුම් | 19,176,807 | 17,269,008 | 11.0 | 16,815,666 |
| **මුළු ආදායම** | **24,463,683** | **22,134,159** | **10.5** | **21,135,966** |
| දළ වෙළඳ ලාභය - රා.ඖ.සං | 1,410,722 | 1,247,074 | 13.1 | 1,136,403 |
| දළ අතිරික්තය - රා.බෙ.ග | 1,386,731 | 1,333,198 | 4 | 1,185,004 |
| **දළ අතිරික්තය** | **2,797,453** | **2,580,272** | **8.4** | **2,321,407** |
| වෙනත් ආදායම් | 51,259 | 25,738 | 99.2 | 17,537 |
| පරිපාලන වියදම් | (1,057,970) | (969,744) | (9.1) | (786,904) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (563,357) | (749,825) | 24.9 | (791,794) |
| මූල්‍ය පිරිවැය | (1,600) | (124) | (1,190.3) | (227) |
| බැංකු අයිරා පොළී | (734) | (149,659) | 99.5 | (1,384) |
| මූල්‍ය ආදායම් | 5,086 | 4,896 | 3.9 | 4,357 |
| **බදු ගෙවීමට පෙර ලාභය** | **1,230,137** | **741,554** | **65.9** | **762,993** |
| විශ්‍රාමික පාරිතෝෂික | 239,887 | (212,044) | 213.1 | (31,573) |
| බදු ගෙවීම් | (610,539) | (192,145) | 217.7 | (320,008) |
| එකතු විස්තීරණ ආදායම | **859,485** | **337,365** | **154.8** | **411,412** |
| භාණ්ඩාගාර අයබදු/ලාභාංශ | **(100,000)** | **(75,000)** | **(33.3)** | **(50,000)** |
| රඳවාගත් ලාභ | 5,022,870 | 4,263,205 | 17.8 | 4,008,164 |
| කොටස් ප්‍රාග්ධනය හා සංචිත | 125,117 | 125,117 | - | 125,117 |
| ජංගම නොවන වත්කම් | 2,156,615 | 2,138,973 | 0.8 | 1,858,832 |
| ජංගම වත්කම් | 7,027,468 | 5,129,323 | 37 | 12,627,902 |
| ජංගම නොවන වගකීම් | 233,394 | 372,219 | 37.3 | 158,803 |
| ජංගම වගකීම් | 3,802,703 | 2,507,754 | (51.6) | 10,194,650 |
| ශුද්ධ ජංගම වත්කම් | 3,224,765 | 2,621,569 | 23 | 2,433,252 |
| **මූලික අනුපාත** | | | | |
| දළ ලාභ අනුපාතය (%) රා.ඖ.සං | 26.7 | 25.6 | | 26.3 |
| දළ ලාභ අනුපාතය (%) රා.බෙ.ග | 7.2 | 7.7 | | 7.1 |
| දළ අතිරික්තයට විකුණුම් අනුපාතය (%) | 11.4 | 11.7 | | 11 |
| යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ (%) | 22.9 | 18.7 | | 17.8 |
| පොළී ආවරණය (වාර) | 1,677 | 5.95 | | 552.3 |
| ස්කන්ධයට මුළු වත්කම් අනුපාතය (%) | 1:1.7 | 1:1.6 | | 1:3.5 |
| යෙදවූ ප්‍රාග්ධනයට විකුණුම් (වාර) | 4.55:1 | 4.65:1 | | 4.92:1 |
| ජංගම අනුපාතය (වාර) | 1:1.85 | 1:2.05 | | 1:1.2 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර) | 1:1.23 | 1:1.5 | | 1:1.07 |
| තොග පිරිවැටුම් අනුපාතය (වාර) | 2.68 | 2.85 | | 2.6 |
| වෙනත් තොරතුරු | | | | |
| සේවක සංඛ්‍යාව – | 862 | 849 | | 817 |
| සේවකයෙකුගේ ඉපයීම (රු) - | 1,427 | 873 | | 951 |
| සේවකයෙකුට විකුණුම් (රු) | 28,380 | 26,071 | | 25,870 |

# අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික තොරතුරු

## අධ්‍යක්ෂ මණ්ඩලය

### සරත් ලියනගේ මහතා - සභාපති

සරත් ලියනගේ මහතා වසර 30ක පළපුරුද්දක් ඇති නීතිවේදියෙකු හා දිවුරුම් කොමසාරිස්වරයෙකු වේ. ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා වූ සියළුම අධිකරණ වල පෙනී සිට ඇති ඔහු ජෙනරල් කොබ්බෑකඩුව හා විජය විමලරත්න අනතුරට ලක්වූ කයිට්ස් හි නැවත පිපිරීමක් ඇති කර පරීක්ෂා කිරීමට පත්කරනු ලැබූ විශේෂ ජනාධිපති කොමිසම වෙනුවෙන් මුල සිට පෙනී සිට ඇති අතර ලන්ඩනයේ පොදුරාජ්‍ය මණ්ඩල ශාලාවේ රැස්වූ අග්‍රවිනිශ්චයකාරවරු දෙදෙනෙකුගෙන් හා නයිට්වරයෙකුගෙන් සමන්විත ජාත්‍යන්තර කොමිසමක මුල සිට පෙනී සිට ඇත.

විධායක අධ්‍යක්ෂ හා සභාපති ලෙස රජයේ ආයතන ගණනාවක පළපුරුද්ද ඇති ඔහු ප්‍රසිද්ධ සමාගම් සමූහයක නීති උපදේශක ලෙසත් සමාගම් අධ්‍යක්ෂවරයෙකු ලෙසත් කටයුතු කර ඇත.

දේශපාලන නොවන සංවිධානයක් වන ලංකාවේ දුප්පතුන් වෙනුවෙන් වූ PME අරමුදලේ සභාපතිවරයා ලෙස ශ්‍රී ලංකාවේ දුප්පත් ජනතාව වෙනුවෙන් කටයුතු කරයි.

සරත් ලියනගේ මහතා 2015 ජනවාරි මස  සිට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති වරයා ලෙස කටයුතු කරයි.

### ආචාර්ය එම්. එච්. එම්. රූමි - කළමනාකාර අධ්‍යක්‍ෂ

ආචාර්ය එම්. එච්. එම්. රූමි මහතා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂයෙන් පරිගණක, පරිගණක පද්ධති හා පරිගණක ජාල පිළිබඳව යුක්රේනයේ තාක්ෂණික විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිධාරයෙකු හා විද්‍යාපති උපාධිධාරියෙකි. ඔහු යුක්රේන ජාතික තාක්ෂණික විශ්වවිද්‍යාලයේ ආධුනික කථිකාචාර්ය වරයෙකු ලෙස පත්කර තිබූ අතර දර්ගා නගරයේ අලිප් ජාත්‍යාන්තර පාසැලේ ස්වේච්චා අධ්‍යක්ෂ වරයෙක් ලෙසද දායක වී ඇත.

ආචාර්ය එම්. එච්. එම්. රූමි මහතාට වසර දහයකට වඩා කළමනාකරණ පළපුරුද්දක් ඇති අතර දැනට සිලෝන් ටී ලෑන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ්, රෝයල් පැකේජින් සලූෂන් ප්‍රයිවට් ලිමිටඩ්, ට්‍රෙන්ඩි සෙරමික්ස් පුද්ගලික සමාගම, කොන්ට්‍රෝනික්ස් ලංකා පුද්ගලික සමාගම යන සමාගම් වල සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන්ද ස්කිල් එන්ටප්‍රයිස් ආයතනයේ කළමනාකාර හවුල්කරු වශයෙන්ද කටයුතු කරයි.

ආචාර්ය එම්. එච්. එම්. රූමි මහතාට වෙළඳ කටයුතු පිළිබඳ මනා පළපුරුද්දක් ඇති අතර ඔහු ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා අපනයන සංවර්ධන මණ්ඩලය එක්ව ලංකාවේ තේ ප්‍රවර්ධනය වෙනුවෙන් සංවිධානය කල ප්‍රදර්ශන පනහකට වැඩි ප්‍රමාණයකට සිලෝන් ටී ලෑන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙනුවෙන් සහභාගි වී ඇත. ආචාර්ය එම්. එච්. එම්. රූමි මහතා 2015 ජනවාරි මස සිට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්‍ෂවරයා ලෙස කටයුතු කරයි.

### මුක්තාර් මරික්කාර් මහතා

මුක්තාර් මරික්කාර් මහතා වෘත්තියෙන් ඉංජිනේරුවරයෙකු වේ. ඔහු එක්සත් රාජධානියේ අලෙවිකරණ ආයතනයේ සාමාජිකයෙක් වන අතර ලංකා වාණිජ මණ්ඩලය, ශීතකරණ සේවා ඉංජිනේරුවරුන්ගේ සංගමය, (Refrigeration Service Engineers Society) හා ඇමරිකාවේ තාපකරණ, ශීතකරණ හා වායු සමීකරණ ඉංජිනේරු සංගමය (American society of Heating, Refrigerating and Air conditioning Engineers Inc.) යන ව්‍යාපාරික හා වෘත්තිය ආයතන ගණනාවක සාමාජිකත්වය දරනු ලබයි. මුක්තාර් මරික්කාර් මහතා 2015 මාර්තු මස රාජ්‍ය ඖෂධ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කර එවන ලදී. ෆොරස්ට්එයා සමූහ සමාගමේ (Frostaire) ආරම්භක සභාපතිවරයා වන ඔහු 1980 වසරේ සිට වේ දක්වා එහි කටයුතු මෙහෙයවයි. ෆොරස්ට්එයා පැනල්ස් පුද්ගලික සමාගම, මල්වාන ස්ප්‍රින් පුද්ගලික සමාගම, ප්‍රාදේශිය සංවර්ධන බැංකුව, පෑන් ඒෂියා බැංකුව යන ආයතන වල අධ්‍යක්ෂ වරයෙකු ලෙස කටයුතු කරන අතර ඔහු රූපවාහිණී සංස්ථාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ඇතුළුව රාජ්‍ය හා පෞද්ගලික ආයතන ගණනාවක අධ්‍යක්ෂ වරයෙක් ලෙස විටින් විට කටයුතු කර ඇත. මුක්තාර් මරික්කාර් මහතා ශ්‍රී ලංකාවේ ටියුනිෂියා ජනරජයේ ගරු කොන්සල් ජෙනරාල් වරයා ලෙස 2001 වර්ෂයේ සිට කටයුතු කරයි.

### ආර්. එම්. දමිතා කුමාරි රත්නායක මහත්මිය

දමිතා රත්නායක මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබද උපාධිධාරිනියක් වන අතර කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික සංවර්ධනය පිළිබඳ  ඩිප්ලෝමාධාරිනියකි. දමිතා රත්නායක මහත්මිය දැනට මුදල් අමාතයංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කරයි. ඇය 2015 අප්‍රේල් මස සිට රාජ්‍ය ඖෂධ සංස්ථාවේ අධ්‍යක්ෂවරියක් ලෙස කටයුතු කරන අතර ඇය ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගමේ සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවකි. ද තා රත්නායක මහත්මිය වයඹ සංවර්ධන බැංකුව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා ශ්‍රී ලංකා කාබන් අරමුදල යන ව්‍යවස්ථාපිත ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙසද කටයුතු කර ඇත.

### වෛද්‍ය  ආර්. ආර්. එම්. එල්. ආර්. සියඹලාගොඩ

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය (MBBS) ට අමතරව වෛද්‍ය සියඹලාගොඩ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පරිපාලනය පිළිබඳ උසස් උපාධිධාරියෙකු හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ප්‍රජා පෝෂණය පිළිබඳ දර්ශනවේදි උපාධිධාරියෙකු ද වේ. දැනට ඔහු සෞඛ්‍ය පෝෂණ සහ දේශිය වෛද්‍ය අමාත්‍යංශයේ අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) සහ නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජෙනරාල් (මහජන සෞඛ්‍ය සේවා) ලෙස කටයුතු කරයි. ප්‍රධාන වෛද්‍ය නිලධාරීවරයා ලෙස කුරුණෑගල මහ රෝහලේ හා මාතෘ හා ළමා සෞඛ්‍ය පිළිබඳ පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් කටයුතු කර ඇත. මෙයට අමතරව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ධුරය දරමින් ගම්පොල, හිඟුරක්ගොඩ හා පොළොන්නරුව ප්‍රදේශවල ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා ලෙස කටයුතු කරන ලදි.

පේරාදෙණිය ශික්ෂණ රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස හා මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අධ්‍යක්ෂවරයෙක් ලෙසත් වෛද්‍ය සියඹලාගොඩ මහතා කටයුතු කර ඇත.

### වෛද්‍ය බී. ජී. එන්. රත්නසේන

F.R.C.S England,  MS( Surgery), and M.B.B.S (Ceylon)

වෛද්‍ය බී. ජී. එන්. රත්නසේන මහතා ජාතික රෝහලේ විශේෂඥ ශල්‍ය වෛද්‍ය වරයෙකු වේ. ඔහු එංගලන්ත රාජකීය ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය හි විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයෙක් වන අතර ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමයේ හිටපු සභාපති වරයාද වේ. විශේෂඥ වෛද්‍ය සංගමයේ සභාපතිවරයා මෙන්ම ශල්‍යකර්ම අධ්‍යයන මණ්ඩලයේ හා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශාස්ත්‍රිය අධ්‍යයන හා විනය කමිටුවේ ද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ කමිටු සාමාජිකයෙක් ලෙස ද ක්‍රියා කරයි.

2014 ජනවාරි මස වෛද්‍ය රත්නසේන මහතා විසින් සිදුකරන ලද විශිෂ්ඨ පර්යේෂණ කටයුතු වෙනුවෙන් ඔහු ජනාධිපති සම්මානයෙන් පිදුම් ලබන ලදි.

### ආර්. පුෂ්පකුමාර ද සොයිසා මහතා

ආර්. පුෂ්පකුමාර ද සොයිසා මහතා 1988 සිට 2004 දක්වා වසර 14ක් දකුණු පළාත් සභා මන්ත්‍රී වරයෙක් ලෙස කටයුතු කර ඇත. ඔහු ව්‍යාපාර කළමනාකරනය (ICBT) හා මානව සම්පත් කළමනාකරණය (IPM) ඩිප්ලොමාධාරියෙකු වේ. පුෂ්පකුමාර ද සොයිසා මහතා South Gate College International ආයතනයේ සභාපතිවරයා වන අතර අකුරල රීෆ් ගාඩන් හෝටලයේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසද මතුගම වැවිලි සමාගමේ අධ්‍යක්ෂ වරයෙකු ලෙසද කටයුතු කර ඇත. ඔහු 2015 අප්‍රේල් මස සිට රාජ්‍ය ඖෂධ සංස්ථාවේ අධ්‍යක්ෂ වරයෙක් ලෙස කටයුතු කරයි.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## ආයතනික තොරතුරු

### අධ්‍යක්ෂ මණ්ඩලය

| | | |
|---|---|---|
| සරත් ලියනගේ මහතා | සභාපති | (2015.01.27 සිට) |
| මහාචාර්ය එස්. ඩී. ජයරත්න | සභාපති | (2015.01.09 දක්වා) |
| ආචාර්ය එම්. එච්. එම්. රූමි | කළමනාකාර අධ්‍යක්ෂ | (2015.01.27 සිට) |
| ආර්. එල්. ධර්මතිලක මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | (2015.01.09 දක්වා) |
| වෛද්‍ය ආර්. ආර්. එම්. එල්. ආර්. සියඹලාගොඩ | අධ්‍යක්ෂ | (2015.04.29 සිට) |
| මුක්තාර් මරික්කාර් මහතා | අධ්‍යක්ෂ | (2015.03.02 සිට) |
| වෛද්‍ය බී. පී. එන්. රත්නසේන | අධ්‍යක්ෂ | (2015.04.29 සිට) |
| ආර්. පුෂ්පකුමාර ද සොයිසා මහතා | අධ්‍යක්ෂ | (2015.04.29 සිට) |
| දමිතා රත්නායක මහත්මිය | අධ්‍යක්ෂ | (2015.04.15 සිට 2015.12.30 දක්වා) |
| වෛද්‍ය පී. පී. මහිපාල | අධ්‍යක්ෂ | (2015.01.09 දක්වා) |
| මහාචාර්ය රංජනී ගමගේ මහත්මිය | අධ්‍යක්ෂ | (2015.01.09 දක්වා) |
| මර්වින් ගුණසේන මහතා | අධ්‍යක්ෂ | (2015.01.09 දක්වා) |
| ලලිත් සේනානායක මහතා | අධ්‍යක්ෂ | (2015.01.09 දක්වා) |

### විගණන කමිටුව

| | | |
|---|---|---|
| දමිතා රත්නායක මහත්මිය | සභාපති | (2015.12.30 දක්වා) |
| වෛද්‍ය ආර්. ආර්. එම්. එල්. ආර්. සියඹලාගොඩ | අධ්‍යක්ෂ | (2015.04.29 සිට) |
| මුක්තාර් මරික්කාර් මහතා | අධ්‍යක්ෂ | (2015.01.27 සිට) |

**විගණකවරු** විගණකාධිපතිතුමා, විගණකාධිපති දෙපාර්තමේන්තුව, අංක. 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල

### බැංකු කරුවෝ

**ලංකා බැංකුව** ආයතනික ශාඛාව, ලංකා බැංකු මාවත, කොළඹ 01

**මහජන බැංකුව** ජාත්‍යන්තර අංශය, තැ.පෙ. 437 ඒ. එන්. සී. එල්. ගොඩනැගිල්ල, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

**ස්ටැන්ඩර්ඩ් චාටඩ් බැංකුව** තැ.පෙ. 112, 37 යෝර්ක් වීදිය, කොළඹ 01.

**කොමර්ෂල් බැංකුව** නගර ශාඛාව, 98 යෝර්ක් වීදිය, කොළඹ 01.

**ලියාපදිංචි කාර්යාලය** **නො 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.**

**සංස්ථාපනය කල දිනය** **1971 සැප්තැම්බර් 22.**

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## කළමනාකරණ මණ්ඩලය

### කේ. එම්. ඩී. ආර්. දසනායක මහතා - සාමාන්‍යාධිකාරී



දිනූෂ දසනායක මහතා කළමනාකාර අභ්‍යාස ලාභියෙකු ලෙස 1999 දෙසැම්බර් 01 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ අතර 2009 ජුනි මස 01 වන දින සිට මේ වන තෙක් සාමාන්‍යාධිකාරී ධුරය උසුලයි. දිනූෂ දසනායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජවේදි ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ගෞරව උපාධිධාරියෙකි. ජපානයේ නගෝයා විශ්ව විද්‍යාලයේ ජාත්‍යාන්තර සහයෝගිතාව පිළිබඳ ශාස්ත්‍රපතියෙකු වන ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකි. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනයේ ජාත්‍යාන්තර වෙළඳ නීතිය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාධාරියෙකි. ඔහු බලයලත් වාණිජ සමථකරුවෙකු වශයෙන්ද සුදුසුකම් ලබා ඇත.

### එම්. පී. කුරුප්පු මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තාක්‍ෂණ, රසායනාගාර හා නිෂ්පාදන



මධුර කුරුප්පු මහතා තාක්‍ෂණ, රසායනාගාර හා නිෂ්පාදන කළමනාකරු ලෙස 1997 වසරේ දි රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ අතර මේ වන විට තාක්‍ෂණ, රසායනාගාර හා නිෂ්පාදන අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ලෙස කටයුතු කරයි. ඔහු මෙම අංශයේ ප්‍රධානියා විමට පෙර 2006 සිට 2014 වන තෙක් අලෙවි අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරන ලදි. රජයේ හා පෞද්ගලික අංශයේ නිෂ්පාදන, තත්ත්ව පාලන, කළමනාකරණ හා වෙළඳ යන ක්ෂේත්‍රයන්හි වසර 36 ක පළපුරුද්දක් ඇති ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාවේ දි උපාධිධාරියෙකි. මධුර කුරුප්පු මහතා NIBM ආයතනයේ කාර්මික ඉංජිනේරු ඩිප්ලෝමා පශ්චාත් උපාධිධාරියෙකු වන අතර කොළඹ විශ්ව විද්‍යාලයේ රසායනික විශ්ලේෂණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා උපාධිධාරියෙකි.

### මහින්ද ගමගේ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය



මහින්ද ගමගේ  මහතා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයා ලෙස 2001 පෙබරවාරි 1 වන දින සිට කටයුතු කරන අතර ගිණුම්කරණය, මූල්‍ය කටයුතු, පිරිවැය, කළමනාකරණ ගණකාධිකරණ හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ ක්ෂේත්‍රයන්හි වසර 37 ක පළපුරුද්දක් ඇති වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරයෙකි. (CIMA) ඔහු ඕස්ට්‍රේලියාවේ (CMA) ආයතනයේද සාමාජිකයෙකි. මහින්ද ගමගේ  මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේ දි පශ්චාත් උපාධිධාරියෙකි. (MBA) ඔහු ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ (SLIM) සාමාජිකයෙකු වන අතර ලන්ඩන් වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ ද සාමාජිකයෙකි.

**ඩබ්ලිව්. ඒ. එස්. ඩී. කේ. පෙරේරා මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි**



සුරංගනී පෙරේරා මහත්මිය 1984 සිට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සේවය කරයි. 2004 නොවැම්බර් මස 01 වන දින සිට 2006 ජුනි මස 01 වන දින දක්වා අලෙවි අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස ද කටයුතු කල අතර 2006 ජුනි මස 01 වන දින සිට 2014 අගෝස්තු 01 වන දින දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තාක්ෂණ, රසායනාගාර හා නිෂ්පාදන ලෙස කටයුතු කරන ලදි. 2014 අගෝස්තු 01 වන දින සිට නැවතත් අලෙවි අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරයි. සුරංගනී පෙරේරා මහත්මිය භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරිණියක් වන අතර කළමනාකරණ ඩිප්ලෝමාව, ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව හා ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධිධාරිණියකි. ඇය රජයේ ලියාපදිංචි ඖෂධවේදිනියකි.

**එච්. පී. ඩබ්ලිව්. ධර්මසේන මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සහ පරිපාලන**



එච්. පී. ඩබ්ලිව්. ධර්මසේන මහතා 1982 වසරේ දී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සේවයට බැඳුනු අතර මේවන විට මානව සම්පත් සහ පරිපාලන අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරයි. ධර්මසේන මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රම අධ්‍යාපනවේදී උපධිධාරියෙක් වන අතර කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකි. සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරිත්ව ආයතනයේ  මිලදී ගැනීම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා ධාරියෙකු වන ඔහු ගබඩා කලමනාකරණය පිළිබඳ වසර පහළොවකට වඩා පලපුරුද්ද ඇත්තෙකි.

**පී. කේ. එස්. එස්. කුලසූරිය මහත්මිය - වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී ප්‍රසම්පාදන හා ආනයන**



සුමුදු කුලසූරිය මහත්මිය කළමනාකාර අභ්‍යාස ලාභියෙකු ලෙස 1997 දී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ අතර 2011 අගෝස්තු මස සිට වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ප්‍රසම්පාදන හා ආනයන ලෙස කටයුතු කරයි. ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ  ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරිණියක් වන අතර ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධාරිණියකි. සුමුදු කුලසූරිය මහත්මිය සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරිත්ව ආයතනයේ මිලදී ගැනීම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරිණියක් වන අතර සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරිත්ව ආයතනයේ සාමාජිකාවකි.

**ප්‍රියන්ති දසනායක මහත්මිය - වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී ප්‍රසම්පාදන හා ආනයන (ශල්‍ය උපකරණ)**



ප්‍රියන්ති දසනායක මහත්මිය කළමනාකාර අභ්‍යාස ලාභියෙකු ලෙස 1987 සිට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ අතර 2015 ජූලි මස සිට වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ප්‍රසම්පාදන හා ආනයන ලෙස කටයුතු කරයි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරිණියක් වන ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ උපාධිධාරිණියකි. ප්‍රියන්ති දසනායක මහත්මිය සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරිත්ව ආයතනයේ මිලදී ගැනීම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක් වන අතර සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරිත්ව ආයතනයේ සාමාජිකාවකි.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

### කළමනාකරණ මණ්ඩලය - ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

| | |
|---|---|
| එස්. එම්. ඒ. ඩී. එස්. එච්. සමන්දප්පෙරුම මහත්මිය | කළමනාකරණ ගණකාධිකාරිණී |
| පී. ඩී. ගුණසේකර මහත්මිය | ගණකාධිකාරිණී - ගෙවීම් |
| කේ. ජී. සී. ශාන්තිමාලා මහත්මිය | තාක්ෂණ කළමනාකාරිණී |
| යූ. ලොකුසූරිය මහතා | අභ්‍යන්තර විගණක |
| පී. කේ. විජේරත්න මහත්මිය | තත්ත්ව ආරක්ෂණ රසායනාගාර කළමනාකාරිණී |
| ඩී. පී. අජිත් ලියනගේ මහතා | කළමනාකරු - තොරතුරු පද්ධති |
| එම්. ඒ. වී. අයි. කුමාරසිරි මහතා | ක්ෂේත්‍ර කළමනාකරු - බෙදාහැරීම් පද්ධති සමාලෝචන |
| ඩබ්. යූ. සමරනායක මහතා | කළමනාකරු - ඔසුසල කොළඹ 07 |
| පී. කේ. ආර්. ප්‍රනාන්දු මහතා | වාප්පු කළමනාකරු |
| සී. එස්. විතානගේ මෙනවිය | අලෙවි කළමනාකාරිණී |
| එච්. එච්. පියදිගම මහත්මිය | ගණකාධිකාරිණී - තොග හා මිලකිරීම් |
| ඩී. එන්. දේවසුරේන්ද්‍ර මහත්මිය | ගණකාධිකාරිණී - ආදායම් |
| පී. ඒ. යූ. විජේවර්ධන මහත්මිය | නීති නිළධාරිණී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් |
| පී. එම්. බී. ආර්. සෝමතිලක මහතා | නිෂ්පාදන කළමනාකරු |
| එම්. ඩබ්. පුෂ්පා ජෙනට් මහත්මිය | කළමනාකාරිණී - පරිපාලන (2015-04-01 දින සිට) |
| ඒ. එච්. අල්විස් මහත්මිය | කළමනාකාරිණී - පසු බෙදාහැරීම් කටයුතු |
| එන්. කේ. ඒ. පී. ගුණතිලක මහත්මිය | කළමනාකාරිණී - ප්‍රවර්ධන හා ප්‍රචාරක |
| ජී. ඩී. ජේ. පුෂ්පකුමාර මහතා | කළමනාකරු - ගබඩා හා තොග පාලන |
| ඩබ්. ඒ. එස්. වික්‍රමාරච්චි මහතා | කළමනාකරු - පර්යේෂණ හා නව ව්‍යාපෘති |
| ඒ. පී. හපන්ගම මහතා | ගණකාධිකාරි - මූල්‍ය ගිණුම්කරණ |
| එම්. බී. ජයවර්ධන මහතා | කළමනාකරු - ගබඩා හා තොග පාලන |
| එච්. ඩී. එන්. ආර්. ගුණසේකර මහතා | කළමනාකරු - ඔසුසල කොළඹ 04 |
| ඩී. ආර්. කුරුප්පුමුල්ලගේ මහතා | කළමනාකරු - ඔසුසල කොළඹ 01 |
| එල්. ඩබ්. දමයන්ති මහත්මිය | ගණකාධිකාරිණි - වැටුප් හා වේතන |
| ඩී. කේ. ඒ. පී. දසනායක මහතා | කළමනාකරු - මානව සම්පත් (2015-04-01 දින සිට) |
| එම්. ඒ. එස්. කරුණාරත්න මහත්මිය | ගණකාධිකාරිණි - රාජ්‍ය ඔසුසල |
| කේ. ඩී. එෆ්. එන්. පෙරේරා මහතා | විකුණුම් කළමනාකරු |
| ඩබ්. ජයන්ත මහතා | කළමනාකරු - මධ්‍යම මිලදීගැනීම් ඒකකය (2015-11-02 දින සිට) |
| යූ. වී. පියසේන මහතා | ආනයන - කළමනාකරු (2015-11-02 දින සිට) |

## සභාපතිතුමාගේ ප්‍රකාශනය



ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ 2015 වසරේ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම මහත් ගෞරවයක් සේ සලකමි.

ප්‍රශංසනීය ක්‍රියාකාරීත්වයක් පෙන්වනු ලැබූ 2015 වසර මගේ කළමනාකාරීත්වය යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාව මෙහෙයවනු ලැබූ පළමු වසර ද වේ.

ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ බදු වලට පෙර ලාභය සලකා බලන වර්ෂයේ දී රුපියල් බිලියනයේ සීමාව ඉක්මවා යන ලදී. එය රු මිලියන 1230 ක් වූ අතර 2014 වසරේ බදු පෙර ලාභය වූ රු. මිලියන 741 හා සසඳා බැලීමේ දී 66% ක වර්ධනයක් පෙන්නුම් කරයි.




ප්‍රධාන වශයෙන් රාජ්‍ය ඖෂධ සංස්ථාවේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම් දෙකකි. රජයේ රෝහල් වලට අඛණ්ඩව ඖෂධ හා ශල්‍ය උපකරණ සැපයීම සඳහා රජයේ බෙහෙත් ගබඩාවට ඖෂධ සැපයීමත්, අපේම රාජ්‍ය ඔසුසැල්, බලයලත් වෙළඳුන් හා බෙදාහරින්නන් හරහා විවෘත වෙළඳපොළට සැපයීමත් එම මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ. මෙම අංශ දෙකම සලකා බලන වර්ෂයේ දී සැලකියයුතු වර්ධනයක් වාර්තා කරගෙන ඇත.

අපගේ මෙහෙයුම් වල ප්‍රධාන අරමුණ වනුයේ තත්ත්ව සහතික කල සනීපාරක්ෂක උපකරණ සාධාරණ මිලට මෙරට ජනතාවට සපයා "ජාතියට සේවය සැලසීමයි".

විවෘත වෙළඳපළේ ප්‍රධානතම ඖෂධ ආනයනකරු වීමත්, සාධාරණ අවම මිලක් පවත්වා ගැනීමත්, මඟින් රට පුරා ඖෂධ වල මිල සැහෙන දුරට පාලනය කිරීමට රාජ්‍ය ඖෂධ සංස්ථාවට හැකි වී ඇත.




ලාභ දායක රාජ්‍ය ආයතනයක් ලෙස පවත්වා ගෙන යමින් සලකා බලන වර්ෂයේ දී රාජ්‍ය භාණ්ඩාගාරයට ලාභාංශ ලෙස රුපියල් මිලියන 100 කුත් ආදායම් බදු ලෙස රු. මිලියන 268 කුත් ලබාදීමට අප හට හැකිවිය.

ඖෂධ සංස්ථාවේ අරමුණු හා ඉලක්ක ලඟා කරගැනීම සඳහා ලබාදුන් සහයෝගය හා මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ටත්, විගණකාධිපතිතුමා හා එම නිලධාරීන්ටත්, මුදල් අමාත්‍යංශයේ නිලධාරීන්ටත්, සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂක තුමා හා අධ්‍යක්ෂ මණ්ඩලයටත්, කළමනාකරණයට හා සේවක මණ්ඩලයටත් මාගේ ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාව කරගනිමි.




"ජාතික ඖෂධ ප්‍රතිපත්ති" රටට හඳුන්වා දීමත් සමඟ දිවයිනේ ඖෂධ වල මිල පාලනය පිළිබඳ විශාල කර්තව්‍යක් රාජ්‍ය ඖෂධ සංස්ථාවට පැවරී ඇත.

අපේ බලාපොරොත්තුව හා ප්‍රාර්ථනය වන්නේ ඉදිරියේ දී වඩාත් කැපවී මවුබිම වෙනුවෙන් සේවය කිරීමට හැකි වේවා යන්නයි.



....................................

සරත් ලියනගේ
**සභාපති**

## කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ ප්‍රකාශය



රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2015 වසරේ කාර්යසාධනය පිළිබඳ කළමනාකරණ අධ්‍යක්ෂතුමාගේ වාර්තාව මම සතුටින් ඉදිරිපත් කරමි. සලකා බලන වර්ෂයේ දී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව තත්ත්ව සහතික කළ ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ ජාතියට සැපයීමේ 44 වන වර්ෂය සම්පූර්ණ කරයි.

රජයේ රෝහල් වලට ඖෂධ හා උපකරණ අඛණ්ඩව බෙදාහැරීම සඳහා රජයේ බෙහෙත් ගබඩාවට තත්ත්ව ආරක්ෂිත ඖෂධ හා උපකරණ සපයන එකම ආනයනකරු වන්නේද රාජ්‍ය ඖෂධ සංස්ථාවයි.

## මූල්‍ය කාර්යසාධනය

මෙම වර්ෂයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මෙතෙක් වාර්තා වූ ඉහලම අගය වන රු. මි. 24,463 ක පිරිවැටුමක් වාර්තා කරගෙන ඇත. එය 2014 වසරේ පිරිවැටුම ලෙස වාර්තා වූ රු. මි. 22,134 හා සංසන්දනය කර බලන කල 10.5% ක වර්ධනයකි. සලකා බලන වර්ෂයේ දී. රු. මි. 19,176 ක් වටිනා ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ රජයේ බෙහෙත් ගබඩාවට සපයා තිබුණි. 2014 වසරේ සපයන ලද ඖෂධ වටිනාකම වූ රු. මි. 17,269 හා සමඟ සැසඳීමේ දී මෙය 11% ක වර්ධනයක් වේ.




සමස්ත පිරිවැටුම

රජයේ ඔසුසල ජාලය, වරලත් වෙළඳුන් හා බෙදාහරින්නන් හරහා සිදුකරණු ලබන විවෘත වෙළඳපළ ක්‍රියාකාරකම් තුලින් 2015 වසරේ දී රු. මිලියන 5,286 ක පිරිවැටුමක් වාර්තා කරගන්නා ලදි. මෙය 2014 වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 4,865 ක පිරිවැටුම හා සංසන්දනය කර බලන කල 8.6% ක වර්ධනයකි.

ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ බදු වලට පෙර ලාභය සලකා බලන වර්ෂයේ දී රුපියල් බිලියනයේ සීමාව ඉක්මවා යන ලදි. එය රු මිලියන 1230 ක් වූ අතර 2014 වසරේ බදු පෙර ලාභය වූ රු. මිලියන 741 හා සසඳා බැලීමේ දී 66% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදි. පිරිවැටුමේ වර්ධනයත්, වියදම් පාලනයත් මෙයට ප්‍රධාන වශයෙන් බලපාන ලදි.

2015 වසරේ දී ආදායම් බදු වශයෙන් ගෙවනු ලැබූ (මුදල් පදනමින්) රු. මිලියන 268 ට අමතරව ලාභ ලබන රාජ්‍ය සංස්ථාවක් වශයෙන් රාජ්‍ය භාණ්ඩාගාරයට ලාභාංශ ලෙස රු. මිලියන 100 ක් මෙම වසරේ දී ලබා දෙන ලදි.

## ඖෂධ වෙළඳාම හා ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාව වෛද්‍ය හා වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වී ප්‍රවර්ධන වැඩසටහන් හා වෙළඳ කුටි භාවිතා කරමින් "Rational use of Medicine" යන තේමාව යටතේ ඖෂධීය නාමයෙන් යුතු ඖෂධ භාවිතය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සිදුකරන ලදි.

වර්ෂය අවසාන වන විට දිවයින පුරා රාජ්‍ය ඔසුසල 31ක්, වරලත් ඔසුසල 105ක්, බෙදාහරින්නන් 47ක් හා අනුමත වෙළඳුන් 10 ක් දිවයිනේ ඕනෑම තැනකින් මහජනතාවට "SPC" ඖෂධ ලබාගත හැකි වන පරිදි පිහිටුවාගත් බෙදාහැරීමේ ජාලයක් ඖෂධ සංස්ථාව සතුව තිබුණි.

දැනුවත් කිරීමේ වැඩසටහන්







බෙදාහරින්නන්ගේ සම්මන්ත්‍රණය 2015







තාක්ෂණ හා රසායනාගාරය







සංස්ථාවේ තත්ත්ව රසායනාගාරයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සැමවිට කටයුතු කරයි. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් ගෙන්වා බෙදාහරින සියලුම ඖෂධ වල ගුණාත්මක භාවය සැමවිටම ආරක්ෂා කරගැනීම සඳහා සංස්ථාවේ ඖෂධ අදියර හතරක් යටතේ පරීක්ෂාවට ලක් කරනු ලබයි. එනම් ටෙන්ඩර් නියැදි පරීක්ෂාව, නැව්ගත කිරීමට පෙර ලබාගත් නියැදි පරීක්ෂාව, බෙදාහැරීමට පෙර නියැදි පරීක්ෂාව සහ බෙදාහැරීමෙන් පසු වෙළඳපොල පැමිණිලි මත නියැදි පරීක්ෂාව යි.

## මානව සම්පත් සංවර්ධනය

අපගේ සේවක පාර්ශවයේ අදහස් විමසමින් ඔවුන් සමඟ සුහඳශීලි සම්බන්ධතාවයක් පවත්වා ගන්නා අතරම විවිධ මාතෘකා යටතේ අභ්‍යන්තර හා බාහිර වෘත්තියවේදීන් මඟින් සේවක පුහුණුවීම් සිදු කරයි. සේවකයින් සඳහා සිංහල අළුත් අවුරුදු උත්සවය, වාර්ෂික සුහඳහමුව, වාර්ෂික විනෝද චාරිකාව, ලේ දන්දීමේ ව්‍යාපාරය, වෙසක් උත්සවය වෙනුවෙන් ධර්ම දේශනය ආදි අවස්ථා වාර්ෂිකව සංවිධානය කරයි. කණිෂ්ඨ කළමනාකාර මට්ටමෙන් ඉහල සේවකයින් සඳහා සංස්ථාව විසින් බැහැරගත පුහුණු වැඩසටහනක් (Out Bound Training) සංවිධානය කල අතර එය සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ ඇගයීමට ලක්විය.



වාර්ෂික ලේ දන්දීමේ ව්‍යාපාරය





වාර්ෂික සුහඳහමුව



Out - Bound Traning - කිතුල්ගල

සලකා බලන වර්ෂයේ දී අපගේ ශ්‍රම බලකාය 1006 ක් වූ අතර එයින් 144 දෙනෙක් පුහුණුවන්නන් විය. ආයතනය තුලම ඔවුන්ගේ වෘත්තිය අභිවෘද්ධිය ඇති කරලීම හා ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරලීමේ අරමුණෙන් සේවකයින් 312 දෙනෙකු දේශීය පුහුණු වැඩසටහන් සඳහා ද 8 දෙනෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා ද සහභාගි කරවන ලදි.

| පුහුණු ආකාරය | පුහුණු වැඩසටහන් ගණන | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| දේශීය පුහුණු වැඩසටහන් | 29 | 60 |
| සමූහ පුහුණු වැඩසටහන් | 5 | 252 |
| විදේශ පුහුණු වැඩසටහන් | 5 | 8 |
| **එකතුව** | **39** | **320** |

මෙයට අමතරව 2014 වසරට පෙර සිට සංස්ථාවේ පැවති සියලු සේවක සුභසාධන ප්‍රතිලාභ 2015 වසරේ ද ක්‍රියාත්මක කරන ලදි.

**සංයුක්ත සමාජ සුභසාධන වගකීම**

වෛද්‍ය කඳවුර - කරෙයිනගර්





මහාචාර්ය සේනක බිබිලේ ගුණානුස්මරණ ශිෂ්‍යත්ව වැඩසටහන





අපගේ සමාජ සුභසාධන වගකීමෙහි කොටසක් ලෙස වසර 5 ට අඩු දරුවන්, ගැබිනි මව්වරුන්, වයස 55ට වඩා වැඩි වැඩිහිටියන් මිලදීගන්නා බෙහෙත් වෙනුවෙන් 5% වට්ටමක් ලබාදීම මෙම වසරේත් ක්‍රියාත්මක කරන ලදි. රටේ විවිධ ප්‍රදේශ වල සංවිධානය කරන ලද වෛද්‍ය කඳවුරු ගණනාවක් සඳහා අප විසින් අනුග්‍රහය දක්වන ලදි. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ නිර්මාතෘ මෙන්ම ආරම්භක සභාපතිවරයා වූ මහාචාර්ය සේනක බිබිලේ මහතා සිහිකිරීමක් වශයෙන් අප මහාචාර්ය සේනක බිබිලේ ගුණානුස්මරණ ශිෂ්‍යත්ව, වැඩසටහන තවදුරටත් පවත්වා ගෙන යමින් ලංකා විශ්ව විද්‍යාලයන්හි වෛද්‍ය පීඨ 6 ක ඖෂධ විද්‍යාව (Pharmacology) පිළිබඳව ඉහල දැනුමක් ඇති සිසුන් හට ශිෂ්‍යත්ව ප්‍රධානය කරන ලදි.

## ස්තුතිය පුද කිරීම

මෙම වර්ධනය සහ ලාභදායකත්වය ලබා ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කල සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයටත්, සියලු අංශ වල සේවකයන්ටත් මාගේ අවංක ස්තුතිය පුදකරමි.



..............................................
ආචාර්ය එම්. එච්. එම්. රුමි
**කළමනාකාර අධ්‍යක්ෂ**

## අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරයි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5.1 වගන්තිය ට අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු මස 01 වන දින විගණකාධිපති තුමා වෙත ඉදිරිපත් කරන ලදි.

### ආරම්භය

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වගන්තිය යටතේ අංක 14976/8 දරණ ගැසට් නිවේදනය මඟින් 1971 සැප්තැම්බර් 22 දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට කාර්මික හා විද්‍යා කටයුතු අමාත්‍යතුමාගේ නියෝගය මත රුපියල් මිලියනයක මූලික ප්‍රාග්ධනයකින් යුක්තව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පිහිටුවන ලදි.

### ගණකාධිකරණ ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිටු අංක 22 සිට 27 දක්වා ඉදිරිපත් කර ඇත.

### ප්‍රතිඵල

ප්‍රවර්ථන වසරෙහි මූල්‍ය ප්‍රතිඵල සහ ස්කන්ධය වෙනස් වීම පිළිබඳ දත්ත ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශනය මඟින් අනාවරණය කර ඇත.

### ව්‍යාපාර සමාලෝචනය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය ශේෂ පත්‍රයෙහි දක්වා ඇති අතර ඒ පිළිබඳ ඇගයීමක් කළමනාකාර අධ්‍යක්ෂ තුමාගේ වාර්තාවෙහි ඇතුලත් කර ඇත.

### දේපළ, පිරියත හා උපකරණ

පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ඉඩම් ගොඩනැගිලි සහ මෝටර් වාහන වල වටිනාකම දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්ථන වසරට අදාලව දේපළ, පිරියත හා උපකරණ වල සිදුවූ වෙනස්කම් සටහන් අංක 16 මඟින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙළඳපොල අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවති.

### ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- විවෘත වෙළඳපොල වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.
- සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.
- පිවනි, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සොමේට් ක්‍රීම් නිෂ්පාදනය කිරීම සහ විකිණීම.
- රසායනාගාර පහසුකම් සහ වෛද්‍ය පරීක්ෂණ පහසුකම් සැපයීම.

පසුගිය මූල්‍ය වර්ෂය තුල සංස්ථාවේ ක්‍රියාකාරකම් වල මූලික වෙනස්වීමක් පෙන්නුම් නොකරයි.

### සංචිත

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල සංස්ථාවේ මූල්‍ය සංචිත වල වටිනාකම හා එහි සංයුතිය දක්වා ඇත.

**අධ්‍යක්‍ෂ මණ්ඩලය**

2015 දෙසැම්බර් 31 වන දිනට පත්ව සිටි සංස්ථාවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| සරත් ලියනගේ මහතා | සභාපති | |
| ආචාර්ය එම්. එච්. එම්. රුමි මහතා | කළමනාකාර අධ්‍යක්‍ෂ | |
| වෛද්‍ය ආර්. ආර්. එම්. එල්. ආර් සියඹලාගොඩ මහතා | අධ්‍යක්‍ෂ | |
| මුක්තාර් මරික්කාර් මහතා | අධ්‍යක්‍ෂ | |
| වෛද්‍ය බී. ජී. එන්. රත්නසේන මහතා | අධ්‍යක්‍ෂ | |
| ආර්. පුෂ්පකුමාර ද සොයිසා මහතා | අධ්‍යක්‍ෂ | |
| දමිතා රත්නායක මහත්මිය | අධ්‍යක්‍ෂ | (2015.12.30 දක්වා) |

**විගණන කමිටුව**
රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට (Public Enterprises Guidline) අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත.

**සාංගමික යහපාලනය / අභ්‍යන්තර පාලනය**
ශක්තිමත් සාංගමික යහපාලන මූලධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා සංස්ථාව මඟින් විධික්‍රම හා ක්‍රියාපටිපාටින් ක්‍රියාත්මක කර ඇත. පිටු අංක 14 හි විගණන කමිටු වාර්තාව දක්වා ඇත.

**සේවා නියුක්තිය**
සේවකයන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා යෝග්‍ය වන මානව සම්පත් කළමනාකරණ ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරයි.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**
රජයට සහ සේවකයන් හට ගෙවීමට නියමිත සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් කලට වේලාවට ගෙවා නිමකර ඇත.

**පාරිසරික ආරක්‍ෂාව**
පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත්වී නොමැත.

**රජයට දායකත්වය**
ලාභ ලබන රාජ්‍ය සංස්ථාවක් ලෙස මෙම වසරේදී රුපියල් මිලියන 268 ක් ආදායම් බදු හා භාණ්ඩාගාර අයබදු ලෙස ගෙවා ඇත.

**සංයුක්ත සමාජමය වගකීම**
සමාජමය වගකීම් ලෙස සලකා සංස්ථාව විසින් රු 2,771,230/- ක ප්‍රදානයන් ප්‍රවර්ථන වර්ෂය තුලදී සිදුකර ඇත. මෙයින් රු 618,750/- ක් බදු සහන ලැබීමට සුදුසු රජය අනුමත පුන්‍ය ආයතනයන්ට ලබා දී ඇත.

**ශේෂ පත්‍ර දිනට පසු සිදුවම්**
ශේෂ පත්‍ර දිනට පසු ගිණුම් මඟින් ගැලපීමට හෝ හෙළිදරව් කිරීම සඳහා කිසිදු සිදුවීමක් වාර්තාවී නොමැත.

**විගණකවරු**
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපති තුමා විසින් විගණනය කරන ලදී.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ නියෝග මත

..................................................
අනුරාධා විජයවර්ධන
**නීති නිළධාරිණී/අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්**

# විගණන කමිටුවේ වාර්තාව

## විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකු ඇතුලත්වන අතර කමිටුවේ සභාපතිවරයා ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂවරයා කටයුතු කරයි. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වු ගිණුම් වර්ෂය තුල පහත සාමාජිකයන් විගණන කමිටුවට සහභාගි විය.

| | |
|---|---|
| දමිතා රත්නායක මහත්මිය | විගණන කමිටුවේ සභාපති |
| මුක්තාර් මරික්කාර් මහතා | අධ්‍යක්ෂ |
| වෛද්‍ය ආර්. ආර්. එම්. එල්. ආර් සියඹලාගොඩ මහතා | අධ්‍යක්ෂ |

සෞඛ්‍ය අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරීතුමා හා ඖෂධ නීතිගත සංස්ථාවේ රජයේ විගණන අංශයේ විගණන අධිකාරීතුමිය සමීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගි විය. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්තුමිය හා අභ්‍යන්තර විගණක, විගණන කමිටු ලේකම් හා කැඳවුම්කරු ලෙස පිළිවෙලින් කටයුතු කරන ලදි.

## විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යය වනුයේ සංස්ථාවේ පවත්නා අභ්‍යන්තර පාලන පිළිවෙත් අධීක්ෂණය කිරිම හා සමාලෝචනය කිරිමත්, සංස්ථාවේ විගණන කටයුතු සහ මූල්‍ය කටයුතු පිළිබඳව සමාලෝචනයන් හා නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකිම නිසියාකාරව ඉටු කිරිම සඳහා ඔවුන්ට සහාය විමත් වේ. සමාලෝචිත වර්ෂය තුලදි කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් වල නියැලෙන ලදි.

01. අභ්‍යන්තර විගණන සැලසුම් සමාලෝචනය කිරිම හා අවශ්‍ය අවස්ථාවන්හි අනුමත කිරිමට නිර්දේශ කිරිම.
02. 2015 වසරට අදාල අභ්‍යන්තර විගණන සැලසුම් සමාලෝචනය කිරිම හා අනුමත කිරිම.
03. පැනනැගී ඇති කරුණු වල ස්වභාවයත්, අදාල කරුණු වලට කළමනාකරණයේ ප්‍රතිචාරයන් හා අභ්‍යන්තර විගණකගේ නිර්දේශත් ආවරණය වන ලෙස අභ්‍යන්තර විගණන වාර්තාවන් සමාලෝචනය කිරීම.
04. 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 13(7) (ඒ) සහ 14(2) (සි) වගන්ති ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කර ඇති වාර්තාවන්හි දක්වා ඇති කරුණු සමාලෝචනය කිරිම.
05. රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරිම සමාලෝචනය කිරිම.

## අභ්‍යන්තර විගණන අංශය

විගණන කමිටුවේ මඟපෙන්විම යටතේ, සමාලෝචිත වර්ෂය තුලදි, අනුමත විගණන සැලැස්ම අභ්‍යන්තර විගණන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලදි. තවද අභ්‍යන්තර විගණන අංශයේ පද්ධති හා මූල්‍ය විගණන ක්‍රියා මාර්ග තුලින් අකාර්යක්ෂම පිළිවෙත් බැහැර කිරිමත්, අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරිමත්, පාඩු හා සිදුවිය හැකි වැරදි හා වංචා අවම කර ගැනිමටත් කටයුතු කරන ලදි.

## රැස්වීම්

2015 වර්ෂය තුල විගණන කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදි. එහිදි හඳුනාගන්නා ලද අඩුලුහුඩුකම් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි. එම අඩුලුහුඩුකම් පිළිබඳව ඉදිරිපත් කරන ලද කමිටුවේ අදහස් සැලකිල්ලට ගනිමින් ඒවා නිවැරදි කර ගැනිම සඳහා වන නිසි ක්‍රියා මාර්ග ගැනිමට කළමනාකාරීත්වය කටයුතු කොට ඇත.



..................................................................

වෛද්‍ය ආර්. ආර්. එම්. එල්. ආර් සියඹලාගොඩ - කමිටු සාමාජික

**විගණන කමිටුවේ සභාපති වෙනුවට**

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | 2015<br>රු. | 2014<br>(නැවත ප්‍රකාශිත)<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 16 | 1,981,695,566 | 1,762,626,535 |
| දිගුකාලීන බදු ඉඩම් - රත්මලාන | | 10,200,000 | 10,360,000 |
| නොනිමි වැඩ - ප්‍රාග්ධනය | | 148,598,345 | 309,456,400 |
| අනෙකුත් ජංගම නොවන වත්කම් | 16A | 16,120,702 | 16,775,300 |
| විලම්බිත බදු වත්කම් | 23 | - | 39,754,570 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **2,156,614,613** | **2,138,972,804** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය - රා.ඖ.සං | 17 | 2,364,090,551 | 1,390,608,593 |
| මාර්ගස්ථ තොගය - ර.බෙ.ග | 18 | 788,342,127 | 528,709,760 |
| වෙළඳ හා වෙනත් ණයගැතියෝ | 19 | 3,051,444,605 | 2,370,348,830 |
| පෙරගෙවීම් | 20 | 33,046,449 | 37,964,434 |
| මුදල් සහ බැංකු ශේෂය | 21 | 790,525,341 | 801,716,760 |
| **මුළු ජංගම වත්කම්** | | **7,027,449,074** | **5,129,348,377** |
| **මුළු වත්කම්** | | **9,184,063,687** | **7,268,321,180** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| දායක ප්‍රාග්ධනය | | 59,055,258 | 59,055,258 |
| රඳවාගත් ඉපයුම් | | 5,022,690,364 | 4,263,205,140 |
| පොදු සංචිතය | | 66,061,447 | 66,061,447 |
| **මුළු ස්කන්ධය** | | **5,147,807,069** | **4,388,321,845** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | 22 | 150,917,657 | 372,219,796 |
| විලම්බිත බදු වගකීම | 23 | 82,475,966 | - |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **233,393,624** | **372,219,796** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ | 24 | 3,347,409,968 | 2,250,523,019 |
| ආදායම් බදු බැඳියාව | | 397,758,426 | 177,769,252 |
| විලම්බිත ආදායම් | | 1,005,157 | 748,229 |
| ජංගම මූල්‍ය වගකීම් | 25 | 56,689,443 | 78,739,039 |
| **මුළු ජංගම වගකීම්** | | **3,802,862,994** | **2,507,779,538** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **9,184,063,687** | **7,268,321,180** |

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදි.

| | | | |
|---|---|---|---|
| **සරත් ලියනගේ**<br>**සභාපති** | **වෛද්‍ය එම්. එච්. එම්. රූමි**<br>**කළමනාකරණ අධ්‍යක්ෂ** | **කේ. එම්. ඩී. ආර්. දසනායක**<br>**සාමාන්‍යාධිකාරී** | **මහින්ද ගමගේ**<br>**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල්** |

පිටු අංක 16 සිට 39 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම ගිණුම් වාර්තාව හා සබැඳි අත්‍යාවශ්‍ය කොටස් වේ.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

### 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය රු | පොදු සංචිතය රු | ඒකාබද්ධ ලාභාලාභ ගිණුම රු | එකතුව රු |
|---|---|---|---|---|
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **3,646,754,166** | **3,771,870,871** |
| 2013 ජනවාරි 1 වන දිනට ශේෂය | 59,055,258 | 66,061,447 | 3,646,754,166 | 3,771,870,871 |
| භාණ්ඩාගාර අයබදු ගෙවීම් | | | (50,000,000) | (50,000,000) |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය | | | (31,573,801) | (31,573,801) |
| **අ.** 2011 වසරේ ඇසුරුම් ද්‍රව්‍ය අගය අඩුවෙන් දැක්වීම නිවැරදි කළා (ශුද්ධ) | | | 3,694,447 | 3,694,447 |
| **ආ.** සේවක භාරකාර අරමුදලට අඩුවෙන් දායකත්වය දැක්වීම නිවැරදි කළා (ශුද්ධ) | | | (11,018,220) | (11,018,220) |
| වසරේ ශුද්ධ ලාභය | | | 453,226,391 | 453,226,391 |
| වැරදි නිවැරදි කිරීම සඳහා ගැලපීම - සටහන (අ) | | | (10,242,685) | (10,242,685) |
| නැවත ප්‍රකාශිත ශුද්ධ ලාභය | | | 442,983,706 | 442,983,706 |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **4,000,840,298** | **4,125,957,003** |
| 2014 ජනවාරි 1 වන දිනට ශේෂය | 59,055,258 | 66,061,447 | 4,000,840,298 | 4,125,957,003 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | - |
| වසරේ ශුද්ධ ලාභය | | | 549,409,084 | 549,409,084 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය | | | (212,044,242) | (212,044,242) |
| **රාජ්‍ය භාණ්ඩාගාරය සමඟ ගනුදෙනු** | | | | |
| භාණ්ඩාගාර අයබදු ගෙවීම් | | | (75,000,000) | (75,000,000) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **4,263,205,140** | **4,388,321,845** |
| 2015 ජනවාරි 1 වන දිනට ශේෂය | 59,055,258 | 66,061,447 | 4,263,205,140 | 4,388,321,845 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | - |
| වසරේ ශුද්ධ ලාභය | | | 619,598,174 | 619,598,174 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය | | | 239,887,050 | 239,887,050 |
| **රාජ්‍ය භාණ්ඩාගාරය සමඟ ගනුදෙනු** | | | | - |
| භාණ්ඩාගාර අයබදු ගෙවීම් | | | (100,000,000) | (100,000,000) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **5,022,690,364** | **5,147,807,069** |

**සටහන (අ)**

| | |
|---|---|
| 2014 ගිණුම් නැවත දක්වා පහත දැක්වෙන වැරදි නිවැරදි කරන ලදි. | **රු.** |
| **අ.** 2011 වසරේ ඇසුරුම් ද්‍රව්‍ය අගය අඩුවෙන් දැක්වීම නිවැරදි කළා | (5,131,177) |
| **ආ.** සේවක භාරකාර අරමුදලට අඩුවෙන් දායකත්වය දැක්වීම නිවැරදි කළා | 15,303,084 |
| | 10,171,907 |
| බදු බලපෑම 28% | (2,848,134) |
| ශුද්ධ අගය | **7,323,773** |

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| | සටහන | ක්‍රියාකාරකම් රා.ඖ.ස. රු. | ක්‍රියාකාරකම් රා.බෙ.ග. රු. | මුළු ක්‍රියාකාරකම් 2015 රු. | මුළු ක්‍රියාකාරකම් 2014 රු. |
|---|---|---|---|---|---|
| **ආදායම** | 7 | **5,286,876,339** | **19,176,806,790** | **24,463,683,130** | **22,134,159,628** |
| **එකතු කලා - ඔසුසල වලට මාරු කිරීම්** | | 1,162,217,857 | | 1,162,217,857 | 844,836,472 |
| **අඩු කලා** | | | | | |
| සෑජු වියදම් - රා.බෙ.ග | 8 | | 17,790,075,832 | 17,790,075,832 | 15,935,810,448 |
| විකුණුම් පිරිවැය - රා.ඖ.ස | 9 | 4,971,740,542 | | 4,971,740,542 | 4,403,253,321 |
| නිෂ්පාදන පිරිවැය - පිවනි ඒකකය | 10 | 66,631,913 | | 66,631,913 | 59,193,747 |
| **දළ ලාභය/අතිරික්තය** | | **1,410,721,742** | **1,386,730,958** | **2,797,452,700** | **2,580,738,585** |
| **එකතු කලා - වෙනත් මෙහෙයුම් ආදායම්** | 11 | 51,259,458 | | 51,259,458 | 25,737,839 |
| **අඩු කලා** | | | | | |
| පරිපාලන වියදම් | 12 | 694,267,382 | 363,702,839 | 1,057,970,222 | 969,744,111 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 13 | 191,564,842 | 371,792,358 | 563,357,200 | 750,291,586 |
| **මෙහෙයුම් ලාභය** | | **576,148,976** | **651,235,761** | **1,227,384,737** | **886,440,727** |
| **අඩු කලා - මූල්‍ය වියදම්** | 14 | 2,333,916 | - | 2,333,916 | 149,783,225 |
| **එකතු කලා - මූල්‍ය ආදායම් (සේවක ණය පොලී)** | | 5,086,500 | - | 5,086,500 | 4,896,338 |
| **බදු වලට පෙර ලාභය** | | **578,901,560** | **651,235,761** | **1,230,137,320** | **741,553,839** |
| ආදයම් බදු වියදම | 15 | 287,319,194 | 323,219,952 | 610,539,146 | 192,144,755 |
| **බදු වලට පසු ලාභය** | | **291,582,365** | **328,015,809** | **619,598,174** | **549,409,084** |
| **අනෙකුත් විස්තිරණ ආදායම්** | | | | | |
| පාරිතෝෂික අරමුදලේ අතිරික්තය/ඌනතාව | | 105,550,302 | 134,336,748 | 239,887,050 | (212,044,242) |
| **වසරේ මුළු විස්තිරණ ආදායම** | | **397,132,667** | **462,352,557** | **859,485,224** | **337,364,842** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔසුසල ආදායම් ප්‍රකාශය

| | ඔසුසල වෙළඳාම කොළඹ 07 | ඔසුසල වෙළඳාම කොළඹ 04 | ඔසුසල වෙළඳාම කොළඹ 01 | ඔසුසල වෙළඳාම මහනුවර | ඔසුසල වෙළඳාම නුගේගොඩ | ඔසුසල වෙළඳාම අවිස්සාවේල්ල | ඔසුසල වෙළඳාම රත්නපුර | ඔසුසල වෙළඳාම මිනුවන්ගොඩ | ඔසුසල වෙළඳාම පානදුර | ඔසුසල වෙළඳාම ගාල්ල | ඔසුසල වෙළඳාම මාතර | ඔසුසල වෙළඳාම කුරුණෑගල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| විකුණුම් | 636,383,562 | 434,111,192 | 184,802,317 | 150,869,114 | 88,664,839 | 35,763,541 | 69,346,034 | 26,904,760 | 69,874,323 | 87,750,170 | 65,714,716 | 86,340,111 |
| විකුණුම් පිරිවැය හා මාරු කිරීම් | 532,482,077 | 384,479,649 | 154,026,533 | 121,702,512 | 70,738,513 | 29,265,669 | 56,621,727 | 21,446,787 | 58,252,952 | 71,022,171 | 52,433,658 | 71,950,085 |
| **විකුණුම් හා මාරු කිරීම් මත** | | | | | | | | | | | | |
| **දළ වෙළඳ ලාභය** | **103,901,485** | **49,631,543** | **30,775,785** | **29,166,602** | **17,926,327** | **6,497,872** | **12,724,307** | **5,457,972** | **11,621,371** | **16,727,999** | **13,281,058** | **14,390,026** |
| **ආයතන හා පරිපාලන වියදම්** | | | | | | | | | | | | |
| සේවක පඩි නඩි | 41,804,328 | 16,640,847 | 7,911,089 | 14,819,814 | 11,433,583 | 6,723,750 | 10,971,046 | 5,327,747 | 9,337,296 | 12,009,528 | 9,548,802 | 9,523,288 |
| ගමන් වියදම් | 9,987 | 16,804 | 15,296 | 31,991 | 2,380 | 18,458 | 22,810 | 14,246 | 604 | 5,290 | 8,185 | 6,714 |
| සැපයුම් හා අවශ්‍යතා | 341,018 | 184,666 | 242,174 | 96,886 | 163,336 | 364,646 | 132,705 | 99,472 | 138,972 | 88,868 | 192,929 | 144,273 |
| අලුත්වැඩියා හා නඩත්තු | 652,278 | 874,114 | 55,301 | 185,804 | 179,859 | 160,289 | 143,638 | 19,107 | 138,879 | 213,685 | 81,547 | 116,878 |
| ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා | 12,297,643 | 4,067,141 | 2,515,276 | 4,388,169 | 3,235,986 | 2,197,886 | 3,248,552 | 2,135,186 | 2,901,793 | 3,759,310 | 3,548,253 | 4,525,825 |
| හා වෙනත් සේවා | | | | | | | | | | | | |
| **වෙනත් මෙහෙයුම් වියදම්** | | | | | | | | | | | | |
| විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | 2,454,282 | 388,479 | 116,815 | 714,136 | 480,285 | 158,624 | 670,414 | 174,678 | 231,459 | 339,240 | 307,626 | 215,097 |
| **මුළු පිරිවැය** | **57,559,536** | **22,172,050** | **10,855,951** | **20,236,800** | **15,495,430** | **9,623,653** | **15,189,165** | **7,770,436** | **12,749,003** | **16,415,921** | **13,687,343** | **14,532,075** |
| **ශුද්ධ ලාභය/අලාභය** | **46,341,949** | **27,459,493** | **19,919,834** | **8,929,802** | **2,430,897** | **(3,125,781)** | **(2,464,858)** | **(2,312,463)** | **(1,127,632)** | **312,078** | **(406,284)** | **(142,049)** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔසුසල ආදායම් ප්‍රකාශය

| | ඔසුසල වෙළඳාම අම්පාර | ඔසුසල වෙළඳාම හම්බන්තොට | ඔසුසල වෙළඳාම අනුරාධපුර | ඔසුසල වෙළඳාම මහරගම | ඔසුසල වෙළඳාම ජයවර්ධනපුර | ඔසුසල වෙළඳාම කරාපිටිය | ඔසුසල වෙළඳාම මීගමුව | ඔසුසල වෙළඳාම බදුල්ල | ඔසුසල වෙළඳාම දියතලාව | ඔසුසල වෙළඳාම යාපනය | ඔසුසල වෙළඳාම පොළොන්නරුව | ඔසුසල වෙළඳාම රත්මලාන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| විකුණුම් | 26,793,056 | 24,578,019 | 66,182,828 | 78,198,083 | 138,794,324 | 72,645,133 | 60,067,515 | 60,949,573 | 18,592,962 | 25,230,102 | 53,566,943 | 9,767,769 |
| විකුණුම් පිරිවැය හා මාරු කිරීම් | 21,973,508 | 18,896,359 | 53,195,629 | 64,608,255 | 115,643,323 | 59,485,724 | 49,580,182 | 50,672,270 | 14,998,293 | 21,374,088 | 43,308,131 | 7,630,296 |
| **විකුණුම් හා මාරු කිරීම් මත** | | | | | | | | | | | | |
| **දළ වෙළඳ ලාභය** | **4,819,549** | **5,681,660** | **12,987,199** | **13,589,828** | **23,151,000** | **13,159,409** | **10,487,333** | **10,277,303** | **3,594,670** | **3,856,013** | **10,258,813** | **2,137,473** |
| **ආයතන හා පරිපාලන වියදම්** | | | | | | | | | | | | |
| සේවක පඩි නඩි | 5,179,004 | 5,071,502 | 6,184,339 | 8,444,615 | 18,895,873 | 9,757,376 | 6,869,442 | 6,064,337 | 3,532,804 | 3,544,315 | 4,945,574 | 1,915,441 |
| ගමන් වියදම් | 550 | 6,455 | 2,760 | 160 | 1,585 | 6,307 | 8,500 | 13,716 | 8,778 | 28,690 | 1,911 | 5,500 |
| සැපයුම් හා අවශ්‍යතා | 162,235 | 53,859 | 92,882 | 52,752 | 207,459 | 92,530 | 136,835 | 177,207 | 98,940 | 29,107 | 81,714 | 29,173 |
| අලුත්වැඩියා හා නඩත්තු | 91,266 | 59,675 | 76,983 | 162,995 | 123,652 | 123,671 | 150,989 | 105,674 | 54,904 | 110,170 | 72,023 | 12,761 |
| ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා | 1,897,356 | 2,101,594 | 3,227,489 | 2,515,430 | 4,501,247 | 2,835,522 | 2,914,611 | 2,014,367 | 390,208 | 4,355,162 | 2,760,223 | 185,540 |
| හා වෙනත් සේවා | | | | | | | | | | | | |
| **වෙනත් මෙහෙයුම් වියදම්** | | | | | | | | | | | | |
| විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | 108,836 | 161,649 | 213,633 | 294,794 | 654,278 | 316,306 | 185,030 | 219,407 | 29,263 | 210,164 | 163,244 | 62,750 |
| **මුළු පිරිවැය** | **7,439,247** | **7,454,734** | **9,798,086** | **11,470,745** | **24,384,094** | **13,131,711** | **10,265,406** | **8,594,708** | **4,114,897** | **8,277,608** | **8,024,689** | **2,211,165** |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(2,619,698)** | **(1,773,074)** | **3,189,113** | **2,119,083** | **(1,233,094)** | **27,699** | **221,927** | **1,682,595** | **(520,227)** | **(4,421,595)** | **2,234,123** | **(73,693)** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔසුසල ආදායම් ප්‍රකාශය

| | ඔසුසල වෙළදාම පිළියන්දල | ඔසුසල වෙළදාම හංගල්ල | ඔසුසල වෙළදාම රාගම | ඔසුසල වෙළදාම බණ්ඩාරගම | ඔසුසල වෙළදාම කොටුව | ඔසුසල වෙළදාම බොරැල්ල | ඔසුසල වෙළදාම ඇඹිලිපිටිය | ප්‍රාදේශිය ගබඩාව මහනුවර | සමස්ථ ඔසුසල වෙළඳ ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| විකුණුම් | 6,613,210 | 26,410,382 | 58,220,595 | 28,022,594 | 27,797,116 | 40,955,284 | 31,216,330 | 101,797,792 | 2,892,924,290 |
| විකුණුම් පිරිවැය හා මාරු කිරීම් | 5,309,598 | 21,166,646 | 47,031,608 | 22,660,232 | 22,529,969 | 33,659,699 | 24,470,005 | 69,606,664 | 2,392,222,810 |
| **විකුණුම් හා මාරු කිරීම් මත** | | | | | | | | | - |
| **දළ වෙළඳ ලාභය** | **1,303,613** | **5,243,735** | **11,188,987** | **5,362,362** | **5,267,147** | **7,295,585** | **6,746,325** | **32,191,128** | **500,701,479** |
| **ආයතන හා පරිපාලන වියදම්** | | | | | | | | | |
| සේවක පඩි නඩි | 1,579,322 | 5,311,202 | 6,339,769 | 5,227,547 | 3,486,687 | 4,300,301 | 4,660,708 | 4,403,660 | 271,764,932 |
| ගමන් වියදම් | 3,156 | 3,264 | 15,560 | 2,105 | 7,688 | 2,645 | 2,670 | 9,480 | 284,245 |
| සැපයුම් හා අවශ්‍යතා | 31,433 | 82,573 | 59,829 | 68,045 | 37,650 | 33,372 | 27,843 | 12,725 | 3,758,108 |
| අලුත්වැඩියා හා නඩත්තු | 6,648 | 36,634 | 169,203 | 50,018 | 28,002 | 27,275 | 14,576 | 33,430 | 4,331,929 |
| ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා | 161,434 | 2,598,470 | 2,858,151 | 1,812,353 | 2,060,358 | 1,519,278 | 2,448,778 | 2,329,202 | 94,307,794 |
| හා වෙනත් සේවා | | | | | | | | | - |
| **වෙනත් මෙහෙයුම් වියදම්** | | | | | | | | | |
| විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | 45,076 | 134,547 | 373,369 | 122,921 | 79,641 | 99,633 | 189,944 | 232,290 | 10,147,908 |
| **මුළු පිරිවැය** | **1,827,070** | **8,166,690** | **9,815,880** | **7,282,990** | **5,700,027** | **5,982,504** | **7,344,518** | **7,020,787** | **384,594,916** |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(523,457)** | **(2,922,955)** | **1,373,107** | **(1,920,628)** | **(432,880)** | **1,313,081** | **(598,193)** | **25,170,341** | **116,106,563** |

**මෙහෙයුම් අත්හිටුවීම -**
දිගින් දිගටම ලාභ නොලැබීම හේතුවෙන් 2015 වසරේ දී පිළියන්දල රාජ්‍ය ඔසුසල වසාදමන ලද අතර පැවති අවශ්‍යතා සලකා බලා ඉතිරි ඖෂධ තොගය ශ්‍රී ජයවර්ධනපුර ඔසුසල වෙත 2016 ජනවාරි 01වන දින මාරු කරන ලදී.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | |
| බදු වලට පෙර ශුද්ධ ලාභය | **1,230,137,320** | **741,553,839** |
| **ගැලපීම්** | | |
| ක්ෂය කිරීම් | 59,027,447 | 43,804,131 |
| විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම් | 32,623,953 | 39,848,088 |
| කල්බදු ක්‍රමක්ෂය - රත්මලාන | 160,000 | 160,000 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් මත ලාභය | (597,667) | - |
| බදු කුලි ක්‍රමක්‍ෂය | 654,598 | 654,598 |
| නොඉපයූ ලාභ | (6,631,956) | 4,203,495 |
| බොල් ණය සඳහා වෙන්කිරීම | 327,293,694 | 523,933,159 |
| තොග අලාභ | 5,481,653 | 22,648,579 |
| හානි වූ හා යල් පැනගිය තොග සඳහා වෙන්කිරීම - රා.ඖ.ස | 46,836,966 | 31,649,548 |
| හානි වූ හා යල් පැනගිය තොග සඳහා වෙන්කිරීම - රා.බෙ.ග | (10,262,566) | 8,587,784 |
| පොලි වියදම් | 734,134 | 149,658,755 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **1,685,457,576** | **1,566,701,976** |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ වැඩිවීම/අඩුවීම | (1,008,389,469) | 5,987,346,524 |
| තැන්පතු සහ පෙර ගෙවීම් වැඩිවීම/අඩුවීම | 4,917,986 | (5,016,886) |
| තොග වැඩිවීම/අඩුවීම | (1,019,168,622) | 281,892,681 |
| මාර්ගස්ථ තොගය වැඩිවීම/අඩුවීම | (249,369,801) | 249,516,130 |
| වෙළඳ ණයහිමියෝ වැඩිවීම/අඩුවීම | 1,096,886,949 | (1,414,167,990) |
| කල්බදු වගකීම | | |
| විලම්බිත ආදායම් | 256,927 | (140,972) |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | **510,591,546** | **6,666,131,462** |
| ආදායම් බදු ගෙවීම් | (268,319,436) | (367,042,567) |
| පාරිතෝෂික ගෙවීම් | (14,039,042) | (12,760,880) |
| පොලි ගෙවීම් | (734,134) | (149,658,755) |
| භාණ්ඩාගාර අයබදු හා ලාභාංශ ගෙවීම් | (100,000,000) | (75,000,000) |
| **විශේෂිත අයිතම වලට පෙර මුදල් ප්‍රවාහය** | **(383,092,612)** | **(604,462,202)** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **127,498,934** | **6,061,669,260** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම | (285,129,811) | (119,042,761) |
| නොනිම්වැඩ වැඩිවීම/අඩුවීම | 160,858,055 | (171,464,832) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් | 7,631,000 | 5,502,336 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් උපයෝජනය** | **(116,640,756)** | **(285,005,257)** |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | 10,858,177 | 5,776,664,003 |
| **වර්ෂය මුල මුදල් හා මුදල් වලට සමාන දෑ** | **722,977,721** | **(5,053,686,282)** |
| | | |
| **වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ (සටහන-අ)** | **733,835,898** | **722,977,721** |

| **සටහන (අ) මුදල් හා මුදල් වලට සමාන දෑ** | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| අතැති මුදල් සහ බැංකු මුදල් | 67,955,492 | 159,164,442 |
| කෙටිකාලීන ආයෝජන (REPO) | 675,000,000 | 600,000,000 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජන | 47,569,848 | 42,552,318 |
| බැංකු අයිරාව | (56,689,443) | (78,739,039) |
| **වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ** | **733,835,898** | **722,977,721** |

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. ආයතනික තොරතුරු
### 1.1 පොදු තොරතුරු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1971 දී රාජ්‍ය සංස්ථාවක් ලෙස සංස්ථාපනය කරන ලද අතර අංක 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 යන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස දොළහක කාල සීමාව සඳහා මූල්‍ය වාර්තා සකස් කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම ගිණුම් වාර්තා අනුමත කරයි.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ,

- ඖෂධ සහ සෞඛ්‍ය ආරක්‍ෂිත අයිතම විවෘත වෙළඳපොලට ආනයනය කිරීම, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.
- රාජ්‍ය බෙහෙත් ගබඩාවට අවශ්‍ය ඖෂධ සහ සෞඛ්‍ය ආරක්‍ෂිත අයිතම ආනයනය කර සැපයීම.
- පිවනි, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සෝවේට් ක්‍රීම් (B.B. Cream) නිෂ්පාදනය කර විකිණීම.
- රසායනාගාර පහසුකම් සැපයීම සහ ඖෂධ නියැදි පරීක්ෂාව.

### 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 පිළියෙල කිරීමේ පදනම

මෙම මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී.ල.මු.වා.ප්‍ර හා ශ්‍රී.ල.ගි.ප්‍ර ඇතුලත් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියනට අනුව පිළියෙල කර ඇත. (SLFRS & LKAS)

### 2.2 මිණුම් පදනම

සාධාරණ වටිනාකම අනුව දක්වා ඇති වත්කම් හා වගකීම් හැරුණුවිට සියළු මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැයට අනුව පිළියෙල කර ඇත. සංස්ථාවේ ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී එහි නිල හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය ලෙස ශ්‍රී ලංකා රුපියල භාවිතා කරයි.

### 2.3 අඛණ්ඩ පැවැත්ම

දිගින් දිගට පැවැත්මේ සංකල්පය අනුව සංස්ථාවේ ගිණුම් ප්‍රකාශන පිළියෙල කර ඇත.

### 2.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්කම්

විශ්‍රාම ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන වටිනාකම නිර්ණය කිරීම සඳහා සංස්ථාව විසින් (Projected Unit Credit Method) යොදා ගනියි. විශ්‍රාම ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන වටිනාකම නිර්ණය කිරීම සඳහා සුදුසුකම් ලත් ආයුගණක වරයෙකු ගේ (Actuary) සේවාව 2015 වර්ෂයේදී ප්‍රථම වරට ලබාගන්නා ලදී.

### 3. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 3.1.1 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

සංස්ථාව විසින් භාවිතා කරන ලද මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති විශේෂයෙන් දක්වා නොමැති විට පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුරූපවේ. ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි අවශ්‍ය අවස්ථාවල පෙර වර්ෂයේ සංඛ්‍යා හා වාක්‍යඛණ්ඩ නැවත සකසා ඇත.

### 3.1.2 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ සටහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරන අලාභවීම් ඇත්නම් ඒවා ද අන්තර්ග්‍රහණය කර ගණනය කළ ශුද්ධ පිරිවැය ලෙසය. එබඳු පිරිවැය අගයයන්ට දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ පිරිවැයට තැනුම් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීමේ සහ පිරිවැය නිර්ණායක වලට අනුකූල වන්නේ නම්, දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැයද ඇතුලත්වේ. යම් නියමිත කාලයකට වරක් දේපල , පිරියත සහ යන්ත්‍රෝපකරණ වල වැදගත් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීම අවශ්‍ය වන්නේ නම්, අදාල ඉවත් කරනු ලබන කොටසට අදාල වටිනාකම ඉවත්කරන අතර නව කොටස එහි ප්‍රයෝජනවත් ආයුකාලය හා ක්ෂය සමඟින් පිරිවැයට එක්රැස් කරනු ලැබේ. එලෙසම, ප්‍රධාන පෙළේ පිරික්සීමක් සිදුකරනු ලබන අවස්ථාවේදී එහි පිරිවැය, පිරිවැය නිර්ණායක සපුරාලන්නේ නම්, ආදේශනයක් වශයෙන් දේපළ හා පිරියතෙහි අනෙකුත් අලුත් වැඩියා කිරීම් හා නඩත්තු වියදම් ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

### 3.1.2.1 කල්බදු දේපල

සංස්ථාව රත්මලානේ පිහිටි බදු ඉඩම මූල්‍ය බද්දක් ලෙස වර්ගකර දක්වා මුළු වටිනාකම ඉතිරි ඵලදායි ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරයි.

### 3.1.3 ක්ෂය කිරීම්

අනුපාතික පදනම අනුව, දේපල, පිරියත හා උපකරණ අත්පත් කරගත් හා ඉවත්කළ වර්ෂය තුල ක්ෂය කිරීම සිදුකරයි. දේපල, පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 |
| රථ වාහන | වසර 3 සිට 17 |
| ලී බඩු සහ සවිකිරීම් | වසර 10 |
| උපකරණ | වසර 5 |
| පිරියත හා උපකරණ | වසර 8 |
| බයිසිකල් | වසර 6 සිට 7 |
| පරිගණක | වසර 4 |
| පුස්තකාල පොත් | වසර 5 |

### 3.1.4 නොනිමි වැඩ - ප්‍රාග්ධනය

ප්‍රවර්ථන වර්ෂයේ දී දරා ඇති එහෙත් ශේෂපත්‍ර දින දී ප්‍රාග්ධනිත නොකල ප්‍රාග්ධන වියදම් නොනිමි වැඩ ප්‍රාග්ධනය ලෙස දක්වා ඇති අතර ප්‍රවර්ථන වර්ෂයේදී ප්‍රාග්ධනිත ගත කර ප්‍රයෝජනයට ගන්නා ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත.

### 3.1.5 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වන්නේ අත්පත් කරගැනීමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙනයන අගය තීරණය කරනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි කරන අලාභ අඩු කරමිනි. ප්‍රාග්ධන සංවර්ධන වියදම් හැර අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධන ගත කරනු නොලබන අතර වියදම ඇතිවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුල අදාල වියදම පිළිබිඹු කෙරේ.

### 3.1.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කම් හානි විය හැකි බව දක්වන සංඥාවක් ඇතිදැයි සංස්ථාව එක් එක් වාර්තා කරන දිනයේ දී තක්සේරු කරයි. කවර හෝ සංඥාවක් පවති නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානි පිරික්සුමක් අවශ්‍ය වූ විට, සංස්ථාව අදාල වත්කමේ අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරයි.

### 3.1.7 බදුකරණය

### 3.1.7.1 වර්තමාන බදුකරණය

වර්තමාන බදු වත්කම් හා වර්තමාන බදු වගකීම් වනුයේ, බදු බලධාරීන්ට ප්‍රවර්ථන වර්ෂය හා අතීත වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු වන හා ඔවුන්ගෙන් අයකරගත යුතු වන වටිනාකම් වේ. එම බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂපත්‍ර දින වන විට පනවා තිබූ ඒවා වේ.

ඒ අනුව, 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ හා එයට කරන ලද සංශෝධන වල විධි විධානවලට අනුකූලව පනතේ නියම කර ඇති අනුපාතයනට අනුව බදු ගෙවීමේ කාර්යය සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කර ගෙන බදු ප්‍රතිපාදනය කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත්ව ගිණුම්ගත ලාභය පදනම් කරගෙනය.

### 3.1.7.2 විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනාගෙන ඇති වත්කම් හා වගකීම් වලට අදාල තාවකාලික වෙනස්කම් වර්ග සඳහා විලම්බිත බදු බැරකම් හා වත්කම් සඳහා ප්‍රතිපාදන කර ඇත. අපගේ මූල්‍ය ප්‍රකාශය තුල ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම් වල පොත් වටිනාකම හා බදු ලිඛිත වටිනාකම සඳහා විලම්බිත බදු බැරකමක්ද විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් වූ ප්‍රතිපාදනය සඳහා විලම්බිත බදු වත්කමක් ද හඳුනා ගත්තෙමු. සංස්ථාව විලම්බිත වත්කම් හා බැරකම් ආදායම් බදු අනුපාතය අනුව ගණනය කර දක්වයි.

### 3.2.1 භාණ්ඩ තොග

FIFO ප්‍රථමයෙන් ලැබූ අයිතම ප්‍රථමයෙන් නිකුත් කිරීමේ පදනමින් අගය තක්සේරු කෙරෙන අභාවිත හෝ මන්දගාමී චලනයන් සහිත භාණ්ඩ සඳහා නිසි වෙන්කිරීම් කල පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ තොග වටිනාකම් ගණනය කිරීම සිදුකරයි.

**තොග අගය කිරීම**

### 3.2.2 තොග පිරිවැය

**අමුද්‍රව්‍ය තොග - පිළිවනි ඒකකය**
කවර හෝ පසු වියදම්ද ඇතුලත්ව මිලට ගැනීමේ පිරිවැය

**නොනිමි වැඩ**
අමුද්‍රව්‍ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන වියදම මුළුමුනින්ම

**නිමි භාණ්ඩ**
අමුද්‍රව්‍ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන වියදම මුළුමුනින්ම

### 3.2.3 මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් හා මුදල් වලට සමාන දෑ වලට අයත් වන්නේ අතැති මුදල් හා බැංකු මුදල්, භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන, මාස දොලහක් හෝ අඩු කාලයක් තුල කල්පිරෙන ද්‍රවශීල තාවයෙන් ඉහල ආයොජනයි. බැංකු අයිරාව ශේෂපත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත.

### 3.2.4 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණෙන් සිදුකරන ලද පර්යේෂණ කටයුතු සඳහා වියදම් ඇතිවූ අවස්ථාවේ දී ඒවා ලාභාලාභ තුල පෙන්වා ඇත.

## 4. බැරකම් සහ ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 4.1.1 නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට සංස්ථාව බැඳී සිටි සේවකයෙකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සඳහා බැරකමක් පැන නගින්නේ සේවකයෙකු සංස්ථාව සමඟ අවුරුදු පහක අඛන්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේදිය. ශේෂ පත්‍රයේ පෙන්නුම් කරන මෙම වගකීම ශේෂපත්‍ර දිනයේ දී ප්‍රක්ෂිප්ත ඒකක බැර ක්‍රමය ට අනුව (Projected Unit Credit Method) තක්සේරු කළ විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමයි. මෙම විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා බාහිර අරමුදලක් ඇති කර නොමැත.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීමට අදාලව තක්සේරු වන සියලු ආයුගණක ලාභ හා අලාභ අනෙකුත් විස්තිරණ ආදායම් යටතේ වහාම ගිණුම්ගත කිරීමට සංස්ථාව කටයුතු කරයි.

වෘත්තිය ආයුගණක තක්සේරුකාර ආයතනයක් වන Actuarial and Management Consultants (Pvt) Ltd. ආයතනයේ එම්. පූපාලනාදන් මහතා විසින් 2015 දෙසැම්බර් 31 දිනට ආයුගණක තක්සේරුව සිදු කරන ලදි. විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව ගණනය කිරීමේදි පහත උපකල්පන හා දත්ත ආයුගණක තක්සේරු කරු විසින් භාවිතා කර ඇත.

| | |
|---|---|
| අපේක්ෂිත වාර්ෂික වැටුප් වර්ධන අනුපාතය% | -5 % |
| අපේක්ෂිත වාර්ෂික දීමනා වර්ධන අනුපාතය% | -10 % |
| වට්ටම්/පොලි අනුපාතය | -10 % |
| සේවක පිරිවැටුම් අනුපාතය | -4 % |
| විශ්‍රාමික වයස | - 60 years |

### 4.1.2 නිශ්චිත දායකත්ව සැලසුම්

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට හා සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සුදුසුකම් ඇති සියළුම සේවකයන් අදාළ රෙගුලාසි වලට අනුකූලව අදාළ දායකත්ව අරමුදල් මඟින් ආවරණය කරනු ලැබේ. සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට සැපයෙන දායකත්වයන් පිළිබඳ වගකීම් භාරයන් ආදායම් ප්‍රකාශය තුල වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

**සේවක අර්ථසාධක අරමුදල**

පිළිවෙලින් සංස්ථාව හා සේවකයන් දළ වැටුපෙන් 12% ක් හා 10% ක් ලෙස සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයයි.

**සේවක භාරකාර අරමුදල**

සංස්ථාව දළ සේවක වැටුපෙන් 3% ක් ලෙස සේවක භාරකාර අරමුදලට දායකත්වය සපයයි.

## 5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යානුගත වියදම් ක්‍රමය යොදා ගෙන ඇත්තේ එමඟින් සංස්ථාවේ කාර්යසාධනයෙහි සංරචකයන් සාධාරණව නිරූපණය වන බැවිනි.

### 5.1.1 ආදායම් හඳුනා ගැනීම

ගෙවන අවස්ථාව කවරක් වුවද ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව ඇති හා ආදායම හා ඊට සම්බන්ධ පිරිවැය නිවැරදිව මැනිය හැකි ආදායම් උපචිත පදනමට හඳුනාගනු ලැබේ. ගිවිසුම් ගතව නිර්වචනය කරන ලද ගෙවීමේ නියමයන් සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ අයවිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ.

ආදායම් වශයෙන් හඳුනා ගැනීමේ දි පහත සඳහන් විශේෂ පිළිගත් මිණුම් දඬු සපුරාලිය යුතුය.

**භාණ්ඩ අලෙවිය**

භාණ්ඩ අලෙවි ආදායම හඳුනා ගනු ලබන්නේ භාණ්ඩ හිමිකරුගේ අවදානම් හා ප්‍රතිලාභ ගැනුම්කරුට හිමිවූ අවස්ථාවේදි, සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදුන් විටය.

**අනෙකුත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනම අනුව හඳුනාගනියි.

**සැපයුම් කරුවන්ගෙන් ලැබිය යුතු වන්දි**

අතිරේක ගබඩා ගාස්තු, ඩෙමරේජ් ගාස්තු, හිඟ සැපයුම් සහ තොග හානි වෙනුවෙන් අයවිය යුතු හිමිකම් ඒවායේ අවිනිශ්චිත භාවය නිසා මූල්‍ය ප්‍රකාශනයන්හි සැලකිල්ලට ගෙන නොමැත.

කෙසේ වෙතත් ආදායම උපලබ්ධි වන බව නිශ්චිතව දන්නා විට එම හිමිකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇත.

### 5.1.2 වියදම්

වර්ෂයේ ලාභය ගණනය කිරීමේදි ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇති වූ සියළුම වියදම් ආදායමෙන් අඩුකර ඇත.

අලූත්වැඩියාවන් හා අලූත් කිරීම් එම වියදම ඇතිවූ වර්ෂයේ ලාභ අලාභවලට අය කරනු ලැබේ.

### 5.1.3 මූල්‍ය වියදම්

ප්‍රයෝජනයට ගත හැකි මට්ටමට ගෙන ඒමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කම්, අත්පත්කර ගැනීම, ගොඩනැගීම. නිෂ්පාදනය වෙනුවෙන් කෙලින්ම අදාලවන ණය පිරිවැය, අදාල වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධන ගත කරයි. අනෙක් සියළුම ණය පිරිවැයන් පිරිවැය දරන ලද වර්ෂයේ වියදම් ලෙස සලකයි. සංස්ථාවේ මූල්‍ය වියදම් තුල බැංකු අයිරා පොළී, ණයවර ලිපි ආරම්භ කිරීමේ වියදම් සහ ණය ගිවිසුම් ගාස්තු ඇතුලත් වේ.

### 5.1.4 පොදුකාර්ය වියදම් බෙදා වෙන්කිරීම

රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ රාජ්‍ය බෙහෙත් ගබඩාවට සම්බන්ධ ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීමෙන් පසුව පොදුකාර්ය පිරිවැය ප්‍රතිශතයක් ලෙස බෙදා වෙන්කර දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයේ පොදුකාර්ය වියදම් බෙදා ඇති ආකාරය පහත දැක්වේ.

| | ර.බෙ.ග | රා.ඖ.ස |
|---|---|---|
| (a) සේවක වේතන | 56% | 44% |
| (b) ගමන් වියදම් | 10% | 90% |
| (c) සැපයුම් සහ අවශ්‍යතා | 25% | 75% |
| (d) අලුත්වැඩියා සහ නඩත්තු | 50% | 50% |
| (e) ප්‍රවාහන, සන්නිවේදන, -උපයෝගිතා හා වෙනත් සේවා | 50% | 50% |
| (f) පර්යේෂණ හා සංවර්ධන | 65% | 35% |
| (g) බැංකු අයිරා පොළී | (සත්‍ය වියදම) | (සත්‍ය වියදම) |

මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනාගැනීම සහ පසු ඇගයීම

## 6.1 මූල්‍ය වත්කම්

### 6.1.1 මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර අංක. 39 හි විෂය පථය තුල මූල්‍ය වත්කම් වර්ගීකරණය වී ඇත්තේ ලාභ අලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් ණය හා අයවිය යුතු දේ, කල් පිරීම දක්වා ඇති ආයෝජන හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙසය. ඒ අනුව මූලික හඳුනා ගැනීමේ දී යෝග්‍ය ආකාරයට තම මූල්‍ය වත්කම් වර්ගීකරණය කළ යුතුය.

මූලික හඳුනා ගැනීමේ දී සියළුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට හඳුනා ගනියි, ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට හඳුනා නොගන්නා විට ගනුදෙනු පිරිවැයට ආරෝපණය කරයි. සංස්ථාවේ මූල්‍ය වත්කම් වල මුදල් හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ, සේවක ණය හා අනෙකුත් ලැබිය යුතු අයිතම ඇතුලත් වේ.

### 6.1.2 පසු තක්සේරුව

මූල්‍ය වත්කම් වල පසු වර්ෂවල තක්සේරුව පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

#### 6.1.2.1 ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම්

ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම් වලට අන්තර්ගත වනුයේ විකිණීම සඳහා වෙන්කරන ලද මූල්‍ය වත්කම් හා හඳුනා ගැනීමේදී මෙම වර්ගීකරණයට අයත් යැයි නිර්ණය කරන ලද මූල්‍ය වත්කම්ය. මූල්‍ය වත්කම් නුදුරු කාලයේදී විකිණීමේ හෝ යලි මිලට ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇති නම්, ඒවා වෙළඳාම සඳහා දරනු ලබන ලෙස වර්ගීකරණය කෙරේ. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසරේ ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම් සංස්ථාව සතුව නොතිබුණි.

#### 6.1.2.2 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ අයවිය යුතු දේ යනු විවෘත වෙළඳපලේ ගෙවීම් තක්සේරු නොවන ස්ථාවර හෝ නිර්ණය කළ ගෙවීම් සහිත විවෘත වෙළඳපලේ විකුණා ඉපයීමක් නොකරන මූල්‍ය වත්කම්ය. මුල් හඳුනා ගැනීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසු වර්ෂයන්හි තක්සේරු කරනු ලබන්නේ හානිවීම අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදී වූ වට්ටම් හෝ විශේෂ දිමනා සැලකිල්ලට ගනිමින් ගණනය කළ සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කරණු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම තුල සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ඇතුලත් කරනු ලැබේ. හානිවීම් නිසා පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුල හඳුනාගනු ලැබේ.

#### 6.1.2.3 කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත විවෘත වෙළඳපලේ විකිණීමක් නොකරන සංස්ථාවට කල්පිරීම දක්වා දැරීමේ හැකියාව හා සාධනීය චේතනාව තිබේ නම්, ඒවා කල් පිරීම තෙක් රඳවනු ලබන ඒවා ලෙස වර්ගීකරණය කෙරේ.

#### 6.1.2.4 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන වලට කාරක ප්‍රග්ධනය හා ණය සුරැකුම් ඇතුලත්ය. විකිණීමට ඇති මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇති කාරක ප්‍රාග්ධන ආයෝජන විකිණුම් සඳහා රඳවා ගනු ලබන ලෙස වර්ගීකරණය කරනු ලැබූ, ලාභ හෝ අලාභ ගිණුම හරහා නොමැති ඒවාය. මෙම ප්‍රභේදය තුළ ඇති ණය සුරැකුම් වනාහි ද්‍රවශීලතාව සඳහා වූ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳපල තත්ත්වයන්ගේ වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් අලෙවි කරනු ලැබිය හැකි අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා රඳවනු ලැබීමට අපේක්ෂිත කෙරෙන ඒවාය.

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන මූලික හඳුනා ගැනීමෙන් පසුව, සමුච්චිත අලාභය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුල යලි වර්ගීකරණය කර විකිණීමට ඇති සංචිතයෙන් ඉවත් කෙරෙන අතර, සමුච්චිත අලාභය වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනාගන්නා හෝ අපචයවූ ලෙස නිර්ණය කරනු ලබන අවස්ථාවන් ආයෝජන හඳුනා නොගැනීම කෙරෙන තෙක්, විකිණීමට ඇති සංචිතය තුල අනෙකුත් අංග සම්පූර්ණ ආදායම ලෙස හඳුනාගනු ලැබූ අනු උපලබ්ධි ලාභ හෝ අලාභ සමඟ වෙළඳපල වටිනාකමට තක්සේරු කරනු ලැබේ. විකිණීමට ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලැබේ.

සංස්ථාව සිය විකිණීමට ඇති මූල්‍ය වත්කම් තක්සේරු කරනුයේ නුදුරු කාලයේදී මෙම මූල්‍ය වත්කම් විකිණීමට ඇති හැකියාව හා අභිප්‍රාය තවමත් උචිතද යන්න නිශ්චය කරනු පිණිසය වෙළඳපලේ අක්‍රිය බව නිසා මෙම මූල්‍ය වත්කම් ගනුදෙනු කිරීමට සංස්ථාවට නොහැකි වන විට සහ එසේ කිරීමට කළමණාකාරිත්වයට ඇති අභිප්‍රාය සාදෘශ්‍ය අනාගතයේදී සැලකිය යුතු ලෙස වෙනස් වන විට, සංස්ථාව ඉතා කලාතුරකින් මෙම මූල්‍ය වත්කම් යලි වර්ගීකරණය කිරීමට තිරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම් ණය හා අයවිය යුතු දෑවල නිර්වචනය සපුරාලයි නම් සහ සාදෘශ්‍ය අනාගතය තුල හෝ කල් පිරෙන තෙක් මෙම වත්කම් රඳවා ගැනීමට ඇති හැකියාව හා අභිප්‍රාය බැංකුවට ඇතිවිට ඒවා ණය හා අයවිය යුතු දෑ ලෙස යලි වර්ගීකරණය කිරීමට අවසර ලැබේ. කල්පිරෙන තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස යලි වර්ගීකරණය කිරීමට අවසර ලැබෙනුයේ ආයතනයට අදාල මූල්‍ය වත්කම් එලෙස රැඳවීමට හැකියාව හා අභිප්‍රාය තිබේ නම් පමණි.

විකිණීමට ඇති ප්‍රභේදයෙන් ඉවත්ව යලි වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් කාරක ප්‍රාග්ධනය තුල හඳුනාගෙන ඇති එම වත්කමේ කවර හෝ පෙර ලාභයක් හෝ අලාභයක් සඵල පොළී අනුපාතික භාවිතා කරමින් ආයෝජනයේ ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ලාභය හෝ අලාභයට ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය කරන ලද පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර ඇතිවන කවර හෝ වෙනසක් වුවද සඵල පොළී අනුපාතික භාවිතා කරමින් වත්කමෙහි ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලැබේ. අදාල වත්කම් පසුව හානිවී ඇතැයි නිර්ණය කරනු ලබන්නේ නම්, එවිට කාරක ප්‍රාග්ධනය තුල සටහන් කරන ලද ප්‍රමාණය ආදායම් ප්‍රකාශය වෙත යලි වර්ගීකරණය කරනු ලැබේ. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සංස්ථාව සතුව කිසිදු විකිණීමට ඇති මූල්‍ය ආයෝජනයක් නොමැත.

### 6.1.2.5 හඳුනා නොගැනීම

මූල්‍ය වත්කමක් (එසේත් නැත හොත්, අදාළ අවස්ථාව අනුව, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා නොගැනීමක් කරනු ලබන්නේ පහත අවස්ථාවන්හිදිය.

1. වත්කම වෙතින් මුදල් ලැබීමට ඇති අයිතිය ඉකුත් වීම.

11. සංස්ථාව එම වත්කම වෙතින් මුදල් ලැබීමේ සිය අයිතිවාසිකම් පවරා තිබීම හෝ විනිවිද යන විධි විධානයක් යටතේ තුන්වන පාර්ශවයකට බලවත් ප්‍රමාදයකින් තොරව ලැබුණු මුදල් පූර්ණ වශයෙන් ගෙවීමේ වගකීමක් භාරයක් භාරගෙන තිබීම සහ

අ) සංස්ථාව වත්කමෙහි සියළුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පවරා තිබීම හෝ

ආ) සංස්ථාව වත්කමෙහි සියළුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පැවරීමකින් හෝ රඳවා ගැනීමකින් තොරව වත්කමේ පාලනය පවරා තිබීම.

### 6.1.2.6 මූල්‍ය වත්කම් හානිකරණය

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි කිසිවක් තිබේදැයි සංස්ථාව එක් එක් වාර්තා කරන දිනයේදී තක්සේරු කර බලයි. යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී ඇතැයි සලකනු ලබන්නේ, වත්කමේ මූලික හඳුනා ගැනීමට පසුව සිදුවූ සිදුවීමක හෝ කීපයක ප්‍රතිඵලය වශයෙන් හානි වීමක් පිළිබඳව පිළිගත හැකි සාක්ෂි ඇති නම් සහ මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත විශ්වාසය තැබිය හැකි අයුරින් ඇස්තමෙන්තු කළහැකි බලපෑමක් මඟින් අලාභ ගෙන දෙන සිදුවීමක් හෝ සිදුවී ඇති නම් පමණි.

හානිකරණයේ සාක්ෂි ලෙස ණයගැතියන්ගේ හෝ ණයගැති සමූහයේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පොළී හෝ මුල් මුදල් ගෙවීම් පැහැර හැරීම, බුන්වත්භාවය හෝ වෙනත් මූල්‍ය සංවිධානයවීම් වලට අවතීර්ණ වීම අත් විඳිමින් සිටින බව දක්වන සංඥා සහ පැහැර හැරීම් වලට සහ සම්බන්ධ හිඟ වාරික, හෝ ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මැනිය හැකි අඩු වීමක් තිබෙන බව හඟවන නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් වේ. සංස්ථාව ලැබිය යුතු වෙළඳ ණය සඳහා විශේෂිත වෙන්කිරීමක් සිදුකරයි (specific provision) සිදුකරයි.

### 6.1.2.7 ක්‍රමක්ෂිත පිරිවැය අගයයෙන් ගෙන යනු ලබන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂිත පිරිවැයෙන් මූල්‍ය ප්‍රකාශන වල පෙන්වනු ලබන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව මුලින්ම, තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව අපචය වීමේ හෝ සහ තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහික වශයෙන් අපචය වීමේ වාස්තවික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි.

තනිව තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කමක් සඳහා අපචය වීමේ වාස්තවික සාක්ෂි නොමැති බවට සංස්ථාව තක්සේරු කරන්නේ නම් එම වත්කම සැලකිය යුතු එකක් වුවද, නොවුවද, සංස්ථාව එම වත්කම එයට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමකට ඇතුළත්කොට, අපචය සම්බන්ධයෙන් අදාළ වත්කම් කණ්ඩායමම සාමූහිකව තක්සේරු කරයි. අපචය ඇතිදැයි තනි තනිව තක්සේරු කරනු ලබන හා අපචය අලාභයක් ඇති හෝ අඛණ්ඩව පවතිනු ඇති ලෙස හඳුනා ගනු ලබන වත්කම් සාමූහික අපචය තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

අපචය අලාභයක් සිදුවී ඇති බවට වාස්ථවික සාක්ෂි පවති නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමෙහි ධාරණ අගය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි තවමත් ඇති වී නොමැති අනාගතයේ අපේක්ෂිත ණය අලාභයන් ඇතුළත් නොවන වර්තමාන වටිනාකම අතර වෙනස ලෙසය. ඇසතමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම් මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළි අනුපාතිකයට වට්ටම් කරනු ලැබේ.

සංස්ථාව එක් එක් ණයගැති ප්‍රභේදය සඳහා විශේෂිත අපචය තක්සේරු කිරීම සිදුකර ඇත.

## 6.2 මූල්‍ය වගකීම්

### මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර අංක. 39 හි විෂය පථය තුල මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය වී ඇත්තේ, ලාභ ලාභ ගිණුම හරහා සාධාරණ අගයට නිර්මාණය වූ මූල්‍ය වගකීම්, ණය හා අයවිය යුතු දේ, හෝ ඵලදායි හෙජ් කිරීම සඳහා හෙජ් කිරීමේ මෙවලම් ලෙස නම්කල ව්‍යුත්පන්න උපකරණ සුදුසු පරිදි වේ. සංස්ථාව තම මූලික හඳුනා ගැනීමේ දීම තම මූල්‍ය වගකීම් වර්ගීකරණය තිරණය කරයි.

මූලික හඳුනා ගැනීමේ දී සියළුම මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමට හා, ණය හා අයවිය යුතු දේ ක්‍රමක්ෂේපිත පිරිවැයට හඳුනා ගනියි. මෙයට කෙලින්ම අර්පණය කළ හැකි වියදම්ද ඇතුලත් වේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් වල වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හා බැංකු අයිරාව ඇතුලත් වේ.

### පසු තක්සේරුව

සංස්ථාවේ මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය කළ පිරිවැයට අගය කරයි.

### හඳුනා නොගැනීම

මූල්‍ය වගකීමක් හඳුනා නොගැනෙන්නේ, වගකීමට ඇති බැඳීමෙන් නිදහස් වූ විට හෝ අවලංගු කල විට හෝ කල් ඉකුත්වූ විටයි.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන 07

| ආදායම | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| **ආදායම - රා.ඖ.ස** | | |
| තොග වෙළඳාම | 2,292,028,469 | 2,176,786,129 |
| පිවනි වෙළඳාම | 84,476,828 | 76,516,369 |
| ඔසුසල වෙළඳාම | 2,892,924,290 | 2,594,326,479 |
| නොඉපයූ ලාභ සඳහා වෙන්කිරීම් | (6,631,956) | (4,161,440) |
| ණය රක්ෂණ යෝජනා ක්‍රමය | 1,466,198 | 1,936,722 |
| සැපයුම්කරුවන්ගෙන් අයවූ වන්දි | 22,612,511 | 19,746,921 |
| **එකතුව** | **5,286,876,339** | **4,865,151,179** |
| **ආදායම - රා.බෙ.ග** | | |
| ආනයනික සැපයුම් | 14,927,370,007 | 13,879,926,133 |
| දේශීය සැපයුම් | 4,108,061,775 | 3,054,596,124 |
| ම.ඕ.ගැ. ඒකකය හරහා සැපයුම් | - | 9,401,740 |
| සැපයුම්කරුවන්ගෙන් අයවූ වන්දි | 141,375,008 | 325,084,452 |
| **එකතුව** | **19,176,806,790** | **17,269,008,449** |
| | | |
| **මුළු ආදායම** | **24,463,683,130** | **22,134,159,628** |

**විකුණුම් පිරිවැය/සෘජු වියදම්**

සටහන 08

| සෘජු වියදම් - රා.බෙ.ග | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| **ආදායම** | **19,176,806,790** | **17,269,008,449** |
| **සෘජු වියදම්** | | |
| රා.බෙ.ග ඇණවුම් වල පිරිවැය (මි.ර.ගැ) | 14,006,017,038 | 12,620,327,228 |
| තීරු ගාස්තු සහ බදු | 338,971,781 | 387,274,966 |
| දේශීය සැපයුම් පිරිවැය | 4,003,983,567 | 3,142,431,655 |
| ම.ඕ.ගැ. ඒකකය හරහා සැපයුම් පිරිවැය | - | 9,217,392 |
| **එකතුව** | **18,348,972,385** | **16,159,251,241** |
| | | |
| බැංකු වියදම් ( මුද්දර ගාස්තු, කොමිස්, ණයවර ලිපි ගාස්තු සහ අනෙකුත්) | 166,555,664 | 224,215,042 |
| ගොඩබෑමේ වියදම් | 16,975,277 | 22,162,241 |
| ආනයන බලපත්‍ර ගාස්තු | 31,397,021 | 29,083,234 |
| **එකතුව** | **214,927,962** | **275,460,517** |
| **අඩු කළා** : මාර්ගස්ථ තොග | 773,824,515 | 498,901,310 |
| **සෘජු වියදම්/විකුණුම් පිරිවැය** | **17,790,075,832** | **15,935,810,448** |
| **දළ ලාභය/අතිරික්තය** | **1,386,730,958** | **1,333,198,002** |

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන 09

| විකුණුම් පිරිවැය - රා.ඖ.ස | තොග වෙළඳාම රු. | ඔසුසල වෙළඳාම රු. | මුළු වෙළඳාම රා.ඖ.ස-2015 රු. | මුළු වෙළඳාම රා.ඖ.ස-2014 රු. |
|---|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ වෙළඳ තොගය | 794,906,092 | 454,731,831 | 1,249,637,923 | 1,433,090,000 |
| **එකතු කළා** | | | | |
| ආනයනික බෙහෙත් | 2,239,398,908 | | 2,239,398,908 | 1,492,001,486 |
| රසායනාගාර අමුද්‍රව්‍ය | 2,361,626 | | 2,361,626 | 1,318,616 |
| රා.ඖ.ස. ටෙන්ඩර් සඳහා දේශීය මිලදී ගැනුම් | 693,290,601 | | 693,290,601 | 441,454,220 |
| ම.ඕ.ගැ ඒකකයේ මිලදී ගැනුම් | 254,701,024 | | 254,701,024 | 116,307,750 |
| දේශීය මිලදී ගැනුම් (ඔසුසල) | - | 1,430,262,012 | 1,430,262,012 | 1,355,998,311 |
| තොග මාරු කිරීම් | | 1,162,217,857 | 1,162,217,857 | 844,836,472 |
| **විකිණීම සඳහා තිබූ වෙළඳ තොගය** | **3,984,658,251** | **3,047,211,700** | **7,031,869,951** | **5,685,006,855** |
| **අඩු කළා** : වර්ෂය අවසානයේ වෙළඳ තොගය | 1,405,140,519 | 654,988,890 | 2,060,129,409 | 1,281,753,534 |
| | | | | |
| **විකුණුම් පිරිවැය හා මාරුකිරීම්** | **2,579,517,731** | **2,392,222,810** | **4,971,740,542** | **4,403,253,321** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන -9අ

| විකුණුම් පිරිවැය | ඔසුසල වෙළඳාම කොළඹ 07 | ඔසුසල වෙළඳාම කොළඹ 04 | ඔසුසල වෙළඳාම කොළඹ 01 | ඔසුසල වෙළඳාම මහනුවර | ඔසුසල වෙළඳාම නුගේගොඩ | ඔසුසල වෙළඳාම අවිස්සාවේල්ල | ඔසුසල වෙළඳාම රත්නපුර | ඔසුසල වෙළඳාම මීනුවන්ගොඩ | ඔසුසල වෙළඳාම පානදුර | ඔසුසල වෙළඳාම ගාල්ල | ඔසුසල වෙළඳාම මාතර | ඔසුසල වෙළඳාම කුරුණෑගල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක වෙළඳ තොගය | 79,997,416 | 21,862,220 | 32,289,921 | 25,383,386 | 13,702,318 | 8,855,842 | 18,643,999 | 6,109,583 | 12,510,444 | 16,378,336 | 11,846,411 | 20,381,500 |
| දේශීය මිලදීගැනීම් | 390,715,172 | 317,314,512 | 97,498,534 | 62,957,127 | 41,511,905 | 9,645,714 | 28,460,077 | 8,331,368 | 34,529,589 | 39,615,658 | 25,562,843 | 32,583,760 |
| තොග මාරුකිරීම් | 164,031,715 | 70,119,726 | 78,125,323 | 80,164,838 | 43,632,990 | 21,559,642 | 34,153,339 | 13,933,421 | 25,793,526 | 43,106,015 | 35,069,115 | 41,368,252 |
| **විකිණීම සඳහා ඇති තොගය** | **634,744,303** | **409,296,458** | **207,913,778** | **168,505,351** | **98,847,212** | **40,061,198** | **81,257,414** | **28,374,373** | **72,833,559** | **99,100,009** | **72,478,369** | **94,333,513** |
| වර්ෂය අවසානයේ වෙළඳ තොගය | 102,262,226 | 24,816,808 | 53,887,245 | 46,802,839 | 28,108,700 | 10,795,529 | 24,635,688 | 6,927,585 | 14,580,608 | 28,077,838 | 20,044,710 | 22,383,427 |
| **විකුණුම් පිරිවැය හා මාරුකිරීම්** | **532,482,077** | **384,479,649** | **154,026,533** | **121,702,512** | **70,738,513** | **29,265,669** | **56,621,727** | **21,446,787** | **58,252,952** | **71,022,171** | **52,433,658** | **71,950,085** |
| **මුළු වෙළඳාම** | | | | | | | | | | | | |
| විකුණුම් | 636,383,562 | 434,111,192 | 184,802,317 | 150,869,114 | 88,664,839 | 35,763,541 | 69,346,034 | 26,904,760 | 69,874,323 | 87,750,170 | 65,714,716 | 86,340,111 |
| අඩු කලා- විකුණුම් පිරිවැය | 532,482,077 | 384,479,649 | 154,026,533 | 121,702,512 | 70,738,513 | 29,265,669 | 56,621,727 | 21,446,787 | 58,252,952 | 71,022,171 | 52,433,658 | 71,950,085 |
| **දළ වෙළඳ ලාභය** | **103,901,485** | **49,631,543** | **30,775,785** | **29,166,602** | **17,926,327** | **6,497,872** | **12,724,307** | **5,457,972** | **11,621,371** | **16,727,999** | **13,281,058** | **14,390,026** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන -9අ

| විකුණුම් පිරිවැය | ඔසුසල වෙළඳාම අම්පාර | ඔසුසල වෙළඳාම හම්බන්තොට | ඔසුසල වෙළඳාම අනුරාධපුර | ඔසුසල වෙළඳාම මහරගම | ඔසුසල වෙළඳාම ජයවර්ධනපුර | ඔසුසල වෙළඳාම කරාපිටිය | ඔසුසල වෙළඳාම මීගමුව | ඔසුසල වෙළඳාම බදුල්ල | ඔසුසල වෙළඳාම දියතලාව | ඔසුසල වෙළඳාම යාපනය | ඔසුසල වෙළඳාම පොළොන්නරුව | ස.තො.ස ශාඛාව රත්මලාන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක වෙළඳ තොගය | 6,300,868 | 7,626,397 | 10,921,292 | 22,099,401 | 23,365,316 | 16,819,087 | 12,639,015 | 8,891,189 | 3,774,111 | 9,268,066 | 5,113,024 | 1,511,131 |
| දේශීය මිලදීගැනීම් | 3,592,766 | 9,160,499 | 23,669,419 | 32,495,434 | 80,523,133 | 30,726,304 | 24,203,212 | 24,815,133 | 4,086,823 | 7,232,007 | 14,686,932 | 2,344,159 |
| තොග මාරුකිරීම් | 25,188,837 | 10,466,327 | 33,267,508 | 36,060,119 | 51,045,612 | 42,623,636 | 25,801,484 | 34,445,478 | 12,478,465 | 17,293,944 | 36,328,832 | 5,622,238 |
| **විකිණීම සඳහා ඇති තොගය** | **35,082,471** | **27,253,223** | **67,858,219** | **90,654,954** | **154,934,062** | **90,169,026** | **62,643,712** | **68,151,801** | **20,339,399** | **33,794,017** | **56,128,788** | **9,477,528** |
| වර්ෂය අවසානයේ වෙළඳ තොගය | 13,108,963 | 8,356,864 | 14,662,590 | 26,046,699 | 39,290,739 | 30,683,302 | 13,063,530 | 17,479,531 | 5,341,106 | 12,419,929 | 12,820,657 | 1,847,231 |
| **විකුණුම් පිරිවැය හා මාරුකිරීම්** | **21,973,508** | **18,896,359** | **53,195,629** | **64,608,255** | **115,643,323** | **59,485,724** | **49,580,182** | **50,672,270** | **14,998,293** | **21,374,088** | **43,308,131** | **7,630,296** |
| **මුළු වෙළඳාම** | - | | | | | | | | | | | |
| විකුණුම් | 26,793,056 | 24,578,019 | 66,182,828 | 78,198,083 | 138,794,324 | 72,645,133 | 60,067,515 | 60,949,573 | 18,592,962 | 25,230,102 | 53,566,943 | 9,767,769 |
| අඩු කලා - විකුණුම් පිරිවැය | 21,973,508 | 18,896,359 | 53,195,629 | 64,608,255 | 115,643,323 | 59,485,724 | 49,580,182 | 50,672,270 | 14,998,293 | 21,374,088 | 43,308,131 | 7,630,296 |
| **දළ වෙළඳ ලාභය** | **4,819,549** | **5,681,660** | **12,987,199** | **13,589,828** | **23,151,000** | **13,159,409** | **10,487,333** | **10,277,303** | **3,594,670** | **3,856,013** | **10,258,813** | **2,137,473** |

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන -9අ

| විකුණුම් පිරිවැය | ස.තො.ස ශාඛාව පිළියන්දල | ඔසුසල වෙළඳාම තංගල්ල | ඔසුසල වෙළඳාම රාගම | ඔසුසල වෙළඳාම බණ්ඩාරගම | ඔසුසල වෙළඳාම කොටුව | ඔසුසල වෙළඳාම බොරුැල්ල | ඔසුසල වෙළඳාම ඇඹිලිපිටිය | ප්‍රාදේශිය ගබඩාව මහනුවර | සමස්ථ ඔසුසල වෙළඳ ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක වෙළඳ තොගය | 1,535,500 | 7,848,247 | 11,074,174 | 5,167,318 | 7,467,006 | 10,084,376 | 6,177,610 | 9,087,328 | 454,731,831 |
| දේශිය මිලදීගැනීම් | 2,480,238 | 8,156,585 | 20,517,265 | 9,644,500 | 14,322,199 | 19,147,094 | 9,732,050 | - | 1,430,262,012 |
| තොග මාරුකිරීම් | 2,863,609 | 15,430,704 | 32,382,545 | 13,967,733 | 11,566,607 | 14,710,542 | 17,997,922 | 71,617,812 | 1,162,217,857 |
| **විකිණීම සඳහා ඇති තොගය** | **6,879,347** | **31,435,537** | **63,973,984** | **28,779,551** | **33,355,812** | **43,942,012** | **33,907,582** | **80,705,140** | 3,047,211,700 |
| වර්ෂය අවසානයේ වෙළඳ තොගය | 1,569,749 | 10,268,890 | 16,942,376 | 6,119,319 | 10,825,843 | 10,282,313 | 9,437,577 | 11,098,476 | 654,988,890 |
| **විකුණුම් පිරිවැය හා මාරුකිරීම්** | **5,309,598** | **21,166,646** | **47,031,608** | **22,660,232** | **22,529,969** | **33,659,699** | **24,470,005** | **69,606,664** | **2,392,222,810** |
| **මුළු වෙළඳාම** | | | | | | | | | |
| විකුණුම් | 6,613,210 | 26,410,382 | 58,220,595 | 28,022,594 | 27,797,116 | 40,955,284 | 31,216,330 | 101,797,792 | 2,892,924,290 |
| අඩු කලා- විකුණුම් පිරිවැය | 5,309,598 | 21,166,646 | 47,031,608 | 22,660,232 | 22,529,969 | 33,659,699 | 24,470,005 | 69,606,664 | 2,392,222,810 |
| **දළ වෙළඳ ලාභය** | **1,303,613** | **5,243,735** | **11,188,987** | **5,362,362** | **5,267,147** | **7,295,585** | **6,746,325** | **32,191,128** | **500,701,479** |

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

**ග්ලූකෝස්, පිවනි සහ බී.බී ක්‍රීම් නිෂ්පාදන පිරිවැය** **සටහන 10**

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| අමුද්‍රව්‍ය ආරම්භක තොගය | 762,869 | 947,125 |
| **එකතු කළා :** අමුද්‍රව්‍ය මිලදී ගැනීම් | 26,290,347 | 24,688,891 |
| **අඩු කළා :** අමුද්‍රව්‍ය අවසන් තොගය | 904,691 | 762,869 |
| **අමුද්‍රව්‍ය පිරිවැය** | **26,148,526** | **24,873,147** |
| එකතු කලා : නිෂ්පාදන පිරිවැය - සටහන 10අ | 42,713,331 | 33,598,884 |
| **භාණ්ඩ වල නිෂ්පාදන පිරිවැය** | **68,861,856** | **58,472,031** |

| **පිවනි වෙළඳාම** | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| ආරම්භක තොගය (නිමි භාණ්ඩ) | 258,064 | 979,781 |
| **එකතු කළා** භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය | 68,861,856 | 58,472,031 |
| **අඩු කළා** අවසාන තොගය (නිමි භාණ්ඩ) | 2,488,008 | 258,064 |
| **විකුණුම් පිරිවැය** | **66,631,913** | **59,193,747** |
| විකුණුම් | 84,476,828 | 76,516,369 |
| අඩුකලා විකුණුම් පිරිවැය | 66,631,913 | 59,193,747 |
| **දළ වෙළඳ ලාභය** | **17,844,915** | **17,322,622** |

**සටහන 10අ**

| **නිෂ්පාදන පිරිවැය** | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| වැටුප්, වේතන හා දීමනා | 14,602,198 | 10,971,726 |
| අතිකාල දීමනා | 2,330,421 | 1,790,831 |
| නිල ඇඳුම් | 133,141 | 372,850 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | 131,059 | 70,894 |
| අර්ථසාධක | 1,695,607 | 1,275,975 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 398,813 | 316,210 |
| පැමිණීමේ ප්‍රසාද දීමනා | 711,650 | 331,475 |
| වාර්ෂික ලාභාංශ ප්‍රසාද දීමනා | 2,648,956 | 1,802,538 |
| සේවක සුභසාධන වියදම් | 1,488,596 | 1,236,769 |
| වෛද්‍ය වියදම් | 467,773 | 326,145 |
| විදුලිය | 3,744,480 | 3,439,554 |
| ක්ෂය කිරීම් | 2,758,272 | 1,356,266 |
| අලුත්වැඩියා හා නඩත්තු | 708,958 | 357,549 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 10,893,407 | 9,950,102 |
| **එකතුව** | **42,713,331** | **33,598,884** |

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

**අනෙකුත් මෙහෙයුම් ආදායම්** — සටහන 11

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---:|---:|
| ටෙන්ඩර් හා ආකෘති පත්‍ර විකුණුම් | 5,937,263 | 5,249,831 |
| ගෙවල් කුලි ලැබීම් | 1,894,880 | 521,560 |
| භාණ්ඩාගාර බිල්පත් පොළිය | 1,377,796 | 4,698,229 |
| අබලි ද්‍රව්‍ය විකුණුම් ආදායම | 79,288 | 231,720 |
| අරමුදල් කළමනාකරණ ආදායම | 31,853,969 | 3,708,493 |
| විවිධ ආදායම් | 3,940,483 | 4,723,147 |
| නිවාඩු නිකේතනයන්ගේ කුලි ආදායම් | 1,203,333 | 1,047,926 |
| පෙර සුදුසුකම් ලබා දීමේ ගාස්තු | 2,502,500 | 1,925,250 |
| බොල් ණය අයකර ගැනීම් | 218,325 | 2,524,926 |
| සැපයුම්කරුවන්ගේ සම්මන්ත්‍රණය | (321,623) | 439,961 |
| නිෂ්කාශනය නොවූ හා ප්‍රමාදවූ චෙක්පත් මත දඩ පොළිය | 1,975,578 | 666,796 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් මත ලාභය | 597,667 | - |
| **එකතුව** | **51,259,458** | **25,737,839** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන 12

| පරිපාලන පිරිවැය | රා.ඖ.ස. වෙළඳ කටයුතු | | | මුළු | මුළු | මුළු | මුළු |
|---|---|---|---|---|---|---|---|
| | ඔසුසල | පිවනි ඒකකය | තොග වෙළඳාම | වෙළඳාම රා.ඖ.ස. | වෙළඳාම රා.බෙ.ග. | වෙළඳාම 2015 | වෙළඳාම 2014 |
| **සේවක වේතන** | රු | රු | රු | රු | රු | රු | රු |
| වැටුප්,වේතන හා දීමනා | 182,132,203 | - | 129,238,789 | 311,370,992 | 164,485,732 | 475,856,724 | 424,700,177 |
| අතිකාල දීමනා | 22,376,754 | - | 10,662,411 | 33,039,166 | 7,108,274 | 40,147,440 | 31,572,743 |
| සේවක පුහුණු වියදම් | - | - | 1,859,153 | 1,859,153 | 2,366,194 | 4,225,347 | 3,598,576 |
| නිල ඇඳුම් | 2,021,425 | - | 829,768 | 2,851,194 | 1,056,069 | 3,907,262 | 3,920,481 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | 3,105,905 | - | 3,469,666 | 6,575,571 | 4,415,939 | 10,991,510 | 9,430,191 |
| අර්ථසාධක | 20,228,369 | - | 14,521,824 | 34,750,193 | 18,482,322 | 53,232,515 | 47,590,958 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 3,978,506 | - | 2,883,852 | 6,862,358 | 3,670,357 | 10,532,715 | 10,438,410 |
| මාසික පැමිණීමේ දීමනා | 8,498,875 | - | 5,084,142 | 13,583,017 | 6,470,726 | 20,053,743 | 17,990,384 |
| ක්‍රීඩා සමාජ | - | - | 661,177 | 661,177 | 841,499 | 1,502,676 | 1,029,948 |
| වාර්ෂික ලාභාංශ ප්‍රසාද දීමනා | 26,792,614 | - | 19,259,702 | 46,052,316 | 24,512,348 | 70,564,664 | 57,065,601 |
| පාරිතෝෂිකය | - | - | 14,354,539 | 14,354,539 | 18,269,414 | 32,623,953 | 39,848,088 |
| ඉඩම්/නිවාස ණය පොළී | 2,630,280 | 53,188 | 2,236,474 | 4,919,942 | 2,846,421 | 7,766,363 | 7,082,008 |
| වාහන කුලී වියදම් | - | - | 776,160 | 776,160 | - | 776,160 | 870,000 |
| රා.ඖ.නී.ස. සංවත්සර ගෙවීම් | - | - | 1,288,163 | 1,288,163 | 1,639,480 | 2,927,643 | 1,169,400 |
| මරණ පාරිතෝෂිකය | - | - | - | - | - | - | 1,205,874 |
| **එකතුව** | **271,764,932** | **53,188** | **207,125,821** | **478,943,941** | **256,164,774** | **735,108,715** | **657,512,838** |
| **ගමන් වියදම්** | | | | | | | |
| විදේශීය ගමන් වියදම් - අධ්‍යක්ෂ | - | - | - | - | - | - | 66,534 |
| විදේශීය ගමන් වියදම් - වෙනත් | - | - | 397,126 | 397,126 | 44,125 | 441,251 | 637,536 |
| දේශීය ගමන් වියදම් - වෙනත් | 284,245 | - | 3,416,693 | 3,700,938 | 379,633 | 4,080,570 | 4,024,683 |
| **එකතුව** | **284,245** | **-** | **3,813,818** | **4,098,063** | **423,758** | **4,521,821** | **4,728,754** |
| **සැපයුම් සහ අවශ්‍යතා** | | | | | | | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 3,758,108 | 23,395 | 10,195,347 | 13,976,850 | 3,398,449 | 17,375,299 | 16,104,298 |
| අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම් | - | - | 17,145 | 17,145 | 5,715 | 22,860 | 187,963 |
| සංග්‍රහ වියදම් - අනෙකුත් | - | - | 435,870 | 435,870 | 145,290 | 581,161 | 310,927 |
| රථ වාහන අළුත්වැඩියා | - | - | 4,501,003 | 4,501,003 | 1,500,334 | 6,001,337 | 9,803,535 |
| ඉන්ධන වියදම් | - | - | 8,427,248 | 8,427,248 | 2,809,083 | 11,236,331 | 14,042,236 |
| වාහන බලපත්‍ර ගාස්තු | - | - | 165,393 | 165,393 | 55,131 | 220,524 | 205,824 |
| **එකතුව** | **3,758,108** | **23,395** | **23,742,007** | **27,523,510** | **7,914,002** | **35,437,513** | **40,654,783** |
| **අළුත්වැඩියා සහ නඩත්තු** | | | | | | | |
| ගොඩනැගිලි | 1,658,263 | - | 3,191,539 | 4,849,802 | 3,191,539 | 8,041,342 | 5,541,442 |
| ලී බඩු, සවිකිරීම් හා උපකරණ | 2,603,773 | - | 2,781,513 | 5,385,286 | 2,781,513 | 8,166,799 | 8,584,146 |
| පරිගණක | 69,893 | - | 1,072,830 | 1,142,723 | 1,072,830 | 2,215,552 | 3,978,242 |
| **එකතුව** | **4,331,929** | **-** | **7,045,882** | **11,377,811** | **7,045,882** | **18,423,693** | **18,103,830** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන 12

| පරිපාලන පිරිවැය | රා.ඖ.ස. වෙළඳ කටයුතු | | | මුළු වෙළඳාම රා.ඖ.ස. | මුළු වෙළඳාම රා.බෙ.ග. | මුළු වෙළඳාම 2015 | මුළු වෙළඳාම 2014 |
|---|---|---|---|---|---|---|---|
| | ඔසුසල | පිවනි ඒකකය | තොග වෙළඳාම | | | | |
| **ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා හා වෙනත් සේවා** | රු | රු | රු | රු | රු | රු | රු |
| කුලී | 13,358,978 | - | - | 13,358,978 | - | 13,358,978 | 12,165,090 |
| කල්බදු කුලී | 1,012,374 | - | 1,331,331 | 2,343,705 | - | 2,343,705 | 1,324,548 |
| වරිපනම් හා ගාස්තු | 710,906 | - | 924,614 | 1,635,521 | 924,614 | 2,560,135 | 1,506,165 |
| වතුර බිල් | 917,547 | 110,624 | 356,380 | 1,384,551 | 356,380 | 1,740,931 | 2,399,367 |
| විදුලිය | 17,206,880 | - | 12,728,839 | 29,935,719 | 12,728,839 | 42,664,558 | 43,146,174 |
| තැපැල්, විදුලිපණිවුඩ හා දුරකථන ගාස්තු | 1,502,404 | 74,573 | 6,782,801 | 8,359,778 | 6,782,801 | 15,142,579 | 14,939,582 |
| වෙළඳ දායකත්ව සහ සභාරා | 343,845 | - | 196,687 | 540,532 | 196,687 | 737,219 | 720,292 |
| වෘත්තීය ගාස්තු | - | - | 670,950 | 670,950 | 670,950 | 1,341,900 | 2,302,353 |
| රක්ෂණ | - | - | 1,447,520 | 1,447,520 | 1,447,520 | 2,895,039 | 2,949,437 |
| පුවත්පත් දැන්වීම් | - | - | 5,038,021 | 5,038,021 | 11,755,382 | 16,793,403 | 15,387,626 |
| ආරක්‍ෂක සේවා | 16,955,643 | 451,479 | 4,846,526 | 22,253,648 | 4,846,526 | 27,100,175 | 28,078,311 |
| ක්ෂය කිරීම් | 18,058,538 | - | 19,105,318 | 37,163,856 | 19,105,318 | 56,269,174 | 42,447,866 |
| බෙහෙත් බලපත්‍ර ගාස්තු | 405,193 | - | 608,720 | 1,013,912 | 5,478,477 | 6,492,390 | 5,835,086 |
| විවිධ වියදම් | 100,619 | 4,890 | 310,748 | 416,256 | 146,234 | 562,490 | 839,928 |
| අධ්‍යක්ෂ ගාස්තු | - | - | 392,375 | 392,375 | 392,375 | 784,750 | 577,634 |
| විගණන ගාස්තු | - | - | 455,398 | 455,398 | 455,398 | 910,795 | 910,795 |
| ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් ගාස්තු | - | - | 2,042,982 | 2,042,982 | 4,766,958 | 6,809,940 | 6,413,178 |
| සේවක සුභසාධන වියදම් | 19,125,810 | - | 12,167,127 | 31,292,936 | 15,485,434 | 46,778,370 | 43,818,267 |
| සේවක වෛද්‍ය වියදම් | 4,609,058 | - | 3,415,558 | 8,024,616 | 4,347,073 | 12,371,689 | 12,177,599 |
| ප්‍රදාන | - | - | 2,771,230 | 2,771,230 | - | 2,771,230 | 7,099,455 |
| නිවාඩු නිකේතන වියදම් | - | - | 1,781,574 | 1,781,574 | 2,267,457 | 4,049,031 | 3,705,155 |
| **එකතුව** | **94,307,794** | **641,566** | **77,374,697** | **172,324,057** | **92,154,424** | **264,478,481** | **248,743,907** |
| | | | | | | | |
| **මුළු පරිපාලන පිරිවැය** | **374,447,008** | **718,149** | **319,102,225** | **694,267,382** | **363,702,839** | **1,057,970,222** | **969,744,111** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන 12අ

| ඔසුසල පොදුකාර්ය පිරිවැය | ඔසුසල වෙළදාම කොළඹ 07 | ඔසුසල වෙළදාම කොළඹ 04 | ඔසුසල වෙළදාම කොළඹ 01 | ඔසුසල වෙළදාම මහනුවර | ඔසුසල වෙළදාම නුගේගොඩ | ඔසුසල වෙළදාම අවිස්සාවේල්ල | ඔසුසල වෙළදාම රත්නපුර | ඔසුසල වෙළදාම මිනුවන්ගොඩ | ඔසුසල වෙළදාම පානදුර | ඔසුසල වෙළදාම ගාල්ල | ඔසුසල වෙළදාම මාතර | ඔසුසල වෙළදාම කුරුණෑගල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පරිපාලන පිරිවැය** | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **සේවක වේතන** | | | | | | | | | | | | |
| වැටුප්,වේතන හා දීමනා | 27,423,587 | 10,950,474 | 5,470,929 | 9,926,612 | 7,487,015 | 4,689,756 | 7,685,147 | 3,583,174 | 6,462,057 | 8,440,768 | 6,759,262 | 6,420,502 |
| අතිකාල දීමනා | 3,951,808 | 1,555,406 | 349,163 | 1,292,357 | 1,267,274 | 511,476 | 527,021 | 332,836 | 663,890 | 629,512 | 441,404 | 736,247 |
| නිල ඇඳුම් | 256,511 | 115,612 | 51,116 | 117,569 | 94,711 | 47,938 | 90,583 | 40,432 | 71,732 | 98,158 | 58,423 | 74,817 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | 476,372 | 221,673 | 237,919 | 128,071 | 261,345 | - | 121,921 | 214,016 | 5,600 | 115,794 | 51,547 | 112,434 |
| අර්ථ සාධක | 3,145,719 | 1,195,910 | 618,247 | 1,132,245 | 839,607 | 528,928 | 846,987 | 373,731 | 707,316 | 932,025 | 759,345 | 714,182 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 609,525 | 235,969 | 110,250 | 216,000 | 162,000 | 94,500 | 162,000 | 69,750 | 135,000 | 175,500 | 148,500 | 135,000 |
| වාර්ෂික ලාභාංශ ප්‍රසාද දීමනා | 4,241,803 | 1,849,908 | 763,741 | 1,450,843 | 1,032,819 | 618,755 | 1,071,880 | 537,449 | 907,024 | 1,178,329 | 942,042 | 846,692 |
| ඉඩම්/නිවාස ණය පොළී | 341,241 | 95,808 | 91,636 | 74,742 | 18,513 | 30,472 | 38,332 | 4,020 | 64,690 | 47,180 | 35,191 | 170,752 |
| පැමිණීමේ දීමනා | 1,357,763 | 420,088 | 218,088 | 481,375 | 270,300 | 201,925 | 427,175 | 172,338 | 319,988 | 392,263 | 353,088 | 312,663 |
| **එකතුව** | **41,804,328** | **16,640,847** | **7,911,089** | **14,819,814** | **11,433,583** | **6,723,750** | **10,971,046** | **5,327,747** | **9,337,296** | **12,009,528** | **9,548,802** | **9,523,288** |
| **ගමන් වියදම්** | | | | | | | | | | | | |
| දේශීය ගමන් වියදම් - වෙනත් | 9,987 | 16,804 | 15,296 | 31,991 | 2,380 | 18,458 | 22,810 | 14,246 | 604 | 5,290 | 8,185 | 6,714 |
| **එකතුව** | **9,987** | **16,804** | **15,296** | **31,991** | **2,380** | **18,458** | **22,810** | **14,246** | **604** | **5,290** | **8,185** | **6,714** |
| **සැපයුම් සහ අවශ්‍යතා** | | | | | | | | | | | | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 341,018 | 184,666 | 242,174 | 96,886 | 163,336 | 364,646 | 132,705 | 99,472 | 138,972 | 88,868 | 192,929 | 144,273 |
| **එකතුව** | **341,018** | **184,666** | **242,174** | **96,886** | **163,336** | **364,646** | **132,705** | **99,472** | **138,972** | **88,868** | **192,929** | **144,273** |
| **අළුත්වැඩියා සහ නඩත්තු** | | | | | | | | | | | | |
| ගොඩනැගිලි | 319,706 | 663,657 | 36,106 | 33,977 | 31,068 | 52,424 | 24,328 | 9,376 | 12,283 | 59,797 | 21,585 | 44,191 |
| ලී බඩු, සවිකිරීම් හා උපකරණ | 332,572 | 207,657 | 19,194 | 151,827 | 148,791 | 89,766 | 109,710 | 9,731 | 117,396 | 153,888 | 59,963 | 67,814 |
| පරිගණක | - | 2,800 | - | - | - | 18,100 | 9,600 | - | 9,200 | - | - | 4,873 |
| **එකතුව** | **652,278** | **874,114** | **55,301** | **185,804** | **179,859** | **160,289** | **143,638** | **19,107** | **138,879** | **213,685** | **81,547** | **116,878** |
| **ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා හා වෙනත් සේවා** | | | | | | | | | | | | |
| කුලී | - | - | - | - | - | 383,378 | - | 365,000 | 840,000 | 570,000 | 780,000 | 1,440,000 |
| කල්බදු කුලී | - | - | - | 337,500 | 294,333 | - | 171,450 | - | - | - | - | - |
| වරිපනම් හා ගාස්තු | 318,472 | 117,810 | 71,379 | 74,368 | - | - | 6,000 | - | 3,000 | 20,544 | 18,539 | 12,610 |
| වතුර බිල් | 257,889 | 61,755 | 20,133 | 47,152 | 20,133 | 22,526 | 92,378 | 14,945 | 19,097 | 36,900 | 18,620 | 41,540 |
| විදුලිය | 3,589,304 | 864,543 | 450,000 | 767,285 | 747,221 | 380,781 | 771,282 | 192,288 | 573,255 | 695,311 | 551,369 | 664,377 |
| තැපැල්, විදුලිපණිවුඩ හා දුරකථන ගාස්තු | 192,999 | 75,327 | 56,746 | 41,738 | 69,204 | 35,444 | 39,362 | 55,402 | 37,592 | 68,875 | 42,551 | 39,194 |
| ක්ෂය කිරීම් | 1,691,269 | 732,708 | 827,736 | 743,891 | 820,381 | 188,785 | 893,377 | 288,874 | 424,123 | 640,935 | 571,819 | 608,852 |
| වෙළඳ දායකත්ව සහ සහරා | 34,220 | 11,660 | - | 14,600 | 17,120 | 14,550 | 14,600 | 7,980 | 14,640 | 14,880 | 14,550 | 14,910 |
| ආරක්ෂක සේවා | 2,646,633 | 958,189 | 287,924 | 925,254 | 277,925 | 582,293 | 267,278 | 693,820 | 279,874 | 658,894 | 658,894 | 659,294 |
| බෙහෙත් බලපත්‍ර ගාස්තු | 11,120 | 33,600 | 12,210 | 11,200 | 22,400 | 11,100 | 11,200 | 11,100 | 13,967 | 13,320 | - | 13,440 |
| විවිධ වියදම් | 6,610 | 1,530 | 3,412 | 180 | 6,315 | 190 | 7,626 | 2,089 | 2,035 | 7,392 | 6,374 | 12,521 |
| සේවක සුභසාධන වියදම් | 2,833,384 | 960,930 | 647,783 | 1,168,024 | 761,589 | 458,858 | 778,780 | 415,276 | 536,850 | 852,560 | 705,579 | 858,086 |
| සේවක වෛද්‍ය වියදම් | 715,744 | 249,090 | 137,954 | 256,977 | 199,365 | 119,981 | 195,219 | 88,413 | 157,360 | 179,700 | 179,959 | 161,000 |
| **එකතුව** | **12,297,643** | **4,067,141** | **2,515,276** | **4,388,169** | **3,235,986** | **2,197,886** | **3,248,552** | **2,135,186** | **2,901,793** | **3,759,310** | **3,548,253** | **4,525,825** |
| **මුළු පරිපාලන පිරිවැය** | **55,105,254** | **21,783,571** | **10,739,136** | **19,522,664** | **15,015,145** | **9,465,029** | **14,518,751** | **7,595,758** | **12,517,544** | **16,076,681** | **13,379,717** | **14,316,978** |

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන 12අ

| ඔසුසල පොදුකාර්ය පිරිවැය | ඔසුසල වෙළඳාම අම්පාර | ඔසුසල වෙළඳාම හම්බන්තොට | ඔසුසල වෙළඳාම අනුරාධපුර | ඔසුසල වෙළඳාම මහරගම | ඔසුසල වෙළඳාම ජයවර්ධනපුර | ඔසුසල වෙළඳාම කරාපිටිය | ඔසුසල වෙළඳාම මීගමුව | ඔසුසල වෙළඳාම බදුල්ල | ඔසුසල වෙළඳාම දියතලාව | ඔසුසල වෙළඳාම යාපනය | ඔසුසල වෙළඳාම පොළොන්නරුව | ස.පො.ස ශාඛාව රත්මලාන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පරිපාලන පිරිවැය** | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **සේවක වේතන** | | | | | | | | | | | | |
| වැටුප්,වේතන හා දීමනා | 3,235,412 | 3,605,159 | 3,975,568 | 5,757,849 | 12,011,687 | 6,676,529 | 4,560,307 | 3,791,151 | 2,372,122 | 2,365,794 | 3,317,212 | 1,292,114 |
| අතිකාල දීමනා | 709,984 | 393,798 | 738,873 | 649,635 | 1,723,741 | 509,961 | 716,920 | 478,505 | 268,796 | 339,927 | 461,510 | 219,839 |
| නිල ඇඳුම් | 40,040 | 48,198 | 51,757 | 76,400 | 123,529 | 75,711 | 42,974 | 61,105 | 29,016 | 24,866 | 39,470 | 13,857 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | - | 11,979 | - | 6,050 | 371,329 | 155,232 | 90,000 | 110,081 | - | 90,000 | 77,887 | - |
| අර්ථ සාධක | 371,519 | 392,982 | 440,850 | 635,978 | 1,372,122 | 763,984 | 482,051 | 402,385 | 278,952 | 247,441 | 363,388 | 135,294 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 83,869 | 67,500 | 83,869 | 123,750 | 294,525 | 148,500 | 94,500 | 108,000 | 54,000 | 40,500 | 58,500 | 27,000 |
| වාර්ෂික ලාභාංශ ප්‍රසාද දීමනා | 549,906 | 432,711 | 543,629 | 839,346 | 1,910,545 | 945,948 | 680,240 | 582,488 | 354,811 | 328,951 | 474,771 | 177,837 |
| ඉඩම්/නිවාස ණය පොළී | - | - | 139,006 | 103,944 | 572,070 | 179,886 | - | 317,136 | 66,369 | - | - | - |
| පැමිණීමේ දීමනා | 188,275 | 119,175 | 210,788 | 251,663 | 516,325 | 301,625 | 202,450 | 213,488 | 108,738 | 106,838 | 152,838 | 49,500 |
| **එකතුව** | **5,179,004** | **5,071,502** | **6,184,339** | **8,444,615** | **18,895,873** | **9,757,376** | **6,869,442** | **6,064,337** | **3,532,804** | **3,544,315** | **4,945,574** | **1,915,441** |
| **ගමන් වියදම්** | | | | | | | | | | | | |
| දේශීය ගමන් වියදම් - වෙනත් | 550 | 6,455 | 2,760 | 160 | 1,585 | 6,307 | 8,500 | 13,716 | 8,778 | 28,690 | 1,911 | 5,500 |
| **එකතුව** | **550** | **6,455** | **2,760** | **160** | **1,585** | **6,307** | **8,500** | **13,716** | **8,778** | **28,690** | **1,911** | **5,500** |
| **සැපයුම් සහ අවශ්‍යතා** | | | | | | | | | | | | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 162,235 | 53,859 | 92,882 | 52,752 | 207,459 | 92,530 | 136,835 | 177,207 | 98,940 | 29,107 | 81,714 | 29,173 |
| **එකතුව** | **162,235** | **53,859** | **92,882** | **52,752** | **207,459** | **92,530** | **136,835** | **177,207** | **98,940** | **29,107** | **81,714** | **29,173** |
| **අළුත්වැඩියා සහ නඩත්තු** | | | | | | | | | | | | |
| ගොඩනැගිලි | 9,838 | 12,475 | 8,600 | 57,866 | 8,329 | 36,476 | 12,625 | 82,212 | 6,018 | 39,308 | 13,348 | 232 |
| ලී බඩු, සවිකිරීම් හා උපකරණ | 70,878 | 47,200 | 68,383 | 105,129 | 105,823 | 87,194 | 135,344 | 23,463 | 48,886 | 70,862 | 58,675 | 12,529 |
| පරිගණක | 10,550 | - | - | - | 9,500 | - | 3,020 | - | - | - | - | - |
| **එකතුව** | **91,266** | **59,675** | **76,983** | **162,995** | **123,652** | **123,671** | **150,989** | **105,674** | **54,904** | **110,170** | **72,023** | **12,761** |
| **ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා හා වෙනත් සේවා** | | | | | | | | | | | | |
| කුලී | - | 540,000 | 1,082,400 | 780,000 | 1,020,000 | 620,000 | 980,000 | - | - | 1,800,000 | - | - |
| කල්බදු කුලී | - | - | - | - | - | - | - | 209,091 | - | - | - | - |
| වරිපනම් හා ගාස්තු | - | 8,783 | 20,600 | - | - | 15,656 | - | 10,995 | - | 6,150 | - | - |
| වතුර බිල් | 22,430 | 13,253 | 23,630 | 23,896 | - | 22,615 | 26,773 | 26,763 | 3,863 | - | 15,335 | - |
| විදුලිය | 426,814 | 371,790 | 621,848 | 562,326 | 530,605 | 582,054 | 625,014 | 390,857 | 48,978 | 553,266 | 486,295 | - |
| තැපැල්, විදුලිපණිවුඩ හා දුරකථන ගාස්තු | 44,877 | 71,234 | 56,160 | 35,496 | 57,318 | 47,138 | 55,101 | 58,666 | 26,112 | 22,384 | 42,995 | 1,080 |
| ක්ෂය කිරීම් | 744,862 | 334,594 | 450,485 | 165,672 | 611,967 | 409,294 | 243,648 | 344,162 | 32,740 | 877,535 | 1,085,660 | 29,822 |
| වෙළඳ දායකත්ව සහ සහරා | - | 5,880 | 13,450 | 6,850 | 21,710 | 15,080 | 5,820 | 5,350 | - | 13,740 | - | - |
| ආරක්ෂක සේවා | 261,907 | 266,308 | 265,458 | 275,977 | 694,860 | 273,635 | 266,291 | 390,068 | - | 658,894 | 658,893 | - |
| බෙහෙත් බලපත්‍ර ගාස්තු | 11,200 | 31,200 | 22,300 | 11,100 | 11,100 | 11,200 | 11,200 | 11,100 | 11,200 | 26,880 | 11,100 | - |
| විවිධ වියදම් | 460 | 1,627 | 1,315 | 2,250 | 2,465 | 6,945 | 700 | 4,623 | 2,350 | 2,000 | 1,080 | - |
| සේවක සුභසාධන වියදම් | 284,649 | 366,324 | 559,530 | 533,133 | 1,206,454 | 667,244 | 595,063 | 478,137 | 203,002 | 341,820 | 383,865 | 124,638 |
| සේවක වෛද්‍ය වියදම් | 100,158 | 90,602 | 110,314 | 118,730 | 344,768 | 164,662 | 105,000 | 84,555 | 61,964 | 52,494 | 75,000 | 30,000 |
| **එකතුව** | **1,897,356** | **2,101,594** | **3,227,489** | **2,515,430** | **4,501,247** | **2,835,522** | **2,914,611** | **2,014,367** | **390,208** | **4,355,162** | **2,760,223** | **185,540** |
| **මුළු පරිපාලන පිරිවැය** | **7,330,411** | **7,293,085** | **9,584,453** | **11,175,951** | **23,729,816** | **12,815,405** | **10,080,376** | **8,375,300** | **4,085,634** | **8,067,444** | **7,861,445** | **2,148,415** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ගිණුම්

සටහන 12අ

| ඔසුසල පොදුකාර්ය පිරිවැය | ස.තො.ස ගබඩාව පිළියන්දල | ඔසුසල වෙළඳාම තංගල්ල | ඔසුසල වෙළඳාම රාගම | ඔසුසල වෙළඳාම බණ්ඩාරගම | ඔසුසල වෙළඳාම කොටුව | ඔසුසල වෙළඳාම බොරැල්ල | ඔසුසල වෙළඳාම ඇඹිලිපිටිය | ප්‍රාදේශීය ගබඩාව මහනුවර | සමස්ථ ඔසුසල වෙළඳ ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| **පරිපාලන පිරිවැය** | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **සේවක වේතන** | | | | | | | | | |
| වැටුප්,වේතන හා දීමනා | 1,063,137 | 3,489,763 | 4,175,914 | 3,631,076 | 2,485,247 | 2,916,321 | 3,291,216 | 2,819,346 | 182,132,203 |
| අතිකාල දීමනා | 73,902 | 495,407 | 579,033 | 444,589 | 208,729 | 412,589 | 328,122 | 364,503 | 22,376,754 |
| නිල ඇඳුම් | 11,546 | 40,595 | 50,307 | 34,894 | 24,472 | 38,364 | 34,294 | 42,428 | 2,021,425 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | - | 48,949 | 180,000 | - | - | - | - | 17,708 | 3,105,905 |
| අර්ථ සාධක | 125,492 | 381,700 | 440,949 | 375,673 | 258,145 | 304,630 | 343,510 | 317,082 | 20,228,369 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 27,000 | 81,000 | 94,500 | 67,500 | 54,000 | 67,500 | 67,500 | 81,000 | 3,978,506 |
(අ) 1971 සැප්තැම්බර් 22 දිනැති අංක 14,976/8 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව, ඖෂධ නිෂ්පාදනය, ස්වදේශීය නිෂ්පාදන මිළට ගැනීම, ආනයනය, අපනයනය, අලෙවි කිරීම, බෙදාහැරීම, සකස් කිරීම, ගබඩා කිරීම සහ ඇසිරීම යනාදී වූ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර තිබුණු නමුත් ඖෂධ හා ඖෂධීය ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ සහ ප්‍රමිතිකරණය, ඖෂධ තත්ත්වය පාලනය කිරීම, සියුම් රසායන ද්‍රව්‍ය නිපදවන කර්මාන්ත පිහිටුවීම හා ඒවාට අනුග්‍රහ දැක්වීම, ඖෂධ අලෙවිය පිළිබඳ ලංකාව තුළත්, විදේශ රටවලත් පර්යේෂණ කටයුතු ඇරඹීම සහ ඖෂධ සම්බන්ධයෙන් පවත්නා වෙළඳ ලකුණු හා පේටන්ට් අයිතිවාසිකම් අත්කර ගැනීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකරගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(i) තොග හිඟයන්ගේ මට්ටම සියයට 5 ක් දක්වා වූ අවම මට්ටමකට පත්කිරීම.

(ii) තෝරාගත් අයිතම සඳහා වෛද්‍ය සැපයීම් අංශයට හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සැපයුම් කරන සැපයුම්කරුවන් ඒකාබද්ධ කිරීම.

(iii) බඳවාගැනීම් පරිපාටිය සංවර්ධනය කිරීම, ස්ථාන මාරුවීම් සම්බන්ධ ප්‍රතිපත්තියක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

(iv) කාර්යය සාධනය මත පදනම් වූ දිරිදීමනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

(v) සේවක දුක්ගැනිවිලි සඳහා වූ අත්පොතක් ප්‍රකාශයට පත්කිරීම.

(vi) සංස්ථාවේ සියළුම මෙහෙයුම් අංශ සම්බන්ධීකරණය කිරීම සඳහා ව්‍යාපාර සම්පත් සැළසුම්කරණ පද්ධතියක් (Enterprises Recourses Planning System) ක්‍රියාත්මක කිරීම.

(vii) සැලසුම්කරණ අංශයක් ස්ථාපිත කිරීම.

4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමාණවත් කාල අන්තරයන් සහිතව ඇණවුම් නොලැබීම හා වරින්වර ඇණවුමේ ප්‍රමාණයන් වැඩි කිරීම වැනි ප්‍රශ්න පිළිබඳව වෛද්‍ය සැපයුම් අංශය සමඟ සාකච්ඡා කර පිළියම් යෙදීමට කටයුතු නොකිරීම, ඖෂධ නියැදි නියමිත කාලය තුළ ලබාගැනීමට හා නැව්ගත කිරීමට පෙර නියැදි පරීක්ෂාව නියමිත කාලය තුළදී කරවා ගැනීමට ප්‍රමාණවත් උත්සාහයක් නොගැනීම, ජාතික ඖෂධ නියාමන' අධිකාරියේ සහතිකය නොමැති ඖෂධ ආනයනය කිරීමට කටයුතු කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී උද්ගතවන විවිධ ගැටළු සම්බන්ධයෙන් ගතවන කාලය අවම කර ගැනීමට කටයුතු නොකිරීම යනාදිය හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශය ඇණවුම් කර තිබුණු ඖෂධවලින් සැළකිය යුතු ප්‍රමාණයක් නියමිත කාලය තුළදී සපයාදීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. විගණනය වෙත සංස්ථාවෙන් ලබාදෙන ලද තොරතුරු අනුව 2013 වර්ෂයේදී ඇණවුම්කර තිබුණු ඖෂධ අයිතම 672 කින් අයිතම 360 ක් හා 2014 වර්ෂයේදී ඇණවුම්කර තිබුණු අයිතම 610 කින් අයිතම 103 ක් සැපයීමට අපොහොසත්ව තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ලැබී තිබුණු ඇණවුම් හා සැපයීම් සංඛ්‍යා පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) නැව්ගත කිරීමට පෙර නියැදි පරීක්ෂා කිරීම හා ඇසුරුම් පිළිබඳ පැහැදිළි කර ගැනීම් (Pack clarification) සඳහා කල්ගතවීම හේතුවෙන් ණයවර ලිපි විවෘත කිරීමට ප්‍රමාදවීම, ණයවර ලිපි සංශෝධනයන් කිරීමට සිදුවීම හා ඇණවුම් හෙවත් ඉන්ඩෙන්ට් නිකුත් කිරීමට ප්‍රමාදවීම යනාදී කරුණු තොග හිඟයන් ඇතිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණු නමුත් එවැනි ප්‍රමාදයන් අවම කර ගැනීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී තොග හිඟ අවස්ථා 10 කදී ආනයන මිලට වඩා වැඩියෙන් රු.28,956,276 ක් වැයකර ඖෂධ දේශීය වශයෙන් මිලදී ගැනීමට සිදුවී තිබුණි.

(ඇ) ලංසු ඉදිරිපත් කිරීමේදී නියැදි පරීක්ෂාව සඳහා එවන ලද ඖෂධ, අදාළ පරීක්ෂාවෙන් පසුව විනාශකළ යුතු වුවද විනාශ කිරීමට අනුමැතිය ලබා වර්ෂ 1 ත් වර්ෂ 3 ත් අතර කාලයක් ගතවී තිබුණද නියැදි 48 ක් විනාශ කිරීමකින් තොරව ගබඩාවල රඳවාගෙන තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ තොග ගිණුමේ කාල විශ්ලේෂණයට අනුව, පිරිවැය රු.175,929,700 ක් වූ තොග මාස හයකට වඩා වැඩි කාලයක්ද පිරිවැය රු.5,544,669 ක් වූ තොග වර්ෂයකට වඩා වැඩි කාලයක්ද මාර්ගස්ථ තොග ලෙස පවතින බව තහවුරු විය. වෛද්‍ය සැපයුම් අංශය විසින් භාර නොගත් තොග දිගුකාලයක් තිස්සේ මාර්ගස්ථ තොග ලෙස පවතින නමුත් තොග භාර නොගැනීමට හේතු සොයාබලා පිළියම් යෙදීමට අපොහොසත්වී තිබුණි.

(ඉ) සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු ඖෂධ වලින් 2015 දෙසැම්බර් 31 දින වන විට පිරිවැය රු.141,420,110 ක් වූ ඖෂධ විකිණිය නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. නමුත් භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව එම තොගයේ පිරිවැය රු.99,436,700 ක් පමණක් වූයෙන් රු.41,983,410 ක වෙනසක් පැවතුණි. මෙම වෙනසින් රු.5,906,462 ක් සඳහා පැහැදිළි කිරීම් විගණනයට ලැබුණු නමුත් තවදුරටත් රු.36,076,948 ක වෙනසට හේතු ඉදිරිපත් නොකෙරුණි. මේ අනුව හානිවූ තොග භෞතිකව නොපැවතීම තුළින් විකිණීමට නුසුදුසු තොග නැවත වෙළඳපලට නිකුත්වීමේ හැකියාවක් පවතින අතර එමගින් ගුණාත්මක නොවන ඖෂධ පාරිභෝගිකයන් අතට පත්වීමේ සම්භාවිතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ පැවති ක්‍රියාකාරී ඔසුසල් 32 න් ඔසුසල් 17 ක් අලාභ ලබා තිබුණු අතර මුළු අලාභය රු.26,618,559 ක් විය. නමුත් අවිස්සාවේල්ල, අම්පාර, හම්බන්තොට, යාපනය හා පිළියන්දල පිහිටි ඔසුසල් 5 ක් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අඛන්ඩව අලාභ ලබා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ මුළු අලාභයෙන් සියයට 47 ක් ඉහත ඔසුසල් 5 න් ලබා තිබුණි.

(උ) වෛද්‍ය සැපයීම් අංශය විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබුණු තත්ත්වයෙන් අසමත්, හානිවූ හා ඌනතා ඖෂධ වෙනුවෙන් සැපයුම්කරුවන්ගෙන් අයවිය යුතු රු.692,818,791 ක් අයකර ගැනීම සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විටත් කළමනාකරණය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංසු ඉදිරිපත්කර තිබුණු එකම සැපයුම්කරුගෙන් මුළු පිරිවැය රු.22,130,460 ක්වූ Erythromycinthylsuccinate oral suspension ඖෂධ බෝතල් 275,000 ක් වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් 2011 වර්ෂයේදී මිලදීගෙන තිබුණු නමුත් ලංසු විවෘත කිරීමේ කටයුතුවල විනිවිදභාවය තහවුරු කිරීමේ ලිඛිත සාක්ෂි පවත්වා නොතිබුණි. තවද ලංසුව සමඟ නියැදි ඉදිරිපත්කර නොතිබීම, 2006 වර්ෂයේදී සපයා තිබුණු ඖෂධයක් තත්ත්වයෙන් අසමත්වී තිබීම හා ඵලදායී තරඟකාරී බවක් නොමැතිවීම යනාදී කරුණු හේතුකොට ගෙන ලංසුව ප්‍රතික්ෂේප කළ හැකිව තිබුණු නමුත් ඒ වෙනුවට 2005 වර්ෂයෙන් පසු මෙම සැපයුම්කරුට එරෙහිව කිසිදු පැමිණිල්ලක් නොමැති බවට සාවද්‍ය ප්‍රකාශයක් කරමින් මෙම ඖෂධය මිලදී ගැනීමට තීරණය කර තිබුණි. ජීව කාලය වර්ෂ දෙකක් වූ ඖෂධයෙන් බෝතල් 123,393 ක් මිලදී ගෙන වර්ෂයකට ආසන්න කාලයකදී තත්ත්වයෙන් අසමත්වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අලෙවි නියෝජිත සමුළුව වෙනුවෙන් රු.2,837,103ක් වැයකර තිබුණද අනුමත විස්තරාත්මක අයවැය ලේඛනය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද ලංසු කැඳවීමකින් තොරව උත්සව ශාලාව හා ආහාර වෙනුවෙන් රු.1,097,672 ක් වැයකර තිබුණි. ඊට අමතරව කාර්ය කළමණාකරණයට (Event Management) ඇතුළත් ආලෝකකරණය, ඡායාරූපකරණය, සංගීතය, නර්තනය හා ආරාධනා පත්‍ර මුද්‍රණය එක අයිතමයක් ලෙස සළකා ලංසු කැඳවා තිබුණු අතර වැයකර තිබුණු මුළු මුදල රු.1,200,000 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී එම වියදම රු.756,880 කින් හෙවත් සියයට 171 කින් වැඩිවී තිබුණු බව නිරීක්ෂණය විය.

4.4 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

2013 හා 2014 වර්ෂවලදී රක්ෂණ ආවරණ ලබා ගැනීමකින් තොරව ප්‍රවාහනය කරමින් තිබුණු පිරිවැය රු.22,190,387 ක ඖෂධ තොගයක් තුළ ඇතිවූ ගින්නකින් විනාශවී තිබුණි. එහි අලාභය තක්සේරු කිරීම සඳහා වැයකර තිබුණු රු.5,687,874 ක් ඇතුළත් මුළු අලාභය රු.27,878,261 ක් විය.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

2015 දෙසැම්බර් 31 දින වන විට විධායක තනතුරු 32 ක , විධායක නොවන තනතුරු 82 ක හා සුළු සේවක තනතුරු 20 ක පුරප්පාඩු පැවතිය නමුත් වෙනත් විධායක තනතුරු 27 ක්, විධායක නොවන තනතුරු 22 ක් හා සුළු සේවක තනතුරු 01 ක් සඳහා අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා 44 දෙනෙකු ස්ථිර පදනම මතද 06 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මතද බඳවාගෙන තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

5.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබෙන ඇණවුම් සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර නොතිබුණි. සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගන්නා වෛද්‍ය සැපයුම් හා වෙනත් වත්කම් මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

---

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු සංශෝධිත අයවැය ලේඛණයට අනුව සමස්ත වියදම් අයිතම 66 කින් වියදම් අයිතම 26 ක ඇස්තමේන්තුගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 35 සිට සියයට 515 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.3 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම.

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අලෙවි කිරීමට හා වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් මිලදී ගන්නා ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය නිකුත් කිරීමට පෙර තත්ත්ව පරීක්ෂණයට භාජනය කළයුතු නමුත් විගණන නියදි පරීක්ෂාවේදී තෝරාගත් ඖෂධ අයිතම 274 කින් ඖෂධ අයිතම 69 ක් නිකුත් කිරීමෙන් පසුව පරීක්ෂාකර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී නිකුත්කළ ඖෂධවලින් පිරිවැය රු.13,484,980 ක්වූ ඖෂධ තත්ත්වයෙන් අසමත් බවත් එම ඖෂධ රෝගීන් වෙත නිකුත් කර ඇති බවත් හඳුනාගෙන තිබුණි. මෙවැනි තත්ත්වයන් යටතේ ගුණාත්මක නොවන ඖෂධ පාරිභෝජනය සඳහා රෝගීන් අතට පත්වීමේ දැඩි අවධානමක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 17 කදී තත්ත්වයෙන් අසමත් හා කල්ඉකුත් වීමට ආසන්න පිරිවැය රු.237,650 ක් වූ ඖෂධ තොග පරිත්‍යාග ලෙස රජයේ රෝහල්, වෛද්‍ය සායන, පාසැල් හා හමුදා ආයතන වෙත නිකුත්කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) තොග පාලනය | තොග ඌනතා හා අතිරික්තතා අවම කර ගැනීමට පියවර නොගැනීම හා බින් කාඩ්වල සඳහන් තොග ප්‍රමාණයන් හා පරිගණක පද්ධතියේ ඇති තොග ප්‍රමාණයන් අතර වෙනස්කම් හඳුනාගෙන ගැලපීම් නොකිරීම. |
| (ආ) මූල්‍ය පාලනය | හරපත් සඳහා මුදල් එකතු කර ගැනීම කාර්යක්ෂමව නොකිරීම. |
| (ඇ) අලෙවි කළමනාකරණය | අලාභවලට හේතු සොයා බලා අවම කර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

රාජ්‍ය ඖෂධ සංස්ථාවේ පිළිතුරු හා පැහැදිලි කිරීම්

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රමිත
විශ්‍රාමික පාරිතෝෂික බැදියාව සම්බන්ධයෙන් ආයෝජන සැලැස්මක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ඉදිරියේ දී ඇතිකර ගැනිමට කටයුතු කරමි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පරිගණක පද්ධතියේ සිදුවූ දෝෂයක් මත සිදුවූවකි. මෙය හඳුනා ගත් පසු 2015 ජනවාරි මස ගිණුම් ගත කර ඇත.

(ආ) අතිරේක ගබඩා ගාස්තු, ප්‍රමාද ගාස්තු (Demurrage), හිඟ සැපයුම් සහ තොග හානි වෙනුවෙන් හිමිකම් ඒවායේ අවිනිශ්චිත භාවය (අසම්භාව්‍ය වත්කම්) නිසා LKAS 37 ට අනුව මූල්‍ය ප්‍රකාශනයන්හි සැලකිල්ලට ගෙන නොමැත. කෙසේ වෙතත් ආදායම උපලබ්ධි වන බව නිශ්චිතව දන්නා විට එම හිමිකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇත.

ඔබ සඳහන්කර ඇති රු 288,401,175 ක වටිනාකමද සැපයුම් කරුවන්ගෙන් අයවිය යුතු නමුත් නිශ්චිත නොවන වටිනාකම් වේ.
මෙම කරුණ සංස්ථාවේ ගිණුම් ප්‍රතිපත්ති 5.1.1. යටතේ දක්වා ඇත.

(ඇ) ගිණුම් ප්‍රකාශයේ පෙන්වා ඇති රු. 51,276,084 ක වටිනාකම පහත පරිදි සැකසී ඇත.

| | |
|---|---|
| ලාභාලාභ ගිණුමට ලියාහල අගය | රු. 4,439,118.00 |
| වර්ෂයේ තත්ත්වයෙන් අසමත් හා කල් ඉකුත්වූ ඖෂධ වෙනුවෙන් කල වෙන්කිරීම | රු. 46,836,966.00 |
| | රු. 51,276,084.00 |

ලාභාලාභ ගිණුමට ලියාහල අගය වන රු. 4,439,118 හි ඇතුලත් වනුයේ රු. 500 ට අඩු අලාභයන් හා රක්ෂණ වන්දි ලබාගත නොහැකි මෙහෙයුම් අලාභයන් වේ.

ඉතිරි වටිනාකමින් රු. 2,491,318 ක් ඔසුසල් 31 ක තොග ගණන් ගැනිමේදි සොයාගන්නා ලද කල් ඉකුත් වු හා පලුදු වු අයිතම වෙනුවෙන් ලාභාලාභ ගිණුමේ සිදුකල වෙන්කිරීමයි.

ඉතිරි වටිනාකම වු රු. 44,345,648 ප්‍රධාන ගබඩාවේ විකිණිය නොහැකි තොගය පහත පරිදි සැකසි ඇත.

| | |
|---|---|
| පලුදු වු තොග හානි වටිනාකම | 1,959,504 |
| කල් ඉකුත්වු අයිතම | 18,765,144 |
| තත්ත්වයෙන් අසමත් අයිතම | 22,802,325 |
| වැරදි නිවැරදි කර යලි විකුණු තොග | 818,675 |

මෙයින් කල් ඉකුත්වු හා හානිවු ඖෂධ වල වටිනාකම සැපයුම් කරුවන්ගෙන් අයකරගැනිම කළ නොහැක. නමුත් තත්ත්වයෙන් අසමත් ඖෂධ වල අලාභය සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනිමට අදාල කටයුතු සිදුකර එයින් රු. 19,821,769 ක් මේ වන විට සැපයුම් කරුවන්ගෙන් අයකරගෙන ඇත.

(ඇ) නැව්ගත කිරීමට පෙර නියැදි පරීක්ෂා කිරීම් සඳහා වන වියදම් වෙනුවෙන් පැවති ගිණුම්කරණ ක්‍රමවේදය මෙම වසරේ සිට වෙනස් කර ඇත. වර්තමාන ක්‍රියාවලිය අනුව සැපයුම්කරුවන්ගෙන් මුදල් අයකරගත් පසු නැව්ගත කිරීමට පෙර නියැදි පරීක්ෂා කිරීම් සිදුකරයි.

2.2.3 නොසැසඳු පාලන ගිණුම්

දක්වා ඇති රු 4,013,750,000 ක වෛද්‍ය සැපයීම් අංශයෙන් ඔබ ලබා ගෙන ඇති ශේෂය පිළිබඳ අප වෙත කිසිදු දැනුවත් කිරීමක් කර නොමැත. එසේ හෙයින් දක්වා ඇති රු 163,131,984 ක වෙනස හඳුනා ගැනීමට තොරතුරු අප සතුව නොමැත.

2015.12.31 දිනට ශේෂය වූ රු. 3,973,907,607 ට අදාළව සියළු තොරතුරු ඔබ වෙත ලබා දී තිබුණද කාල විශ්ලේෂණයන් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත්තේ ඔබද දන්නා පරිදි වෛද්‍ය සැපයුම් අංශය හර පත් මත ගෙවීම් විස්තර තවමත් අපවෙත ලබා දී නොමැති නිසාය. 2014 වසර තුල සැපයුම් කළ රු. මි 5631 ක්ද 2015 වසර තුල සැපයුම් කළ රු. මි 4584 ක් ද ඇතුළුව මුළු රු. මි 10,215 ක් සඳහා තවමත් පියවීම් විස්තර ලබා දී නොමැත. මේ පිළිබඳව ප්‍රධාන ගණකාධිකාරීතුමාගේ ප්‍රධානත්වයෙන් වෛද්‍ය සැපයීම් අංශය සමඟ සාකච්ඡා කිරීමට අමතරව වරින් වර මෙම ගෙවීම් විස්තර ලබාදෙන ලෙස සිහිපත් කර ඇති නමුත් මෙම විස්තර ලබාදීමට ඔවුන් අපොහොසත් වීම නිසා අපහට කාල විශ්ලේෂණය පිළියෙල කිරීමට නොහැකි තත්වයක් උදාවී ඇත. රු. 202,974,314 ට අදාළව පමණක් හරපත් වෛද්‍ය සැපයුම් අංශයට ඉදිරිපත් කිරීමට ඇත.

2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) ඉහත දක්වා ඇති කරුණු හේතුවෙන් 2015.12.31 දිනට ශේෂය වූ රු. 3,973,907,607 ට අදාළව සියළු තොරතුරු ඔබ වෙත ලබා දී තිබුනද කාල විශ්ලේෂණයන් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත්තේ ඔබද දන්නා පරිදි වෛද්‍ය සැපයුම් අංශය හර පත් මත ගෙවීම් විස්තර තවමත් අප වෙත ලබා දී නොමැති නිසාය.

(ආ) 2015.12.31 දිනට ණයගැති ශේෂය වු රු 602,087,573 න් දැනටමත් රු 565,196,907 ක් අය කර ගෙන ඇති අතර වරින්වර අදාල තොරතුරු විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් 94% කි තවමත් හිඟ ශේෂය වූ රු 36,890,666 න් - 6% - රාජ්‍ය ආයතන/අර්ධ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු අගය රු 24,280,535 - 4% - ඉන් රු 16,054,980 ක්ම වෛද්‍ය සැපයුම් අංශය ගෙවිය යුතු පාර්ලිමේන්තුවට අදාලව කල සැපයීම් වලට අදාලව ලැබිය යුතු ශේෂයයි. පුද්ගලික අංශයෙන් ලැබිය යුතු රු 12,610,132 න් : 2% - නීතිමය පියවර සඳහා යොමු කර ඇති අගය වූ රු 10,486,443 කි ඉතිරි රු 2,123,689 හි වෙළඳ ණයගැතියන්ට අදාල නොවන නමුත් අයවිය යුතු රු 1,059,339 ක් වටිනා අගරු වෙක්පත් ඇතුලත්ය.
වසර 5 ඉක්මවූ ණයගැති ශේෂය වූ රු. 13,331,781 තුල නීතිමය පියවර සඳහා යොමු කර ඇති අගය රු 10,440,050 කි රාජ්‍ය ආයතන/අර්ධ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු අගය රු 2,798,632 කි. පුද්ගලික ණයගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂය රු 277,594 කි. රු 184,494 තැන්පතු හා වැඩිපුර ගෙවීම්ය.

(ඇ) ලැබිය යුතු රක්ෂණ වන්දිය නිශ්චිතව හඳුනා ගන්නා තුරු රක්ෂණ වන්දි ලබාගැනීමට ඉල්ලුම් කරනු ලබන අලාභය ඇස්තමේන්තුවක් ලෙස ලැබිය යුතු රක්ෂණ වන්දි වශයෙන් ගිණුම් ගත කිරීම සංස්ථාවේ ගිණුම් ප්‍රතිපත්තියයි. ලැබිය යුතු රක්ෂණ වන්දිය නිශ්චිතව හඳුනා ගෙන ඇස්තමේන්තු වටිනාකමේ වෙනස පසුව ගිණුමෙන් ඉවත් කිරීම සිදුකරයි. මේ වන විට අයකර ගැනීමට ඇති රු 3,064,850 ක වටිනාකමෙන් අය කරගැනීමට ඉතිරිව ඇත්තේ රු. 1,985,205.33 ක මුදලක් පමණි.

(ඈ) 2007 සිට 2013 දක්වා වු බහාලුම් තැන්පතු වන රු. 5,136,000.00 වටිනාකම නැවත අය කර ගැනීමට අදාලව නැව් සමාගම්වලට එන්තරවාසි (Letter Of Demand) යවා ඇති අතර ඉන් රු. 65,000.00 ක් මේ වසරේදී ලැබී ඇත. ඉතිරි පැරණි ශේෂය අය කරගැනීමට කටයුතු තවදුරටත් සිදු කරනු ලබයි. මේ සඳහා සැපයුම්කරුවන්ගේ රඳවාගෙන ඇති මුදල් වලින් අදාල අයකරගැනීම් සිදුකිරීමට ක්‍රමවේදයක් හඳුන්වාදී ඇති නිසා ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇතිවීමට ඉඩකඩ නොමැති බව දන්වා සිටිමි.

(ඉ) සඳහන්කර ඇති අත්තිකාරම් 2016 වසරේදී නිරවුල් කර ඇත.

(ඊ) විවිධ හේතුන් නිසා සංස්ථාව විසින් ගෙවීම් අත්හිටුවූ සැපයුම් කරුවන් හා සැපයුම් කරුවන් විසින් ලේඛණ වල මුල් පිටපත් බැංකුව වෙත ලබා නොදුන් අයිතම මෙලෙස ගෙවිය යුතු බිල් ලෙස ගිණුමේ ඉතිරිව ඇත. මේ සම්බන්ධ සවිස්තර වාර්තාවක් විගණනයට ලබාදී ඇත.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම.

(අ) ප්‍රමාදවී පියවී ඇති බව සඳහන් අවස්ථා 17 න් අවස්ථා 7 පමණක් වියදම් වු මුදල ලබාගත් අත්තිකාරම් මුදලට වඩා අඩු වී මුදල් අයකැමි වෙත එම මුදල පියවීම ප්‍රමාද වී ඇත. ඉතිරි අවස්ථාවන් 10 දී ලබාගත් මුළු අත්තිකාරම් මුදලම වියදම් වී අදාල ලේඛණය අත්තිකාරම් නිරවුල් කිරීම පිණිස ගිණුම් අංශය වෙත එවීම පමණක් ප්‍රමාද වී ඇත.
මෙම නිලධාරීන් වෙත අවවාද ලිපි යැවීමට හා ප්‍රමාදවූ කාලයට නියමිත පොලිය අයකර ගැනීම කර ඇත.

(ආ) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රවර්ධන වියදම් ශීර්ෂය සඳහා අදාල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන අනතුරුව ඉහත ප්‍රවර්ධන කටයුතු සිදුකර ඇත. ඒ අනුව රුපියල් මිලියන 13 ක් වෛද්‍යවරුන් ඉලක්ක කරගත් වැඩසටහන්, වැඩමුළු අනුග්‍රාහකත්වය හා රුපියල් මිලියන 2.7 ක් මහජනතාව දැනුවත් කිරීම සඳහා 2015 වසරේ වෙන් කොට තිබිණි.
දක්වා ඇති අනුග්‍රාහකත්ව අතරින් බහුතරයක් අනුග්‍රාහකත්ව වියදම් සිදුකර ඇත්තේ අනුමත වෛද්‍ය සංගමය මඟින් සංවිධානය කළ වෛද්‍යවරු සඳහා වන වැඩමුළු සඳහාය. එම අනුග්‍රාහකත්ව මඟින් එම වැඩසටහන් වලදී අප සංස්ථාවට වෛද්‍යවරුන් අතර ඖෂධ ප්‍රවර්ධනය කිරීමේ අවස්ථාව ලැබිණි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රවර්ධන නියෝජිතයින් ඒ සඳහා සහභාගි විය.
අනෙකුත් අනුග්‍රාහකත්ව කටයුතු වලදිද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ බැනර් ආදිය ප්‍රදර්ශනය කිරීමෙන් රාජ්‍ය ඔසුසල මහජනතාව අතරේ ප්‍රවර්ධනය කෙරිණ.

(ඇ) සංස්ථාවේ ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ 2016 ජනවාරි 1 දිනට ප්‍රත්‍යාගණනය කරන ලදි. එම වාර්තාව විගණනය වෙත ලබාදී ඇති අතර පරිගණක ගත නව ස්ථාවර වත්කම් ල්ඛණයක් මේ වන විට සංස්ථාව සතුව ඇත.

4.1 (අ) ඔබගේ නිරීක්ෂණය සමඟ එකඟ විය නොහැක.
ගැසට් නිවේදනයේ දක්වා ඇති සියලු අරමුණු ඉටුකරගැනීමට හැකිවි නොමැති නමුත් ප්‍රමුඛ අරමුණු සියල්ල වඩාත් හොඳින් ඉටුකරගෙන ඇති බව පෙන්වා දෙමි. ප්‍රමිතිකරණය සම්බන්ධයෙන් ඖෂධ සැපයම්කරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂාකිරීම (Pre qualify) සඳහා සාර්ථක ක්‍රමවේදයක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ශ්‍රී ලංකාවේ ඖෂධ ආනයනකරුවකු සතු එකම තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය අප විසින් පවත්වාගෙන යනු ලබයි. ජීවනී, ග්ලූකෝස් වැනි අත්‍යවශ්‍ය සංයෝග කිහිපයක් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තශාලා ඒකකයක් ද සංස්ථාව විසින් සාර්ථකව පවත්වාගෙන යනු ලබයි. එස්. පී. සී. යන වෙළඳ ලකුණ සහ රාජ්‍ය ඔසුසල සන්නාමය වෙළඳ ලකුණක් ලෙස ලියාපදිංචි කර එහි හිමිකම් සුරක්ෂිත කර ගෙන ඇත.

(ආ) I. ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්කය සපුරාගත නොහැකි වුවද තොග හිඟය අවම මට්ටමක පවත්වාගැනීම සඳහා විවිධ පියවර ගෙන ඇත.

II. සැපයුම්කරුවන් ඒකාබද්ධ කිරීමේදී විවිධ ප්‍රායෝගික ගැටළු සහ කාර්ය පරිපාටිමය බාධක පැනනැගුණු අතර ඒ හේතුවෙන් මේ ක්‍රියාකාරකම ඉටුකරගැනීමට අපේක්ෂිත කාලය තුල නොහැකි විය. එසේ වුවද 2016 වර්ෂයේදී මේ අනුව කටයුතු කිරීම ආරම්භ කරන ලදි.

III. බඳවා ගැනීමේ පරිපාටිය සංවර්ධනය කිරීමේදී විවිධ පාර්ශවයන්ගේ යෝජනා සහ අදහස් කැඳවා සාකච්ජා කිරීමට කාලයක් ගතවූ බැවින් අපේක්ෂිත දිනට එම ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීමට නොහැකි විය. එසේ වුවද මේ වන විට එහි මූලික දළ පිටපත සකස් කර අවසන් කර ඇත. ස්ථානමාරු ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ම සම්පාදනය කර අවසන් අතර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

IV. කාර්ය සාධනය මත පදනම් වූ දිරිදීමනා ක්‍රමයක් සම්බන්ධයෙන් සේවා සේවක දෙපාර්ශවය අතර එකඟතාවයක් ඇතිකර ගැනීමේ අසීරුතාවය මත මෙම ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීමට නොහැකි විය.

V. මෙම ක්‍රියාකාරකම හැකි ඉක්මනින් සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

VI. ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ පද්ධතිය ස්ථාපිත කිරීම කාර්ය පරිපාටිමය ප්‍රමාදයන් නිසා අපේක්ෂිත දිනට ඉටුකරගැනීමට නොහැකි විය. කෙසේ වුවද 2017 ජුනි මස වන විට මෙම පද්ධතිය ක්‍රියාත්මක මට්ටමට ගෙන ඒමට අපේක්ෂිතය.

VII. සැලසුම්කරණ අංශයක් ස්ථාපිත කිරීමේ මූලික පියවර වශයෙන් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන කළමණාකරුවකු පත් කර ඇති අතර ඔහුගේ අධීක්ෂණය යටතේ එම අංශය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(අ) 2015 වර්ෂය සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත අයිතම 835 කට අදාල ඇණවුම් ලැබී ඇති අතර, අයිතම 46 ක් සඳහා වන ඇණවුම් අත්හිටුවන ලෙස වෛද්‍ය සැපයුම් අංශය මඟින් පසුව දැනුම් දී තිබේ.
ඒ අනුව ක්‍රියාත්මක වූ අයිතම 789 සඳහා වන ඇණවුම් අතරින් අයිතම 616 ක්, 01.02.2016 දින වන විට වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දීමට කටයුතු සිදුකර තිබේ. එහි ප්‍රතිශතය 78% වේ.
මේ ඇණවුම් අතරින්, අයිතම 154 ක් සඳහාම ඇණවුම් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලැබී ඇත්තේ, ඇණවුම් සඳහා ලබා දෙන ප්‍රමාණවත් කාල සීමාවද නොමැතිව, 31.12.2014 වන දිනට පසුව බවත් නිරීක්ෂණය වේ.

(ආ) නැව්ගත කිරීමට පෙර නියැදි පරීක්ෂා කිරීම බොහෝ විට කරනු ලබනුයේ නව සැපයුම්කරුවන්ගේ හෝ කලින් සපයන ලද නිෂ්පාදනයන්හි තත්ත්වයේ අසමත්වීම් ඇති අවස්ථා වලදිය.
මෙමඟින් බලාපොරොත්තු වන්නේ ලබාගනු ලබන ඖෂධයේ ගුණාත්මකභාවය තහවුරු කිරීමයි. අපගේ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරයේ පරීක්ෂා කළ නොහැකි අවස්ථාවන්හිදි වෙනත් අනුමත රසායනාගාර මඟින් තත්ත්වය පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට සිදුවේ. මේ සඳහා ගතවන කාලය ඉදිරියේදි අවම කර ගැනීම සඳහා හැකි සෑම උත්සාහයක්ම ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ඉහත දක්වා ඇති කරුණ අප අංශයේ පාලනයෙන් තොර වුවකි. මේ සම්බන්ධව ගබඩා කළමණාකරු සමඟ සාකච්ජා කළ අතර අනුමැතින් ලැබුණු පසුව ඒවා විනාශ කිරීමේ තීරණ ගනු ලබන්නේ පරිපාලන අංශය මඟිනි.
කෙසේ වුවත් සංඛ්‍යාත්මක වශයෙන් මෙවැනි නියැඳි ප්‍රමාණයන් ඉතා අල්ප වන අතර එමඟින් ගබඩාවට වන බලපෑම නොසැලකිය යුතු තරම්ය.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට තිබූ මාර්ගස්ථ තොග වටිනාකම වන රු 175,929,700 න් මේ වන විට ඉතිරිව ඇත්තේ රු 98,856,541 කි. විවිධ හේතු නිසා වෛද්‍ය සැපයුම් අංශයේ ගබඩාවට භාරගැනීමට ප්‍රමාදවන අයිතම ප්‍රමාදයට හේතුවූ කරුණු නිරවුල් කර නැවත ලබා දෙන තෙක් මාර්ගස්ථ තොග ගිණුමේ පවතී. මෙය වෛද්‍ය සැපයුම් අංශයට වාර්ෂිකව කරන සැපයුම හා සලකා බලන විට අවම අගයකි.
මේ සම්බන්ධව අපගේ පාර්ශවයෙන් ඉල්ලීම් හා දැනුවත් කිරීම් කර ඇති අතර මෙම ප්‍රමාදය අපගේ පාලනයෙන් තොරව සිදුවන ක්‍රියාවකි.

(ඉ) ඔබ විසින් දක්වා ඇති අගයෙන් මේ වන විට රු 5,906,462.00 වටිනාකම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇත. තව ද භාවිතයෙන් ඉවත් කල පසුව රු 9,536,522.31 කට අදාල තොග අපහරණය කර ඇත. තව ද රු 1,813,781.72 ක වටිනාකමෙන් යුත් තොග සැපයුම්කරුවන් වෙත හරවා යවා ඇත. ඒ අනුව අදාල අගය මෙම ගැලපිලි වලින් පසුව රු 24,726,643.97 වශයෙන් වෙනස් විය යුතුය.
මෙම වෙනසට හේතුව සහ වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීම අභ්‍යන්තර විගණන අංශයට පවරා ඇත. ඔවුනගේ සොයාගැනීම් හා නිර්දේශ අනුව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.
යම් තොගයක් භාවිතයෙන් ඉවත් කිරීමට තීරණයක් ගත් විගස විකුණුම් සඳහා උපයෝගි කරගන්නා පරිගණක පද්ධතිය තුලින් එම ඖෂධය නිකුත් කිරීම නතර කෙරේ. ඒ අනුව එම ඖෂධය වෙළඳපොලට මුදාහැරීමේ අවදානමක් නැත.

(ඊ) 2014 වර්ෂයේ රාජ්‍ය ඔසුසල 32ක් අතරින් ඔසුසල 10ක් පමණක් ලාභ ලබා තිබුණි. නමුත් 2015 වසරේ අවසානය වන විට රාජ්‍ය ඔසුසල 15 ක් ලාභ ලබන ලදි. පාඩු ලබන ලද රාජ්‍ය ඔසුසල වලද පෙර වර්ෂවලට වඩා වැඩි වෙළදාමක් පෙන්නුම් කර ඇත. 2015 සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ සිටම රාජ්‍ය ඔසුසලවල පාඩුව අවම කර ගැනිම සඳහාත් ඒවායේ වෙළදාම වැඩිකර ගැනිම සඳහාත් ඒ ඒ රාජ්‍ය ඔසුසල මට්ටමෙන් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර, රාජ්‍ය ඔසුසල කළමණාකරුවන් සමඟ නිතර සාකච්ජා පවත්වමින් හා සංස්ථාවේ නිළධාරින් රාජ්‍ය ඔසුසල වලට ගොස් ඒවායේ අඩුපාඩු සොයා බලමින් ඔසුසල සේවකයින් දිරි ගැන්වීම සිදුකර ඇත.

ඉහත කාර්යන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් 2015 සමාලෝචිත වර්ෂයේ ලාභ ලබන ලද ඔසුසල සංඛ්‍යාව වැඩිවීමක් දැකිය හැකි වූ අතර සමස්ත ශුද්ධ ලාභය වැඩිවීම 61% පමණ විය.

2014 වර්ෂයේ රාජ්‍ය ඔසුසල 21ක් පාඩු ලබා ඇත. එම ඔසුසලවල සමස්ත අලාභය මිලියන 41කි. 2015 සමාලෝචිත වර්ෂයේ පාඩු ලැබූ රාජ්‍ය ඔසුසල සංඛ්‍යාව 16ක් දක්වා අඩුවී ඇත එම ඔසුසලවල සමස්ත අලාභය මිලියන 26කි. ඒ අනුව සලකා බලන විට 2015 වර්ෂයේ සමස්ත රාජ්‍ය ඔසුසල පාඩුව 37% කින් අඩු වී ඇත.

අවිස්සාවේල්ල, අම්පාර, හම්බන්තොට, යාපනය හා පිළියන්දල රාජ්‍ය ඔසුසලවල පිහිටීම අනුව වෙළදාමේ වර්ධනයේ අඩුවීමක් පෙන්නුම් කර ඇත. නමුත් අවිස්සාවේල්ල රාජ්‍ය ඔසුසල පිහිටි ස්ථානයෙන් ඉවත් කර අවිස්සාවේල්ල නගරයේ නව ගොඩනැගිල්ලක පිහිටුවීමත් සමඟ 2016 වර්ෂයේ මේ වන විට අවිස්සාවේල්ල රාජ්‍ය ඔසුසල පසුගිය වර්ෂවලට වඩා වෙළදාමේ වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

අම්පාර රාජ්‍ය ඔසුසලේ පාඩුව අවම කර ගනිමින් එය ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනිම සඳහා එම ඔසුසලට අනුබද්ධිතව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රාදේශිය ගබඩාවක් ආරම්භ කර ඇත. හම්බන්තොට හා යාපනය රාජ්‍ය ඔසුසල පවත්වාගෙන යෑම සඳහා වෙනත් සුදුසු ස්ථානයක් ලබා ගැනිමට කටයුතු යොදා ඇති අතර පිළියන්දල රාජ්‍ය ඔසුසල තාවකාලිකව වසා ඇත. පිළියන්දල රාජය ඔසුසල ස්ථාපිත කිරිම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් පිළියන්දල නගර මධ්‍යයේ හඳුනාගෙන ඇති බැවින් එම ඔසුසල එම ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ඉහත කරුණු ගැන සලකා බැලීමේදී 2016 වර්ෂය අවසාන වන විට රාජ්‍ය ඔසුසලවල අලාභය අවම කර ගැනිම සඳහා අවශ්‍ය සියළුම පියවර අප විසින් ක්‍රියාත්මක කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

තවද රාජ්‍ය ඔසුසල ජාලය හුදෙක් ලාභ පරමාර්ථයෙන් පමණක් නොව සේවා සපයන ආයතනයක් ලෙසද මෙහෙයුම් පවත්වාගෙන යාම බව ඔබගේ අවධානයට යොමු කරවමි. මෙම කරුණු සම්බන්ධව අප විසින් COPE කමිටුව හමුවේද කරුණු දක්වා ඇත.

(උ) රු. 692,818,791 න් තවදුරටත් රු. 7,572,236 ක් සැපයුම්කරුවන්ගෙන් මුදලින් හා ප්‍රති සැපයුම් මඟින් පියවාගෙන තිබු අතර එම අගය සැපයුම්කරුවන්ගෙන් අයකරගැනිම සහ ප්‍රති සැපයුම් හේතුවෙන් නිරන්තරයෙන් වෙනස් වන අගයකි. ඉතිරියෙන් රු. 53,735,006 ක අගය වෛද්‍ය සැපයීම් අංශය විසින් ඒකපාර්ශිකව සිදුකල අතිරික්ත අඩුකිරීම් (Excess Deductions) වන අතර එම වටිනාකම නැවත සංස්ථාව වෙත අයකර ගැනිම සඳහා හරපත් වෛද්‍ය සැපයුම් අංශය වෙත සංස්ථාව විසින් යොමු කරමින් සිටි. තවද රු. 111,051,978 ක වටිනාකමක් සැපයුම්කරුවන් සංස්ථාව වෙත නොගෙවීම හේතුවෙන් අදාල සැපයුම්කරුවන් අසාදු ලේඛණගත කර ඇති අතර එම වටිනාකම නිතිමය පියවර මඟින් අයකර ගැනිමට කටයුතු කරමින් පවති.

තවද රු. 27,939,185 ක වටිනාකමක් වෛද්‍ය සැපයීම් අංශය විසින් 2012 - 2015 අතර කාලය තුල සංස්ථාවේ මුදලින් අඩුකිරීම් සිදුකල ද ඇනවුම් සපයා ඇත්තේ 2003 සිට 2008 අතර කාලය තුලදි වන බැවින් වෛද්‍ය සැපයීම් අංශය විසින් වසර ගණනාවකට පසු සංස්ථාවෙන් අයකරගත්ත ද මෙයින් රු. 23,943,725 වටිනාකම (අදාල සැපයුම්කරුවන් මේ වන විට සංස්ථාව සමඟ ගනුදෙනු නොකරන බැවිනි) මේ අවස්ථාවේදි අයකර ගත නොහැකි තත්ත්වයක පවති. නමුත් රු. 3,995,460 ක වටිනාකම සැපයුම්කරු විසින් සංස්ථාවට නොගෙවීම මත අදාල සැපයුම්කරු අසාදු ලේඛණ ගත කිරිමට හා එම වටිනාකම නිතිමය පියවර මඟින් අයකර ගැනිමට කටයුතු කෙරේ.

ඉතිරි වටිනාකම වන රු. 492,520,386 ක වටිනාකම තවදුරටත් විශ්ලේෂණය කරමින් පවති.

4.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(අ) ලංසු විවෘත කිරීමේ ක්‍රියාවලිය විධිමත් පරිදි සිදුකිරීමට අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇත. 2011 වසරට සැපයීම සඳහා 2010 වසරේ මිල ගණන් කැඳවූ ටෙන්ඩරය සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණේ Alembic – India නැමැති ආයතනය මඟින් පමණි. එම ටෙන්ඩරයේ ඇගයීම් කටයුතු කරන අවස්ථාව වන විට තිබූ වාර්තා අනුව 2005 වසරෙන් පසු ඉහත සැපයුම්කරුගේ අදාළ ඖෂධය සඳහා තත්ත්වයෙන් අසමත් බවට වාර්තා කිසිත් නොතිබුණි. මෙම සැපයුම්කරු 2006, 2008, 2009 සහ 2010 යන වසර වල අදාල ඖෂධය වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා ඇත.

ඉහත කරුණු අනුව මෙම ඖෂධය සඳහා තාක්ෂණ ඇගයීමේදී කිසිදු අසත්‍ය කරුණක් ඉදිරිපත් කර නැත. 2005 වසරේ තත්ත්වය අසමත්වීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති වාර්තාවෙන් පසුව ද මෙම නිෂ්පාදකයා වෙත ඖෂධ අධිකාරිය මඟින් අවුරුදු 05 කට වලංගු වන පරිදි (2007-2012) නැවත ලියාපදිංචිය ලබා දී ඇත. මෙය ද එම සැපයුම්කරුගේ ඖෂධයේ තත්ත්වය පිළිබඳ සහතික කිරීමක් ලෙස සලකා ඇත.

අදාල ටෙන්ඩරය විවෘත ටෙන්ඩරයක් ලෙස කැඳවා තිබූ අතර ඒ සඳහා ඕනෑම සැපයුම්කරුවෙකුට මිල ගණන් ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබුණි. කෙසේ වුවත් ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබුණේ Alembic – India ආයතනය පමණි. ටෙන්ඩරයක් සඳහා සැපයුම්කරුවෙකු විසින් මිල ගණන් ඉදිරිපත් කිරීම හෝ නොකිරීම සංස්ථාවේ පාලනයෙන් බැහැරව පවතින්නකි.

(ආ) අලෙවි නියෝජිතයන්ගේ සමුළුව සඳහා වන වැය ශීර්ෂයට සංස්ථාවේ ප්‍රවර්ධන වැය ශීර්ෂය යටතේ නිසි අනුමැතියක් ලබාගෙන ඇත. මෙම ව්‍යාපෘතියෙහි ස්වභාවය අනුව විස්තරාත්මක වැය පුරෝකතනයක් සිදුකිරීම තරමක් දුෂ්කර වේ. එසේ වුවද විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු අනුව ඉදිරියේදී වඩාත් නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ.

4.4 හඳුනාගන්නා ලද පාඩු

සංස්ථාව විසින් ආනයනය කරන ලද ඖෂධ හා ශල්‍ය උපකරණ රැගත් නෞකා 02 ක් ගින්නට හසුවීම නිසා දක්වා ඇති අලාභය වු රු. 27,878,260.00 ක් නොදර්න් ගාඩ් යන නෞකාව සඳහා බේරුම්කරුවන්ට ගෙවූ තැන්පතුවෙන් කොටසක් වන රු. 256,995.45 ක් නැවත අප වෙත ලැබී ඇති අතර හානි වූ තොග විනාශ කරන තුරු ගබඩාවල රඳවා තබාගැනීම සඳහා ගෙවූ ගබඩා ගාස්තු වෙනුවෙන් රු. 1,671,111.73 ක් සැපයුම්කරුවන්ගෙන් ද අයකර ගෙන ඇත. රු. 1,928,107.18 වටිනාකමක් තවදුරටත් අයකර ගැනීමට ඇති අතර අදාල බේරුම්කරන ආයතන විසින් හානි පූර්ණ කටයුතු සඳහා අපගෙන් ඉල්ලා සිටි තොග විනාශ කිරීමේ සහතික ආදිය දැනටමත් ඔවුන් වෙත යවා අදාළ භාණ්ඩවල හානිය වෙනුවෙන් වූ අලාභය බේරුම්කරන ආයතන මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

අදාල නිරීක්ෂණය සමඟ එකඟ විය නොහැක. 2015 දෙසැම්බර් 31 දිනට පැවති කාර්ය මණ්ඩල තොරතුරු වලට අනුව පහත පැහැදිලි කිරීම් ඉදිරිපත් කරමි.

I අනුමත විධායක තනතුරු 36 ක්ද, පුරප්පාඩු 07 ක් සහිතව (M.M.1.1) තනතුරුවල රැඳී සිටි සංඛ්‍යාව 29 ක් විය.

II අනුමත කනිෂ්ඨ විධායක තනතුරු 94 ක්ද, පුරප්පාඩු 18 ක්ද සහිතව (J.M.1.1) තනතුරුවල රැඳී සිටි සංඛ්‍යාව 76 ක් විය.

III අනුමත විධායක නොවන තනතුරු 611 ක්ද, පුරප්පාඩු 61 ක්ද සහිතව (M.A.1.1 හා M.A.2.1) තනතුරුවල රැඳී සිටි සංඛ්‍යාව 550 ක් විය.

IV අනුමත සුළු සේවක තනතුරු 220 ක්ද, පුරප්පාඩු 20 ක්ද සහිතව (P.L.1,P.L.2 සහ P.L.3) තනතුරුවල රැඳී සිටි සංඛ්‍යාව 200 ක් විය.

මේ සම්බන්ධයෙන් විස්තරාත්මක කරුණු අවශ්‍යවේ නම් විගණනය සඳහා ඉදිරිපත් කළ හැකිය.

විධායක හා කණිෂ්ඨ විධායක තනතුරු

ඉහත අනු අංක I හා II පැහැදිලි කිරීම්වලට අනුව අදාල විස්තරාත්මක තොරතුරු පහත පරිදි වේ.

කේතාංක 7 පරිදි විධායක තනතුරු (M.A.1.1) අනුමත සේවක සංඛ්‍යාව 36 ක්ද, 2015/12/31 දිනට තනතුරුවල රැඳී සංඛ්‍යාව 29 ක් ද වූ අතර, ඒ අනුව පුරප්පාඩු 07 ක්ව පැවතුණි.

කේතාංක 06 පරිදි කණිෂ්ඨ විධායක තනතුරු (J.M.1.1) අනුමත සංඛ්‍යාව 94 ක්ද, 2015/12/31 දිනට තනතුරුවල රැඳී සිටි සංඛ්‍යාව 76 ක්ද වූ අතර, ඒ අනුව පුරප්පාඩු 18 ක්ව පැවතුණි.

ඉහත පැහැදිලි කිරීම් වලට අනුව, අදාල කෙටුම්පතෙහි සඳහන් පරිදි විධායක සේවයේ පුරප්පාඩු රහිතව 31 ක් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදුකර ඇති බව සඳහන් ප්‍රකාශයට එකඟ විය නොහැක.

විධායක නොවන තනතුරු

ඉහත අනු අංක III හි පැහැදිලි කිරීම් වලට අනුව විස්තරාත්මකව තොරතුරු පහත පරිදි වේ.
කේතාංක 04 හි පරිදි කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (M.A.1.1) සම්පූර්ණ අනුමත කාර්ය මණ්ඩලය 395 ක් වූ අතර, 2015/12/31 දිනට ඒ ඒ තනතුරුවල රැඳී සිටි සංඛ්‍යාව 346 ක් වේ.

කේතාංත 05 හි පරිදි කළමනාකරණ සහකාර - තාක්ෂණික (M.A.2.1) සම්පූර්ණ අනුමත කාර්ය මණ්ඩලය 216 ක් වූ අතර, 2015/12/31 දිනට තනතුරුවල රැඳී සිටි සංඛ්‍යාව 204 ක් වේ.

ඉහත පැහැදිලි කිරීම්වලට අනුව, අදාල කෙටුම්පතෙහි සඳහන් පරිදි විධායක නොවන සේවක පුරප්පාඩු රහිතව බඳවා ගැනීමක් සිදුකර නොමැත. එබැවින්, විධායක නොවන තනතුරු 33 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදුකර ඇති බව සඳහන් ප්‍රකාශයට එකඟ විය නොහැක.

සුළු සේවක තනතුරු

ඉහත අනු අංක IV පැහැදිලි කිරීම් වලට අනුව විස්තරාත්මකව තොරතුරු පහත පරිදි වේ.
කේතාංක 01 හි සඳහන් පරිදි සුළු සේවක නුපුහුණු කාර්මික (P.L.1) සම්පූර්ණ අනුමත කාර්ය මණ්ඩලය 182 ක් වූ අතර, තනතුරුවල රැඳී සිටි සංඛ්‍යාව 2015/12/31 දිනට 168 ක් විය.

සුළු සේවක අර්ධ පුහුණු කාර්මික (P.L.2) සම්පූර්ණ අනුමත කාර්ය මණ්ඩලය 08 ක් වූ අතර, තනතුරුවල රැඳී සිටි සංඛ්‍යාව 2015/12/31 දිනට 06 ක් විය.

සුළු සේවක පුහුණු කාර්මික (P.L.3) සම්පූර්ණ අනුමත සේවක සංඛ්‍යාව 30 ක්ද, තනතුරුවල රැඳී සිටි සංඛ්‍යාව 2015/12/31 දිනට 26 ක් විය.

ඉහත පැහැදිලි කිරීම්වලට අනුව අදාල කෙටුම්පතෙහි සඳහන් පරිදි සුළු සේවක පුරප්පාඩු රහිතව එය ඉක්මවා බඳවා ගැනීමක් සිදුකර නොමැත. එබැවින් සුළු සේවක තනතුරක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදු කර ඇති බව සඳහන් ප්‍රකාශයට එකඟ විය නොහැක.

මේ සම්බන්ධයෙන් වන ලේඛණ අවශ්‍යවේ නම් විගණනය සඳහා ඉදිරිපත් කළ හැකිය.

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම්

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් 07 ක් වූ අතර, අදාල විස්තර ඇමුණුම III හි පරිදි වේ. නමුත් කොන්ත්‍රාත් පදනම මත මේ වන විට සේවකයින් තිදෙනෙකු පමණක් සේවයේ යොදවා ගෙන ඇත. ඉන් තනතුරු 2 ක් ERP ව්‍යාපෘතිය ක්‍රියාත්මක කොට ස්ථාපිත කිරීම සඳහා කර ඇති බඳවා ගැනීම් වේ. අනෙක් තනතුර සඳහා එම තනතුර දරණ නිලධාරිණිය විශ්‍රාම යන අවස්ථාවේ සුදුසු අනුප්‍රාප්තිකයෙකු පත් කර ගැනීමට නොහැකි වූ නිසා කොන්ත්‍රාත් පදනම මත එම නිලධාරිණිය නැවතත් සේවයට බඳවා ගෙන ඇත. මේ වන විට ඒ සඳහා සුදුසු අනුප්‍රාප්තිකයෙකු තෝරා ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

2015 වර්ෂය සඳහා වන අයිතම ලේඛණය (Product Budget) 2014 සැප්තැම්බර් මාසය වන විට සකස් කල අතර, මෙහිදී විශේෂ අවධානය යොමු කෙරුනේ අයිතම ප්‍රමාණය වර්ෂය මුළුල්ලේම ප්‍රශස්ථ මට්ටමක පවත්වාගෙන යාමටයි. මේහිදී ඇණවුම් නියමිත කාලයේදී අවශ්‍ය ප්‍රමාණයන් ඇණවුම් කිරිම පිළිබඳව විශේෂයෙන් සැළකිලිමත් වේ. කළමණාකාර (තොග පාලන) විසින් ඇණවුම් ලේඛණය සකස් කරන අතර, එහි දී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) සහ විකුණුම් කළමණාකරු (රත්මලාන) යන අයගෙන් දත්ත ලබාගෙන එය සකස් කරනු ලබයි.

තොග පාලන අංශය මඟින් අවශ්‍ය කාල වකවානුවට නව ඇණවුම් අයිතම ලේඛණයෙන් ඉදිරිපත් කරන අතර එහි දී වෙළඳ පොලේ තරඟකාරිත්වය, පෞද්ගලික අංශයේ සැපයීම් ආදිය පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් වේ.

### 5.2 අයවැය ලේඛණමය පාලනය

අයවැය ලේඛණය සකස් කිරිම සඳහා විස්තරාත්මක පුරෝකථනයක් මඟින් සිදුකරනු ලබයි. එහෙත් ආර්ථික හා සාමාජිය වෙනස්කම් මත විචලනයන් ඇතිවිය හැක. ඔබ විසින් නම් කරන ලද ප්‍රධාන අයිතම වල විචලන සඳහා පහත හේතුන් බලපා ඇත.

1. Staff Training : විදේශ පුහුණුවීම් සඳහා රු. මිලියන 02 ක ප්‍රතිපාදනයක් සිදු කර ඇති අතර එම පුහුණුවීම් සැලසුම් වර්ෂය තුල සිදු කර නැත.

2. Sports Club : Colours Night පැවැත්වීමට ලක්‍ෂ 05 ක මුදලක් වෙන් කර ඇති අතර එය පවත්වා නැත.

3. Land & Hosing Loan Interest : අනුමත ණය මුදල රු ලක්‍ෂ 07 සිට රු. මිලියන 02 දක්වා වැඩිකිරිම වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදනයක් සිදු කර ඇත.

4. Vehicle Hiring : PIR වෙනුවෙන් වාහන කුලී පදනම මත ගෙන ඇති අතර එය මෙම අයිතමය යටතේ අය වැයට ඇතුලත් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇත්තේ කළමණාකරුවන්ට වාහන වෙනුවෙන් ගෙවන දීමනා ලෙසටය. මෙය වර්ගීකරණ වැරැද්දක් වේ.

5. Overseas Travelling Expenses - Others : විදේශ පුහුණුවීම් වලට අදාලව මෙම වියදම් සඳහා වැඩි ප්‍රතිපාදනයක් සිදු කර ඇත.

6. Board Meeting Expenses : වර්ෂ අවසානයේ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම ආයතනයෙන් පිටත ස්ථානයක පවත්වන නමුදු මෙම වසරේ එම ප්‍රතිපාදනය භාවිතා කර නැත.

7. Licence Fees : 2015 වර්ෂයේ නව වාහන මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන සිදු කලද, 2015 වර්ෂයේ නව මිලදී ගැනීම් වලක්වමින් චක්‍රලේඛයක් නිකුත් කර තිබුණි.

8. Building Maintenance : 2015 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ රසායනාගාර අංශයේ පරිපාලන අංශයේ අළුත්වැඩියා සඳහා අතිරේක ප්‍රතිපාදන සිදු කර ඇත.

9. Computer : පසුගිය වසර වල වියදම් සලකා බලා ප්‍රතිපාදන සිදු කර ඇත.
   2013 සත්‍ය වියදම - 2,686
   2014 සත්‍ය වියදම - 3,978

10. Lease Rent : අවිස්සාවේල්ල ඔසුසලට අදාලව පෙර වර්ෂයේ හිඟ මුදල් 2015 වර්ෂයට භර කිරීම නිසා අයවැයගත වියදම ඉක්මවා ඇත.

11. Rates & Taxes : අගරු වූ චෙක්පතත් ඉවත් කිරීම වැරදි ලෙස සටහන් වීම හා පෙර වර්ෂයක වියදමක් ඇතුලත්වීමෙන් අයවැයගත වියදම ඉක්මවා ඇත.

12. Water : 2015 පසුගිය මාසවල සත්‍ය වියදමට උද්ධමනය ගැලපීමෙන් පසු අයවැයගත කර ඇත.

| | | |
|---|---|---|
| 2013 සත්‍ය වියදම | - | 2,056 |
| 2014 සත්‍ය වියදම | - | 2,399 |

13. Storage : රජමල්වත්ත ගබඩාව හා බහලුම් සඳහා වාර්ෂිකව වෙන් කිරීම් කර තිබුණද, ඒවා ඉවත් කිරීමට පියවර ගෙන තිබුණි.

14. Sales Promotion : පිරිවැටුමෙන් 1 ක මුදලක් අලෙවි අංශයෙන් ලබා දෙන විස්තරාත්මක ප්‍රවර්ධන අයවැය මත වෙන් කිරීම් කර ඇත.

15. Trade Subscriptions & Periodicals : සාමාජික ගාස්තු ඉහල යාම සහ සත්‍ය වියදම් සලකා අයවැයගත කර ඇත.

16. Professional Charges : 2013 වර්ෂය පාදක කර ගෙන සහ නව ඔසු සල පිහිටුවීමේදී ඇති වන නීති ගාස්තු සලකා බලා අයවැයගත කර ඇත. 2013 වර්ෂයේ සත්‍ය වියදම 5,713

17. VAT : 2013 වර්ෂයේ වටිනාකම වූ රු.43,036 පදනම් කරගෙන අදාල වෙන් කිරීම සිදුකර ඇත.

18. Outdated & Damages : හානිවීම් සඳහා පිරිවැටුමෙන් 1% ක ප්‍රතිපාදනත් කල්ඉකුත්වීම් සඳහා 2013 වර්ෂයේ විකිණිය නොහැකි තොග අගය මත ප්‍රතිපාදන සිදු කර ඇත.

19. Sundry Packing Materials : අයවැයගත වියදම් ලේඛණයේ Sundry Packing Material යටතේ ORS හි රු 11,289 අඩංගු වී ඇති අතර මූල්‍ය ප්‍රකාශන වල එම වියදම වෙනම දක්වා ඇත.

20. Setting up Expenses : ඔසුසලවල් පිහිටුවීමේ මූලික වියදම් සඳහා වර්ෂය තුල පිහිටුවීමට බලාපොරොත්තු වන ඔසුසල සංඛ්‍යාව මත දළ වෙන් කිරීමක් ලෙස දක්වා ඇත.

## 5.3 පාරිසරික හා සමාජීය වගකීම් ඉටුකිරීම

(අ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රධානතම ඖෂධ ආනයනකරුවා වශයෙන් විශාල අයිතම ප්‍රමාණයක් සංස්ථාව විසින් ආනයනය කරනු ලබයි. එක් අයිතමයක කාණ්ඩ ගණනාවක් ද වේ. මේ සියල්ල වෙන් වෙන් ව පරීක්ෂාවට ලක් කිරීම පවත්නා පහසුකම් යටතේ ප්‍රායෝගිකව අපහසු කාරණාවකි. මේ හේතුව නිසා අහඹු ලෙස ලබාගන්නා සාම්පල පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබයි. ශ්‍රී ලංකාවට ඖෂධ ආනයන කරන පාර්ශවයන් අතරින් මේ මට්ටමින් හෝ ඒවා පරීක්ෂාවට ලක්කරන එකම ආනයනකරු අප සංස්ථාවයි. කෙසේ වුවද විගණනයෙන් පෙන්වා දි ඇති පරිදි හැකිතාක් සාම්පල පරීක්ෂාවට ලක්කිරීම වඩා සුදුසුය යන කාරණාව සමඟ අප ද එකඟ වන අතර ඉදිරියේදි ඒ සඳහා ඇති පහසුකම් පුළුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මේ කරුණ සම්බන්ධව ඉතාමත් පැහැදිලිව කිවයුත්තේ කිසිම විටක තත්ත්වයෙන් අසමත්වූ ඖෂධ කිසිම වෛද්‍ය සායනයකටවත් රජයේ රෝහලකට වත් යොමු නොකරන ලද බවය. අප සංස්ථාවේ තාක්ෂණ හා රසායානාගාර අංශය විසින් කිසියම් ඖෂධයක තත්ත්වය අසතුටුදායක බව එම පරීක්ෂණාගාරයේ තිරණ ලැබීමෙන් අනතුරුව හෝ ජාතික තත්ත්ව පරීක්ෂාගාර වාර්තා අනුව අසමත් වුවහොත් අප සංස්ථාවේ තාක්ෂණ අංශය මඟින් අනිවාර්යයෙන්ම එම ඖෂධය නිකුත් කිරීම වලක්වනු ලබයි. එවිට එම ඖෂධ රෝගීන් වෙත යෑම වැලැක්වේ.

එසේම වෛද්‍ය සායන සඳහා යම් අවස්ථාවක කල්ඉකුත්වීමේ දිනය ආසන්නව සපයා ඇත්නම් නම් එය සපයනු ලැබුවේ එම සායනයේ රෝගීන්ට වලංගු ජීව කාලය තුළදි සති 02 ක් හෝ 03 ක් පාවිච්චි කිරීමට හැකිවන පරිදි බව පැවසිය යුතුය.

ඒ අනුව කිසිම අවස්ථාවක තත්ත්වයෙන් අසමත්වූ හෝ කල්ඉකුත්වීමට ආසන්න ඖෂධ රෝගීන්ට ලැබෙන අන්දමට කිසිසේත්ම කටයුතු නොකරන ලද බව අවධාරණයෙන් පැවසිය යුතුය. මේ හැම කාර්යක්ම සම්පූර්ණයෙන්ම ඖෂධවේදීන් සම්බන්ධ වී කල බවද පැවසිය යුතුය.

## 6. පද්ධති හා පාලනයන්

පද්ධති හා පාලනයන් යටතේ විගණනය විසින් පෙන්වා දි ඇති කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉදිරියේදි කටයුතු කරන බව දන්වා සිටිමි.



සභාපති,
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව.

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## මානව සම්පත් විශ්ලේෂණය

### සේවක වර්ගීකරණය




### සේවකයෙකුට බදු පෙර ලාභය

රු. "000"




### සේවක කාල පරිච්ඡේදය




### සේවකයෙකුට විකුණුම්

රු. "000"




### සේවක වයස් විග්‍රහය




### සේවකයෙකුට වත්කම්

රු. "000"



## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු - ආදායම් වාර්තාව

රු. "000"

### පිරිවැටුම

| විස්තරය | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැටුම - රා.ඖ.ස | 5,286,876 | 4,865,151 | 4,320,300 | 4,283,232 | 4,806,170 | 4,197,759 | 4,015,962 | 3,547,367 | 3,092,189 | 2,923,148 |
| පිරිවැටුම - රා.බෙ.ග | 19,176,807 | 17,269,008 | 16,815,666 | 16,608,492 | 12,569,290 | 10,968,571 | 9,990,429 | 9,306,330 | 8,815,971 | 5,616,899 |
| **මුළු පිරිවැටුම** | **24,463,683** | **22,134,159** | **21,135,966** | **20,891,724** | **17,375,460** | **15,166,330** | **14,006,391** | **12,853,697** | **11,908,160** | **8,540,047** |
| දළ වෙළඳ ලාභය - රා.ඖ.ස | 1,410,722 | 1,247,074 | 1,136,403 | 991,541 | 1,043,453 | 995,371 | 894,232 | 822,024 | 699,794 | 682,256 |
| දළ අතිරික්තය - රා.බෙ.ග | 1,386,731 | 1,333,198 | 1,185,004 | 1,193,214 | 780,735 | 688,145 | 622,071 | 576,308 | 578,091 | 389,533 |
| **අතිරික්තය** | **2,797,453** | **2,580,272** | **2,321,407** | **2,184,755** | **1,824,188** | **1,683,516** | **1,516,303** | **1,398,332** | **1,277,885** | **1,071,789** |




| **පොදුකාර්ය පිරිවැය** | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෙනත් ආදායම් | 51,259 | 25,738 | 17,537 | 15,105 | 23,231 | 20,414 | 18,107 | 22,638 | 14,177 | 10,025 |
| පොදුකාර්ය පිරිවැය | (1,057,970) | (969,744) | (786,904) | (670,635) | (614,019) | (605,475) | (573,322) | (535,428) | (483,452) | (434,075) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (563,357) | (749,825) | (791,794) | (745,230) | (492,631) | (285,777) | (203,520) | (218,987) | (111,390) | (135,035) |
| **මෙහෙයුම් ලාභය** | **1,227,385** | **886,441** | **760,246** | **783,995** | **740,769** | **812,678** | **757,568** | **666,555** | **697,220** | **512,704** |
| මූල්‍ය පිරිවැය | (1,599) | (124) | (227) | (17) | (3,661) | (17,734) | (8,841) | (7,982) | (7,480) | (6,397) |
| බැංකු අයිරා මත පොළී | (734) | (149,659) | (1,384) | (290,877) | (419,235) | (315,070) | (350,841) | (212,285) | (273,273) | (121,876) |
| **මුළු පොදුකාර්ය පිරිවැය** | **(1,623,660)** | **(1,869,352)** | **(1,580,309)** | **(1,706,759)** | **(1,529,546)** | **(1,224,056)** | **(1,136,524)** | **(974,682)** | **(875,595)** | **(618,745)** |
| මූල්‍ය ආදායම් | 5,086 | 4,896 | 4,357 | 3,959 | 4,102 | 3,900 | 3,302 | 2,856 | 2,127 | 1,432 |
| **බදු පෙර ලාභය** | **1,230,137** | **741,554** | **762,992** | **497,060** | **321,975** | **483,774** | **401,188** | **449,144** | **418,594** | **385,863** |
| ආදයම් බදු | 610,539 | 192,145 | 320,008 | 205,282 | 228,473 | 243,907 | 144,883 | 209,487 | 232,013 | 206,452 |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | **619,598** | **549,409** | **442,984** | **291,778** | **93,502** | **239,867** | **256,305** | **239,657** | **186,581** | **179,411** |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | 239,887 | (212,044) | (31,574) | (14,281) | 11,325 | | | | | |
| **එකතු විස්තීරණ ආදායම** | **859,485** | **337,365** | **411,410** | **277,497** | **104,827** | **239,867** | **256,305** | **239,657** | **186,581** | **179,411** |




### මූලික අනුපාත

| | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දළ ලාභ අනුපාතය - රා.ඖ.ස (%) | 26.7 | 25.6 | 26.3 | 23.1 | 21.7 | 23.7 | 22.3 | 23.2 | 22.6 | 23.3 |
| දළ ලාභ අනුපාතය - රා.බෙ.ග (%) | 7.2 | 7.7 | 7.05 | 7.2 | 6.2 | 6.3 | 6.2 | 6.2 | 6.6 | 6.9 |
| දළ අතිරික්තයට විකුණුම් (%) | 11.4 | 11.7 | 11.0 | 10.5 | 10.5 | 11.1 | 10.8 | 10.9 | 10.7 | 12.6 |
| වාර්ෂික විකුණුම් වර්ධනය (%) | 10.54 | 4.72 | 1.2 | 20.2 | 14.57 | 8.28 | 8.97 | 7.94 | 39.44 | 6.40 |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

රු. "000"

| විස්තරය | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දායක ප්‍රාග්ධනය හා සංචිත** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **3,502,607** | **3,412,780** | **2,418,452** | **2,217,690** | **1,960,458** | **1,744,855** |
| **ජංගම වත්කම්** | | | | | | | | | | |
| තොගය - රා.ඖ.ස | 2,364,091 | 1,390,608 | 1,703,222 | 1,231,857 | 987,733 | 979,315 | 777,682 | 1,004,208 | 750,174 | 660,582 |
| මාර්ගස්ථ තොගය - රා.බෙ.ග | 788,342 | 528,710 | 809,462 | 734,963 | 1,985,991 | 2,755,465 | 1,105,247 | 1,780,891 | 710,240 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | 3,051,445 | 2,370,323 | 8,881,602 | 11,113,022 | 5,123,702 | 3,453,354 | 2,139,755 | 2,036,168 | 1,991,061 | 2,764,958 |
| තැන්පතු හා පෙර ගෙවීම් | 33,046 | 37,964 | 32,948 | 24,073 | 24,479 | 22,369 | 11,564 | 12,367 | 6,928 | 7,512 |
| අතැති මුදල් හා බැංකු මුදල් | 790,525 | 801,717 | 1,200,667 | 216,359 | 600,807 | 671,104 | 263,769 | 250,660 | 480,787 | 192,511 |
| **මුළු ජංගම වත්කම්** | **7,027,449** | **5,129,322** | **12,627,901** | **13,320,274** | **8,722,712** | **7,881,607** | **4,298,017** | **5,084,294** | **3,939,190** | **3,625,563** |
| **ජංගම වගකීම්** | | | | | | | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 3,347,411 | 2,250,497 | 3,649,362 | 3,032,684 | 1,784,156 | 1,551,401 | 739,514 | 544,979 | 645,448 | 667,851 |
| ගෙවිය යුතු ආදායම් බදු | 397,758 | 177,769 | 290,045 | 191,440 | 219,332 | 232,469 | 200,169 | 225,239 | 252,090 | 211,415 |
| විලම්බිත ආදායම් | 1,005 | 748 | 889 | 1,292 | 318 | 1,559 | | | | |
| ජංගම මූල්‍ය වගකීම් | 56,689 | 78,739 | 6,254,353 | 7,896,709 | 4,716,655 | 4,131,544 | 1,458,538 | 2,596,234 | 1,588,509 | 1,476,648 |
| **මුළු ජංගම වගකීම්** | **3,802,863** | **2,507,753** | **10,194,649** | **11,122,125** | **6,720,461** | **5,916,973** | **2,398,221** | **3,366,452** | **2,486,047** | **2,355,914** |
| ජංගම නොවන වත්කම් | 2,156,614 | 2,138,973 | 1,858,832 | 1,698,279 | 1,605,438 | 1,561,496 | 639,231 | 595,014 | 593,907 | 554,604 |
| ජංගම නොවන වගකීම් | 233,393 | 372,219 | 158,803 | 124,558 | 105,082 | 113,350 | 120,575 | 95,166 | 86,592 | 79,398 |
| **ශුද්ධ වත්කම්** | **5,147,807** | **4,395,646** | **4,133,281** | **3,771,870** | **3,502,607** | **3,412,780** | **2,418,452** | **2,217,690** | **1,960,458** | **1,744,855** |




## මූලික අනුපාත

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වත්කම් පිරිවැටුම් අනුපාතය (වාර) | 1:2.66 | 1:3.04 | 1:1.45 | 1:1.4 | 1:1.7 | 1:1.6 | 1:2.8 | 1:2.2 | 1:2.6 | 1:2.0 |
| ජංගම අනුපාතය (වාර) | 1:1.85 | 1:2.05 | 1:1.23 | 1.19:1 | 1.31:1 | 1.33:1 | 1.79:1 | 1.51:1 | 1.58:1 | 1.54:1 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර) | 1:1.23 | 1:1.5 | 1:1.07 | 1.02:1 | 0.86:1 | 0.7:1 | 1:1 | 0.68:1 | 0.99:1 | 1.26:1 |
| පොලී ආවරණය (වාර) | 1677 | 5.95 | 552.3 | 2.7 | 1.8 | 2.4 | 2.1 | 3.0 | 2.5 | 4.0 |
| තොගපිරිවැටුම් අනුපාතය (වාර) රා.ඖ.ස | 2.68 | 2.85 | 2.63 | 4.00 | 3.83 | 2.4 | 3.5 | 3.11 | 3.39 | 3.92 |

# විකුණුම් ජාලය

ප්‍රධාන කාර්යාලය
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01. ශ්‍රී ලංකාව.
දුරකථන : 011-2320356-9 ෆැක්ස් : 011-2447118 වෙබ් අඩවිය : www.spc.lk විද්‍යුත් තැපැල් : spc@spc.lk

**විකුණුම් අංශය**
109 කඳවල වත්ත
රත්මලාන.
දු.ක. 011-2632288
ෆැක්ස්: 011-2632962

**ගබඩාව**
109 කඳවල වත්ත
රත්මලාන.
දු.ක. 011-2634318
ෆැක්ස්: 011-2636715

**පිවනි අංශය**
109 කඳවල වත්ත
රත්මලාන.
දු.ක. 011-2634318

**මහනුවර ගබඩාව**
10/B/1, හේවාහැට පාර,
තැන්නේකුඹුර, මහනුවර.
දු.ක. 081-2240274

## රාජ්‍ය ඔසුසල්

**ඔසුසල අම්පාර**
පන්සල් හන්දිය,
ඩී.එස්. සේනානායක මාවත,
අම්පාර දු.ක. 063-2223088

**ඔසුසල අනුරාධපුර**
බැංකු විදිය
අනුරාධපුර
දු.ක. 025-2222181

**ඔසුසල අවිස්සාවේල්ල**
G 33/34/35,
මධ්‍යම වෙළඳපල,
අවිස්සාවේල්ල
දු.ක. 036-2222501

**නව ඔසුසල බදුල්ල**
සතොස ගොඩනැගිල්ල
බණ්ඩාරවෙල පාර,
බදුල්ල
දු.ක. 055 2229837

**ඔසුසල බණ්ඩාරගම**
රෝහල පරිශ්‍රය,
හොරණ පාර, බණ්ඩාරගම.
දු.ක. 038-2288671

**ඔසුසල බොරැල්ල**
ළමා රෝහල පරිශ්‍රය,
බොරැල්ල.
දු.ක. 011-2697660

**ඔසුසල කොළඹ 01**
75 ශ්‍රීමත් බාරොන් ජයතිලක
මාවත,
කොළඹ 01.
දු.ක. 011-2328046

**ඔසුසල කොළඹ 04**
85 ගාලු පාර,
කොළඹ 04.
දු.ක. 011-2587128

**ඔසුසල කොළඹ 07**
255, ධර්මපාල මාවත,
කොළඹ 7.
දු.ක.011-2694716,
011-2672293

**ඔසුසල දියතලාව**
කෙලින් විදිය,
දියතලාව.
දු.ක. 055- 3551624

**ඔසුසල ඇඹිලිපිටිය**
102, පල්ලේගම,
ඇඹිලිපිටිය
දු.ක. 047-2261177

**ඔසුසල කොටුව**
කොටුව දුම්රියපල,
කොටුව.
දු.ක. 011-2336926

**ඔසුසල ගාල්ල**
61ඒ, වක්වැල්ල පාර
ගාල්ල.
දු.ක. 091-2234726

**ඔසුසල හම්බන්තොට**
නො 3 බැරැක්ක විදිය,
හම්බන්තොට.
දු.ක. 047-2222163

**ඔසුසල ජයවර්ධනපුර**
ශ්‍රී ජයවර්ධනපුර රෝහල,
ශ්‍රී ජයවර්ධනපුර
දු.ක. 011-2779414

**ඔසුසල යාපනය**
149A, කේ.කේ.එස්.පාර,
යාපනය
දු.ක. 021- 2219262

**ඔසුසල මහනුවර**
14ඒ, ළමාගාර මාවත,
මහනුවර
දු.ක.081-2225175

**ඔසුසල කරාපිටිය**
132, පිළිකා රෝහල පාර,
මාඉටිපේ, පළමු විදිය,
කරාපිටිය
දු.ක. 091-2226947

**ඔසුසල කුරුණෑගල**
28, වීරතුංග ගොඩනැගිල්ල,
බෞද්ධාලෝක මාවත,
කුරුණෑගල
දු.ක. 037-2230840

**ඔසුසල මහරගම**
71/9 අල්විස් ගොඩනැගිල්ල
පරණ පාර, මහරගම.
දු.ක. 011-2745640

**ඔසුසල මාතර**
23බී, වාරිකාරාමය
අනගාරික ධර්මපාල මාවත,
මාතර දු.ක. 041-2231871

**ඔසුසල මිනුවන්ගොඩ**
24. පරණ නගරසභා
ගොඩනැගිල්ල
කොළඹ පාර,
මිනුවන්ගොඩ. දු.ක. 011-2295120

**ඔසුසල මීගමුව**
නො. 134, කොළඹ පාර,
මීගමුව
දු.ක. 031- 2228599

**ඔසුසල නුගේගොඩ**
145A/1,එස්.ද.එස්. ජයසිංහ මාවත
නුගේගොඩ
දු.ක. 011-2856641

**ඔසුසල පානදුර**
159, MPCS ගොඩනැගිල්ල,
ගාලුපාර, පානදුර.
දු.ක. 038-2234767

**ඔසුසල පිළියන්දල**
ලංකා ස.තො.ස.
අංක. 01, හොරණ පාර,
මිරිස්වත්ත, පිළියන්දල.
දු.ක. 011-3045511

**ඔසුසල පොළොන්නරුව**
රෝහල හන්දිය,
කදුරුවෙළ පාර,
පොළොන්නරුව
දු.ක.027-2225465

**ඔසුසල රාගම**
අංක 61ඒ, මහබාගෙ පාර,
රාගම.
දු.ක. 011- 2955219

**ඔසුසල රත්මලාන**
මෙගා ස.තො.ස.
ගොළුමඩම හංදිය, ගාලුපාර,
රත්මලාන.
දු.ක. 011-3043789

**ඔසුසල රත්නපුර**
32 නන්ද එල්ලාවල මාවත,
රත්නපුර
දු.ක. 045-2223014

**ඔසුසල තංගල්ල**
අංක 8, ඉදිපොකුණුගොඩ පාර,
තංගල්ල
දු.ක. 047-2241221

### අලෙවි හා විකුණුම් අංශය

නො 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01. දුරකථන : 011-2430778,011-2328507,011-2320356 - 9